ශ්‍රී ලංකාවේ, විශාලතම විශ්‍රාමික පාරිතෝෂික අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල, 2012 වර්ෂය අවසන් වනවිට ශුද්ධ වත්කම් රුපියල් බිලියන 1,144 ඉක්මවා ඇත. රටේ සමස්ත මූල්‍ය පද්ධතියේ වත්කම් වලින් සියයට 12.7 ක් පමණ සේවක අර්ථසාධක අරමුදල මගින් නියෝජනය වේ. අරමුදලෙහි වර්ධනය හා සුරක්ෂිතතාව තහවුරු කරමින් සිය සාමාජිකයන් වෙත වඩාත් ආකර්ෂණීය ප්‍රතිලාභයක් ලබාදීම තුළින්, අරමුදල විසින් වඩාත් ඵලදායී සේවාවක් අඛණ්ඩව ලබාදීමට කටයුතු කරනු ලැබීය.

අයහපත් වෙළෙඳපොළ තත්ත්වයන් තුළින් මතු වූ අභියෝග මධ්‍යයේ වුවද 2012 වසර තුළදී අරමුදල ඉහළ ආදායමක් වාර්තා කරමින් එහි මෙහෙයුම් කටයුතු ඉතා සාර්ථකව කරනු ලැබූ අතර, සිය සාමාජිකයන් වෙත සියයට 11.5 ක සාපේක්ෂ වශයෙන් ඉහළ පොලී අනුපාතයක් ප්‍රකාශයට පත්කරනු ලැබීය.



# සේවක අර්ථසාධක අරමුදල

## වාර්ෂික වාර්තාව - 2012

# පටුන


පිටුව

**1 කොටස**

දැක්ම හා මෙහෙවර 1
මුදල් මණ්ඩල සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාගේ පණිවිඩය 2
කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය 12
කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු 13
මෙහෙයුම් තොරතුරු 15
නියාමන රාමුව 16
මෙහෙයුම් සමාලෝචනය 21

**2 කොටස**

මූල්‍ය ප්‍රකාශන

ආදායම් හා වියදම් ප්‍රකාශය 35
විස්තීරණ ආදායම් ප්‍රකාශය 36
මූල්‍ය තත්ත්වය ප්‍රකාශය 37
ලැබීම් හා ගෙවීම් ගිණුම 38
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 39
ආයෝජන ප්‍රකාශය 40
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය/සාමාජිකයින්ගේ ධනය 41
ගිණුම්වලට අදාළ සටහන්: ගිණුම්කරණ ප්‍රතිපත්ති 42
ආදායම් හා වියදම් ප්‍රකාශනයට අදාළ සටහන්
1 - 5. ආයෝජන ආදායම් 49
6. වෙනත් ආදායම් 50
7. මුළු මෙහෙයුම් වියදම් 51
විස්තීරණ ආදායම් ප්‍රකාශයට අදාල සටහන්
8. විකිණීමට ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම 51

මූල්‍ය තත්ව ප්‍රකාශයට අදාළ සටහන්
9. දේපොළ පිරියත හා උපකරණ 52
10. මූල්‍ය වත්කම් 53
11. වෙනත් ජංගම වත්කම්/ලැබිය යුතු ශේෂයන් 53
12. මුදල් හා මුදල් සමාන වත්කම් 54
13. ණය හිමියන් 54
14. වෙනත් ජංගම වගකීම් 55
15. සාමාජික ශේෂ 55
16. සංචිත 56

ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාළ සටහන්
17. ලැබීම් 57
18. ගෙවීම් 58
ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්
19. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් 59

20. විකිණීම සඳහා ඇති වත්කම් 60
21. කල් පිරීම තෙක් තබා ගෙන ඇති ආයෝජන 62
22. ණය හා ලැබිය යුතු මුදල් 65
23. ආයෝජනයන්හි වෙනස්වීම් 66
24. ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය 68
25. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ මූල්‍ය තත්ත්වයෙහි සැසඳුම් ප්‍රකාශය 70

**විගණකාධිපති වාර්තා** **71**

**3 කොටස**

**සංඛ්‍යා සටහන්**

1. ආයෝජන කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභය (1981-2012) 260
2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1981-2012) 261
3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1981-2012) 262
4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශය (1981-2012) 263
5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1981-2012) 264
6. සංක්ෂිප්ත, ආදායම් ප්‍රකාශය (1991-2012) 265

## අපගේ දැක්ම

සමෘද්ධිමත් විශ්‍රාම දිවියක් සාමාජිකයන් වෙත ලබාදීමට හැකිවන අයුරින් කලාපයේ වඩාත් විශ්වාසදායී විශ්‍රාම අරමුදල බවට පත්වීම

## අපගේ මෙහෙවර

නව්‍ය හා විචක්ෂණශීලී කළමනාකරණය තුළින් ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා කාර්යක්ෂම සේවාවක් සාමාජිකයන් වෙත ලබාදීම

# මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය



**සේවක අර්ථසාධක අරමුදලේ මාගේ හිතවත් සාමාජිකයන් වෙත,**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, 2012 වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව මා ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි.

**අරමුදලට තම සාමාජිකයන්, සේවායෝජකයන් හා අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් වෙත වූ වගකීම් සියල්ල ඉටු කිරීමට හැකි වූ අතර, සාමාජිකයින්ගේ දිගුකාලීන අරමුදල් රැස්කරමින් සහ අරමුදල් වෘත්තීමය හා විචක්ෂණශීලී ආකාරයෙන් කළමනාකරණය කිරීම තුළින් රටේ ආර්ථිකයට දායක වීමට ද හැකි වූ බව ප්‍රකාශ කරන්නේ ඉමහත් සතුටිනි.** එමෙන්ම ශ්‍රී ලංකාවේ මිලියන ගණනකගේ විශ්‍රාම ජීවිත ආරක්ෂාකාරී වීමට උපකාරී වන පරිදි විශාල මෙහෙයක් ද සේ.අ.අ. ට කිරීමට හැකි වී තිබේ.

## 2012 වසරේ කාර්ය සාධනය සහ මුහුණ පෑ අභියෝගයන්

**සේ.අ.අ. රු.ට්‍රිලියන 1.1 ඉක්ම වූ වත්කම් වලින් සමන්විත ශ්‍රී ලංකාවේ විශාලතම අරමුදල වන අතර, එය සමස්ත මූල්‍ය ක්ෂේත්‍රයේ වත්කම්වල වටිනාකමින් සියයට 12.7 ක තරම් ඉහළ ප්‍රමාණයකට දායකත්වය සපයයි.**

**2012 වසරේ දී සේ.අ.අ. සියයට 12.4 ක ප්‍රශංසනීය වර්ධනය පෙන් වූ අතර, ඒ සඳහා මූලික වශයෙන්** සාමාජිකයන්ගේ සහ සේවායෝජකයන්ගේ දායක මුදල්වල වර්ධනයත්, අරමුදල ඵලදායී කළමනාකරණය තුළින් උත්පාදනය වූ ආදායමත් දායක විය.

2012 වසර අවසාන වන විට, මුළු ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 2.3 ක් වූ අතර, මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 14.6 ක් විය.

වසර තුළ දී අරමුදල විසින් තම සාමාන්‍ය ආයෝජන කළඹ මත සියයට 11.61 ක ප්‍රතිලාභයක් උපයන ලද අතර, එයින් වර්ෂ අවසානයේ පැවැති සාමාජික ශේෂය මත සියයට 11.5 ක පොලී අනුපාතයක් ලබා දීමට හැකි විය. මෙය බැංකු විසින් ගෙවනු ලැබූ සාමාන්‍ය දිගුකාලීන තැන්පතු පොලී අනුපාතයට වඩා ඉහළ අනුපාතයක් විය.

**2009 සිට 2013 දක්වා වසර පහක කාලයක් තුළ, අනෙකුත් මීට සමාන වත්කම් ඇති ආයතනවල ඉපැයීම් ඉක්මවා සේ.අ.අ. රුපියල් බිලියන 558 ක් වැනි විශාල ලාභයක් උපයන ලදී.** 2009 වසරේ රුපියල් බිලියන 101.7 ක් ද, 2010 වසරේ රුපියල් බිලියන 111.5 ක් ද, 2011 වසරේ රුපියල් බිලියන 107.5 ක් ද, 2012 වසරේ රුපියල් බිලියන 111.8 ක් සහ 2013 වසරේ රුපියල් බිලියන 125.6 ක් ද සේ.අ.අ. විසින් උපයා ඇත. එම සියළු ලාභ එකී වර්ෂ අවසානයේ දී සියළුම සාමාජික ගිණුම් වලට නිසි අයුරින් බැර කරන ලදී.

**සේවක අර්ථසාධක අරමුදල වැනි විශාල පරිමාණයකින් යුත් අරමුදලක් පවත්වාගෙන යාමේ දී, එහි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය තීරණය වීමේ වැදගත්ම සාධකය වන්නේ විචක්ෂණශීලී හා ඵලදායී අවදානම් කළමනාකරණයයි.** 1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනවලට අනුව සේ.අ.අ. අරමුදලේ භාරකරු වශයෙන් කටයුතු කරන මුදල් මණ්ඩලය අරමුදලේ කළමණාකරන කටයුතු සිදු කිරීමේ දී මුහුණ

පැමට සිදුවන අවදානම්, දූරදර්ශීව හා ප්‍රවේසම් සහිතව මුහුණ දීමට හා අවම කර ගැනීමට හැකි වන අයුරින් නව අවදානම් කළමනාකරණ පරිචයන් යොදා ගැනීමට අවශ්‍ය පියවර පසුගිය කාලය පුරා ගනු ලැබ ඇත. මෙය සාක්ෂාත් කර ගැනිම පිණිස අරමුදල තුළ යෝග්‍ය පද්ධති, ක්‍රියාවලීන් හා ව්‍යුහයන් ස්ථාපනය කර ඇත. ඒ මගින්, අවදානම් උපලබ්ධි වීමේ හැකියාව හා අරමුදලේ කටයුතුවලට සහ ස්ථායිතාවයට ඇති විය හැකි බාධා අවම මට්ටමක තබා ගැනීමට හැකි වී ඇත.

**මෙම අවදානම් කළමනාකරණ පද්ධතිය අවට පරිසරයේ ඇති වන සහ ඇතිවේ යැයි අපේක්ෂිත වෙනස්වීම්වලට අනුකූලව, කලින් කලට යාවත්කාලීන කිරීම තුළින්, එය ගතික ආකාරයෙන් පවත්වා ගෙන යනු ලැබේ.** එමෙන්ම, ශක්තිමත් අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් මගින්ද මෙම අරමුදලේ මෙහෙයුම් කටයුතු සහ අවදානම් කළමනාකරණය පිළිබඳව තවදුරටත් තහවුරුවක් ලබා දී ඇත.

කෙසේ වෙතත්, අරමුදලේ අඛණ්ඩ ප්‍රයත්නයන් තුළින් ළඟා කර ගන්නා ලද විශිෂ්ට ප්‍රතිඵලයන් මෙන්ම ඉහළ ගුණාත්මක බවින් යුත් ක්‍රමවේදයන් හා පරිචයන් ක්‍රියාත්මක කිරීම මධ්‍යයේ වුව ද සේ.අ. අරමුදලේ ක්‍රියාකාරකම් හා අරමුදල් කළමනාකරණ කටයුතු අපකීර්තියට පත් කිරීම සඳහා සමහර දේශපාලනික අරමුණු සහිත කණ්ඩායම් මෑත කාලයේ දී නිරන්තරව හොඳින් සැලසුම් කළ උත්සහයක් ගෙන යන ලදී. මෙම සැලසුම්සහගත උත්සාහයන් නිසා පසුගිය කාලයේ දී සේ.අ.අ. ට අභියෝග රැසකට මුහුණ පෑමට සිදු විය. මෙවැනි අභියෝගයන් හමුවේ අරමුදලේ කටයුතු වෘත්තීයමය වශයෙන් හා සුපරීක්ෂාකාරීව සිදු කරන බවට මහජනතාවට හා සේ.අ.අ. සාමාජිකයන්ට නිරන්තරයෙන් සහතික කිරීමට සේ.අ.අ. ට සිදු විය. ඇත්ත වශයෙන්ම, සමාගම් කොටස්වල ආයෝජන කිරීම සම්බන්ධයෙන් 2012 වසරේ දී මුදල් මණ්ඩලයට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම පෙත්සම ඉදිරියට ගෙන යාමට නොදී, නිෂ්ප්‍රභා කරන ලදී. කෙසේ වූවද මෙම අභියෝග හමුවේ මේවාට පිළිතුරු දීමට විවිධ ක්‍රියාමාර්ග ගැනීමට සිදු වූ අතර, මේ හේතුවෙන් අරමුදල් කළමනාකරණයේ නියැලෙන ඉහළ කළමනාකාරීත්වයට මෙවැනි අසාධාරණ චෝදනාවලට ප්‍රතිචාර දැක්වීමට විශාල කාලයක් වැය කිරීමට සිදු වූවා මෙන්ම එවැනි ප්‍රතිචාර සඳහා සැලකිය යුතු පිරිවැයක් ද දැරීමට අරමුදලට සිදු විය.

**මෙවැනි පසුබිමක් තුළ, අරමුදල් කළමනාකරණයේ ප්‍රධාන අංග පිළිබඳව විස්තීරණ වශයෙන් මෙම ප්‍රකාශනය තුළ සාකච්ඡා කිරීම යෝග්‍ය යැයි මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.** එය විමර්ශන හා විගණන අධිකාරීන් ඇතුළු සියළු පාර්ශ්වකරුවන්හට නූතන අරමුදල් කළමනාකරුවන් විසින් අනුගමනය කරණු ලබන මෙම ප්‍රතිපත්ති, පරිචයන්, මූලධර්ම හා මුහුණ දෙනු ලබන අභියෝග පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වනු ඇත.

සේ.අ.අරමුදලට නිරන්තරයෙන් එල්ල කරන චෝදනාවක් වූයේ එය විසින් කොටස් වෙළෙඳපොළ තුළ සිදු කරන ආයෝජන බොහෝමයක් අත්තනෝමතිකව කරන ඒවා බවයි. එවැනි මතවාද නිෂ්ප්‍රභා කිරීම සඳහා, විශ්‍රාම අරමුදල් කොටස් වෙළෙඳපොළ ආයෝජන කටයුතු කරන ආකාරය පිළිබඳව කෙටියෙන් දැක්වීම යෝග්‍ය වනු ඇත. කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීම ලොව පුරා හොඳින් පිළිගත් සහ හොඳින් මුල් බැසගත් ආයෝජන මාර්ගයක් වන අතර, කොටිකාලීන හෝ දිගුකාලීන හෝ එම කාල වකවානු දෙකම පිළිබඳ දැක්මක් සහිතව එවැනි ආයෝජන කරනු ලබන්නේ ලාභය හා වර්ධනය අරමුණු කර ගෙනය. මේ සම්බන්ධයෙන්, **සේ.අ. අරමුදල ද කොටස්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය නිසි පාලන පද්ධතියක් 2001 වසරේ සිට ස්ථාපනය කර පවත්වාගෙන යාමත්, වෙනස්වන ජාත්‍යන්තර සම්මුතින්වලට අනුකූලව ක්‍රමයෙන් ඒවා දියුණු කිරීමත් කර ඇත.** පහත ඡේදයෙන් මෙම පද්ධතිය කෙටියෙන් විස්තර කෙරේ.

සේ.අ.අ. විසින් නව කොටස් වෙළෙඳපොළ ආයෝජන සිදු කරන විට, ආයෝජන ක්ෂේත්‍රයට අදාළ අවශ්‍ය අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම් සහිත පුහුණු නිළධාරින් කණ්ඩායමක් වන සේ.අ.අරමුදලේ ආයෝජන කළමනාකරුවන් විසින් එවැනි යෝජිත ආයෝජනයන් පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණ හා අවශ්‍ය නිරීක්ෂණ කළ යුතු වේ. එම ආයෝජන යෝජනා, තවදුරටත් ස්වාධීනව ඇගයීමට හා

විශ්ලේෂණයට ලක් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් සැදුම්ලත් ආයෝජන කමිටුව නමින් හඳුන්වන කමිටුවකට ඉදිරිපත් කරනු ලැබේ. ඉන්පසු, ආයෝජන කමිටුව නව ආයෝජන පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම්, එම ආයෝජනය සිදු කළ හැකි බවට ආයෝජන කමිටුව විසින් මුදල් මණ්ඩලයට නිර්දේශ කරනු ලැබේ. එම නිර්දේශයන් සලකා බැලීමෙන් පසු අදාළ ආයෝජන සඳහා අවසාන තීරණය මුදල් මණ්ඩලය විසින් ගනු ලැබේ. ඊට අමතරව එදිනෙදා සාමාන්‍ය කටයුත්තක් වශයෙන් ඊළඟ මාසය සඳහා බලාපොරොත්තු වන ආයෝජන සැලැස්ම සඳහා සේ.අ.අරමුදලේ කළමනාකරණය විසින් මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ගනු ලැබේ. ඒ නිසා, සියළු නව ආයෝජනයන් සහ සාමාන්‍ය ආයෝජන කටයුතු කිරීම සඳහා ඉතා සුපරික්ෂාකාරී ක්‍රියා පිළිවෙලක් අනුගමනය කරන හෙයින්, සේ.අ. අරමුදල් කළමනාකරුවන් විසින් අත්තනෝමතික ආයෝජනයන් කිරීමට ඉඩක් නොමැති බව සේ.අ. අරමුදලේ සාමාජිකයන්ට මින් පසක් වනු ඇත.

**කොටස් වෙළෙඳපොළ සමහර ආයෝජනයන් නිසා සේ.අ.අරමුදලට අලාභ විඳීමට සිදු වූ බව දේශපාලන අරමුණු පෙරදැරි කරගත් සමහර පුද්ගලයින් විසින් එල්ල කරන තවත් චෝදනාවකි.** මේ සම්බන්ධව ද, ආයෝජන රාමුවෙහි පසුබිම සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. පොදුවේ පිළිගනු ලබන ආකාරයට ආයෝජන කළමනාකරණයේ මූලික පදනම වන්නේ ආයෝජන කළඹ බහුවිධ අවදානම් වලින් හොඳින් ආරක්ෂා වී ඇති බව තහවුරු කර ගැනීමයි. එම අවදානම් වන්නේ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතා, සංකේන්ද්‍රණ, මෙහෙයුම් (පද්ධති සහ පුද්ගලයන්), ලෝක වෙළෙඳපොළ තත්ත්වය, තාක්ෂණික වෙනස්වීම් යනාදිය ආශ්‍රිත අවදානම්ය. එම නිසා, විචක්ෂණශීලී සහ වෘත්තීමය සුදුසුකම් දරණ අරමුදල් කළමනාකරුවන් ඔවුන්ගේ කළමනාකරණය යටතේ ආයෝජනයන් කරන විට එම අවදානම් හඳුනාගැනීම, ඇගයීම් සහ කළමනාකරණය කිරීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරනු ලැබේ. ක්‍රමවේදයන්, වෘත්තීමය ස්වභාවය සහ අරමුදල් කළමනාකරුවන්ගේ අත්දැකීම් සහ පදනම් වන ආයෝජන උපාය මාර්ග, අවදානම් කළමනාකරණයේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. **ආයෝජනය කිරීමේ දී, මෙම අවදානම් මගින් ඇති වන අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා විචක්ෂණශීලී අරමුදල් කළමනාකරුවන් විසින් යොදාගනු ලබන ප්‍රධාන උපාය මාර්ග වලින් එකක් වන්නේ පොදුවේ පිළිගනු ලබන පරිචයන් හා සම්ප්‍රදායන් ආයෝජනය කිරීමේ දී අනුගමනය කිරීමයි.** අරමුදලේ ප්‍රමාණය, අවදානම් පිළිබඳ ඇගැයීම සහ දැරිය හැකි සමස්ත අවදානම පිළිබඳව අවධානය යොමු කරමින්, **ආයෝජන කළඹ සාධාරණ ආකාරයෙන් විවිධාංගීකරණය කළයුතු යැයි යන්න,** කළඹ ආයෝජනයේ තිබෙන ඉතා වැදගත් මෙන්ම සියළු දෑ අභිබවා යන මූලික මූලධර්මයකි.

එම නිසා නිසැක වශයෙන්ම, **අරමුදලෙහි කාර්ය සාධනය අගැයීම මුළු ආයෝජන කළඹෙහිම සමස්ත ඉපැයුම් අනුපාතිකය විග්‍රහ කිරීමෙන් කළ යුතු අතර සාර්ථක නොවූ තෝරාගත් තනි ආයෝජනයන් කිහිපයක කාර්ය සාධනය ඇගයීමෙන් පමණක් එය කළ නොහැක.** ආයෝජන කළඹක ඇති තනි තනි ආයෝජනවල වෙළෙඳපොළ වටිනාකම කලින් කලට අඩු වැඩි විය හැකි බව ඉතාමත් ප්‍රචලිත සංසිද්ධියකි. **කෙසේ වෙතත්, මෙහිදී වැදගත් වන්නේ වෙනස් වන වාතාවරණයන් තුළ වුවද සමස්තයක් ලෙස මධ්‍යම හා දීර්ඝ කාලීනව දී සාමාන්‍යයට වඩා වැඩි ඉපැයුම් අනුපාතිකයක් සාමාජිකයන්ට ගෙවිය හැකි පරිදි ආයෝජන කළඹ ගොඩනැගීමයි.** එබැවින් අදාළ ආයෝජන කළඹ වෙළෙඳපොළ මධ්‍යන්‍ය ඉපැයුම් අනුපාතික අගයට වඩා වැඩි ප්‍රතිලාභයක් ප්‍රදානය කරන්නේ නම්, එම ආයෝජන කළඹ හොඳින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹක් ලෙස සැලකිය හැක.


**එසේම, කාලීනව කොටස්වල වෙළෙඳපොළ මිලෙහි සිදුවන උච්චාවචනයන් නිසා, ඕනෑම කොටස් කළඹක විවිධ කාල වකවානුවලදී ''උපලබ්ධි නොවූ'' ලාභ අලාභ ඇති විය හැකි බව ද මතක තබා ගත යුතු වේ.** ඇත්ත වශයෙන්ම එය, ආයෝජන උපායමාර්ග සහ කොටස් වෙළෙඳපොළට ඇති අනාවරණය වීමේ ප්‍රමාණය අනුව, සියළුම ආයෝජකයින් විසින් මුහුණ දිය යුතු සහ පිළිගත යුතු, කොටස් වෙළෙඳපොළට ආවේණික වූ ලක්ෂණයකි. එහෙයින්, වෙළෙඳපොළ මිල පහළ ගිය අවස්ථාවක දී අතීතයේ දී මිලදී ගන්නා ලද කොටස් නැවත ඇගයීමකට ලක් කළේ නම් ගිණුම්වල තිබෙන ආයෝජනයේ වටිනාකම පහළ ගොස් තිබිය හැකි නමුත් එවැනි අලාභයක් සත්‍ය අලාභයක් නොව හුදු පොත් අලාභයක් පමණි. එය ඇත්ත වශයෙන්ම සත්‍ය අලාභයක් ලෙස ගැනිය හැක්කේ

එම කොටස්වල මිල ගත් මිලට වඩා පහත ගොස් තිබුණ අවස්ථාවක විකුණුවේ නම් පමණි. නමුත්, දෛනික මිලදී ගැනීම් හා විකිණීම් කිරීමේ අරමුණින් කෙටිකාලීන වෙළෙඳ කළඹෙහි එම කොටස් තබා ගන්නේ නම් මිස, එම කොටස් පහත වැටුණු මිල ගණන්වලට විකුණන්නේ නැති නම්, ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ඇතිවන වටිනාකමේ පහළ වැටීම, ''උපලබ්ධි නොවූවක්'' වන අතර, එය අරමුදලේ ලාභදායි තත්ත්වයට බලපෑමක් ඇති නොකරනු ඇත. එසේම අතීතයේ දී මිලදී ගන්නා ලද කොටස්, වෙළෙඳපොළ මිල ඉහළ ගිය අවස්ථාවක ඇගයීමට ලක් කළහොත් එම ආයෝජන සඳහා ලාභයක් පෙන්නුම් කරයි. නමුත් එය ද වෙළෙඳ කළඹ තුළ කෙටිකාලීන ආයෝජනයක් ලෙස තබා ගෙන නැතිනම්, ඇත්ත වශයෙන්ම එම කොටස් විකුණා ඉපැයීම් කරන තෙක් එය සැබෑ ලාභයක් නොවේ. එමනිසා එම කොටස් ඉහළ ගිය මිලට විකුණන තෙක් එය උපලබ්ධි නොවූ ලාභයක් වන අතර, අරමුදලෙහි ආයෝජනයේ ලාභදායී තත්ත්වයට එයින් බලපෑමක් ඇති කරනු නොලැබේ.

**විශ්‍රාමික අරමුදලක් නිසා සේ.අ.අ. විසින් කර ඇති කොටස් ආයෝජනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් දීර්ඝකාලීන අරමුණු කේන්ද්‍ර කර ගනිමින් කර ඇති ආයෝජන මිස කෙටිකාලීන දෘෂ්ඨි කෝණයකින් බලා කරනු ලැබූ ආයෝජන නොවේ. එම නිසා කෙටිකාලීන මිල අඩු වැඩි වීම් තුළින් පැන නගින ''උපලබ්ධි නොවූ'' ලාභ හෝ අලාභ, සේ.අ.අ. හි ලාභයට ශුද්ධ වශයෙන් බලපෑමක් ඇති කරනු නොලැබේ.** ''උපලබ්ධි නොවූ'' පාඩු පිළිබඳව අනවශ්‍ය ලෙස කලබලයට පත් නොවිය යුතු වීමට අදාළ තවත් හේතුවක් වන්නේ, තම කොටස් කළඹින් කොටසක් අලාභයකට විකිණීම සඳහා සේ.අ.අ. ට කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතාවයක් නොමැති වීමය. සේ.අ.අරමුදලේ දෛනික සාමාන්‍ය මුදල් පිටට ගලා යෑම්වලට වඩා දෛනික සාමාන්‍ය මුදල් ගලා ඒම් ඉතාමත් වැඩි බැවින් සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීමට හා දෛනික වගකීම් ඉටු කිරීමට සේ.අ.අ. සතුව ප්‍රමාණවත් අරමුදල් ඇත. එම නිසා, ආයෝජන කරනු ලබන්නේ දෛනික වගකීම් පියවීමෙන් පසු ඉතිරිවන අතිරික්ත අරමුදල් වලින් වන අතර, දෛනික මෙහෙයුම් සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා කිසිදු ආයෝජනයක් පාඩු පිට විකිණීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැත.

**උපලබ්ධි ලාභ හෝ පාඩු ප්‍රමාණයන් විශාල වශයෙන් කලින් කලට වෙනස් වන බව ද මෙහිදී සැලකිය යුතුය. උදාහරණයක් ලෙස 2010 දෙසැම්බර් 31 දිනට සේ.අ.අරමුදලේ ආයෝජන කළඹෙහි ශුද්ධ උපලබ්ධි නොවූ ලාභය ආසන්න වශයෙන් රුපියල් බිලියන 18 ක් විය.** නමුත්, එම අවස්ථාවේ දී, ''උපලබ්ධි නොවූ'' අලාභ ගැන අද අහිතකර විවේචන කරනු ලබන ඝෝෂාකාරී විවේචකයින් මෙන්ම විගණකයින් පවා, එවැනි විශාල "උපලබ්ධි නොවූ" ලාභ පිළිබඳව සඳහන් කිරීම යෝග්‍ය යැයි කල්පනා කළේ නැත. තවද, සේ.අ.අ.ට මෙවැනි විශාල උපලබ්ධි නොවූ ලාභ තිබුණ ද ඇත්ත වශයෙන්ම මෙම ආයෝජන විකුණා ලාභයක් ඉපැයීමට සේ.අ.අ. උත්සාහ කළේ නැත. මන්ද සේ.අ.අ. නිරන්තරයෙන්ම කරන්නාක්

| රූප සටහන 1 | 2011 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා සියලු කොටස් මිල දර්ශකයේ සහ උපලබ්ධි නොවූ ලාභ/අලාභයන්ගේ වෙනස්වීම් |
|---|---|




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

මෙන් ආයෝජනයන් දෙස බලන්නේ දිගුකාලීන දෘෂ්ටි කෝණයකින් නිසාය. ඇත්ත වශයෙන්, මෙම ආයෝජන විකිණීම සඳහා යෝග්‍ය කාලය පැමිණ තිබේ යැයි ආයෝජන කළමනාකරුවන් සෑහීමකට පත් වන්නේ නම් පමණක්, ලාභ ලැබීම සඳහා එවැනි ආයෝජන විකිණීම කෙරේ. **එහෙත් 2011 පෙබරවාරි සිට කොටස් වෙළෙඳපොළේ පහත වැටීමත් සමඟ, 2010 අවසාන වනවිට තිබූ රු. බිලියන 18 ක් පමණ වූ ''උපලබ්ධි නොවූ'' ලාභය, වසර තුළ දී ක්‍රමයෙන් සෘණ අගයක් දක්වා පරිවර්තනය වූ අතර, 2012 අවසාන වනවිට එය රු. බිලියන 9 ක ''උපලබ්ධි නොවූ'' අලාභයක් බවටත්, 2013 අවසාන වනවිට රු. බිලියන 8.3 ක ''උපලබ්ධි නොවූ'' අලාභයක් බවටත් පත්විය. නමුත් 2014 දී කොටස් වෙළෙඳපොළ කටයුතුවල පිබිදීමක් සමගම, 2014 අගෝස්තු වනවිට ශුද්ධ ''උපලබ්ධි නොවූ'' අලාභය, රු. බිලියන 5.2 ක ශුද්ධ ''උපලබ්ධිය'' ලාභයක් බවට පත් වී තිබුණි.** 2011 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා කාලය තුළ සේ.අ.අරමුදලේ ආයෝජන කළඹේ ''උපලබ්ධි නොවූ'' ලාභ අලාභ දැක්වෙන රූපසටහන 1 තුළින් මේ බව මනාව නිරූපනය වේ.

ඒ සමගම, වාර්තා කර ඇති ප්‍රතිඵලවලින් මනාව පෙන්නුම් කරන පරිදි, සේ.අ. අරමුදල තම කොටස් ආයෝජන කළඹ තුළින් 2011 දී රු. මිලියන 714 ක් හා 2012 දී රු. මිලියන 1,020 ක් ද වශයෙන් උපලබ්ධි ලාභ ලබා ඇත.

**පසුගිය වසර කිහිපය තිස්සේ සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන කළඹ තුළ ''උපලබ්ධි නොවූ'' අලාභ පැවති අතර, එය කුමන ආකාරයකට හෝ සාමාජිකයන්ට ගෙවූ ප්‍රතිලාභ කෙරේ බලපෑමක් සිදු කර නැති බවත් එසේම ''උපලබ්ධි නොවූ'' විශාල ප්‍රමාණයේ ලාභ පැවති අවස්ථාවල ද එයින් සාමාජිකයන්ට අතිරේක ප්‍රතිලාභයක් අත්වූයේ නැති බවත්, දැඩි ලෙස අවබෝධ කරගත යුතුය.** මේ නිසා සේවක අර්ථසාධක අරමුදලේ ලාභ හෝ අලාභ ගණනය කරන විට සත්‍ය වශයෙන්ම උපලබ්ධි වූ ලාභ හෝ උපලබ්ධි වූ අලාභ පමණක්ම සලකා බලන බව අවධාරණය කළ යුතු වේ.

අවුරුදු කිහිපයකට පෙර අත්පත්කරගත් ඉහළ පොලී අනුපාතයක් සහිත සැලකිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයකින් සමන්විත වූ රජයේ සුරැකුම් කළඹ, පරිණත වූ කළඹක් බව ද මෙහිදී සැලකිල්ලට ගත යුතුය. එහෙත් අඩු උද්ධමනය සහ අඩු පොලී අනුපාතික වාතාවරණය නිසා මෑත කාලයේ දී ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන සුරැකුම්පත්වල පොලී අනුපාතිකය සැලකිය යුතු අඩු මට්ටමක පවතී. **මේ නිසා ඉහළ පොලී අනුපාතිකයක් ගෙවීම අනාගත ශ්‍රී ලංකා මූල්‍ය පරිසරය තුළ තිබිය හැකි ප්‍රවණතාවයක් නොවන බව සියළුම පාර්ශවයන් විසින් සැලකිල්ලට ගත යුතු වේ. මෙවැනි වාතාවරණයක දී සේවක අර්ථසාධක අරමුදලට පරිණත කොටස් කළඹක් ගොඩනැගීමේ අතිරේක වගකීමකට ද මුහුණ පෑමට සිදු වේ. එයට හේතුව, ඉදිරි කාලයේ දී, සේ.අ. අරමුදලේ සාමාජිකයින්ට සාමාන්‍ය ප්‍රතිලාභයට වඩා ඉහළ ප්‍රතිලාභයක් ගෙවීම සඳහා වැඩි දායකත්වයක් දැරීමට බොහෝ දුරට සිදුවනු ඇත්තේ කොටස් කළඹටය.**

සේවක අර්ථසාධක අරමුදලේ විශාලත්වය සහ එහි ස්වභාවය සහිත අරමුදලක්, කොටස්වල ආයෝජනය කළ යුත්තේ කෙටිකාලීන ක්ෂණික ලාභ ලබා ගැනීමේ අරමුණින් නොව දිගුකාලීන දැක්මක් සහිතව බව සියළු පාර්ශවයන් විසින් සැලකිල්ලට ගත යුතු වේ. එහෙයින්, ආයෝජනය කළ වහාම හෝ නුදුරු අනාගත කාලය තුළදී ආකර්ෂණීය ප්‍රතිලාභ නොතිබිය හැකි අතර, ස්ථාවර ආදායම් රජයේ සුරැකුම් හෝ සාංගමික බැඳුම්කරවලට ලැබෙන ප්‍රතිලාභයට වඩා වැඩි ප්‍රතිලාභයක්, ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ තුළින්, විචක්ෂණශීලී ලෙස ආයෝජනය කරනු ලැබූ කොටස් ආයෝජනවලින් දිගුකාලයේ දී ලැබීම ස්වාභාවික ප්‍රතිඵලයකි.

ඵලදායී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් භාවිතා කිරීම තුළින් සේ.අ.අරමුදලට ආයෝජන පරිසරය තුළ ඇති ඉතා සංකීර්ණ අවදානම්වලට සාර්ථකව මුහුණ පෑමට හැකි වී ඇති අතර එමගින් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් ඉතා පහළ මට්ටමක තබා ගැනීමටද හැකි වී ඇති බවත් මෙහිදී විශේෂයෙන් පෙන්වා දිය යුතු ලක්ෂණයකි. ඒ අනුව, අර්ථසාධක අරමුදල මුහුණපාන ණය අවදානම ඉතාම පහළ මට්ටමක පවතින අතර, එයට හේතුව මුළු අරමුදලේ වැඩි ප්‍රමාණයක් ණය සහ ද්‍රවශීලතා වැනි අවදානම් වලින් තොර රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබීමයි. තවද

සේ.අ. අරමුදලට තම විශාල ස්ථාවර ආදායම්, රජයේ සුරැකුම් කළඹ ලාභදායී මිශ්‍රණයකින් යුතුව සහ කෙටිකාලීන මෙන්ම දිගුකාලීන සංයුතියකින් යුතුව, විචක්ෂණශීලී ලෙසින් හා වෘත්තීමය ආකාරයෙන් කළමනාකරණය කිරීමට හැකිවී තිබේ. එවැනි උපායමාර්ගයක් විශේෂයෙන් ප්‍රයෝජනවත් වී ඇති අතර, විවිධ අරමුණු සඳහා වෙන් වෙන් වූ කළඹ පවත්වා ගැනීමෙන්, සුරැකුම් මිල ගණන්වල හා

**වගුව 1 — මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රවාහය**

රු. මිලියන

| අයිතමය | 1990 | 2010 | 2012 |
|---|---|---|---|
| මුදල් ලැබීම් ප්‍රවාහය | | | |
| දායක මුදල් | 3,937 | 54,796 | 70,171 |
| පොලී ආදායම (මුදල් පදනම මත) | 4,188 | 87,371 | 83,929 |
| කල්පිරීම් (ප්‍රති විකුණුම් හැර) | 4,852 | 303,275 | 401,679 |
| ලාභාංශ හා අනෙකුත් ලැබීම් | - | 2,396 | 2,989 |
| **මුළු ලැබීම් ප්‍රවාහය** | **12,977** | **447,838** | **558,768** |
| මුදල් ගෙවීම් ප්‍රවාහය - | | | |
| ප්‍රතිලාභ ගෙවීම් | 1,209 | 34,896 | 48,712 |
| ප්‍රතිලාභ ආපසු ගෙවීම් මුළු මුදල් ලැබීම් ප්‍රවාහයේ ප්‍රතිශතයක් වශයෙන් (%) | 9.3 | 7.8 | 8.7 |
| ශුද්ධ මුදල් ලැබීම් ප්‍රවාහය | 11,768 | 412,942 | 510,056 |

පොලී අනුපාතිකවල සිදුවන වෙනස්වීම් වලින් පැන නැගෙන අවදානම් අවම කිරීම සඳහා අරමුදල් කළමනාකරුවන් විසින් අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. මෙම වෙන් වෙන් වශයෙන් පවත්වා ගනු ලබන කළඹ වන්නේ අවශ්‍ය කාලවලදී විකිණීම සඳහා තබා ගන්නා (ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ආයෝජන) කෙටිකාලීන ආයෝජනයන් සහ දිගුකාලීන ආයෝජයන්ය. (කල්පිරීම තෙක් තබා ගන්නා කළඹ) සාමාන්‍ය පොලී අනුපාතිකවල සහ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම්වල සිදුවන වෙනස්කම් නිසා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළේ මිල ගණන්වල සිදු විය හැකි සැලකිය යුතු වෙනස්කම් වලින් පැන නැගෙන ''වෙළෙඳපොළ මිලට ගැලපීමේ'' අවදානම සීමා කිරීමට මෙමගින් අරමුදලට හැකි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිලාභ ආපසු ගෙවීම් සහ / හෝ අනෙකුත් මෙහෙයුම් වියදම් ගෙවීම් වැනි එදිනෙදා වගකීම් පියවා ගැනීම සඳහා ආයෝජිත වත්කම් කල්පිරීමට පෙර විකුණා දැමීමට සිදුවිය හැකි අල්පමාත්‍රයක හෝ සම්භාවිතාවය, විචක්ෂණශීලීව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම තුළින් මගහරවා ගැනීමට සේ.අ.අරමුදලට හැකි වී ඇත. **සේ.අ. අරමුදලට ගලා එන අරමුදල් ප්‍රවාහය එයින් ගලා යන අරමුදල් ප්‍රවාහයට වඩා සැලකිය යුතු මට්ටමකින් වැඩි බව පෙන්වන ඉහත දැක්වෙන වගු අංක 1 න් මේ තත්ත්වය මනාව නිරූපණය වේ. මෙයින් සනාථ වන්නේ පුරෝකතනය කළහැකි ඉදිරි අනාගත කාලය තුළ දී ප්‍රතිලාභ ගෙවීම සඳහා කිසිදු ආකාරයක ද්‍රවශීලතා අවදානමක් නැති බවත්, සමහර පාර්ශ්වයන් විසින් කරනු ලැබූ චෝදනා සම්පූර්ණයෙන් පදනම් විරහිත බවත්ය.**

මේ පසුබිම යටතේ, වෙළෙඳපොළේ තිබෙන සම කාණ්ඩයේ ආයෝජන මගින් ගෙවනු ලබන ප්‍රතිලාභ පහසුවෙන් අභිබවා යන, සියයට 11 සිට සියයට 13.7 දක්වා වූ පරාසයක පවතින සාපේක්ෂ වශයෙන් ඉහළ ප්‍රතිලාභ තම සාමාජිකයන්ට ගෙවීමේ වගකීම ඉටු කිරීමට සේ.අ.අරමුදලට හැකි වී ඇති බව මින් මනාව පැහැදිලි වේ.

## අනාගත අපේක්ෂාවන් සහ අභියෝග

ඉහත දක්වා ඇති කරුණුවලින් පැහැදිලි වන්නේ ජයග්‍රහණ රැසක් අතීතයේ දී අත් කරගෙන ඇති බවත්, නෛතික හා ආර්ථික අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට සේ.අ.අ. ට හැකි වූ බවත්ය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ ඉතිරිකිරීමේ හැකියාව සෑහෙන වර්ධන වේගයක් අත්කර ගැනීමේ සංදර්භයක් තුළ, තවදුරටත් කළයුතුව ඇති කාර්යභාරය බොහෝය. 2015 වසර අගභාගයේ දී ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල

දළ දේශීය නිෂ්පාදිතය ඇ.එ.ජ. ඩොලර් 4000 ට වඩා ඉහළ යාමක් අපේක්ෂා කරන අතර, දළ දේශීය නිෂ්පාදිතය 2016 වසරේ ද ඇ.එ.ජ. ඩොලර් බිලියන 100 ට ළඟා වීමට අපේක්ෂිතය. තවද, 2020 වසරේ දී ද.දේ.නි. ඇ.එ.ජ. ඩොලර් බිලියන 150 දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත. මෙම ඉලක්ක වලින් පැහැදිලි වන්නේ, 2004 තරම් වූ මෑත භාගයේ ඇ.එ.ජ. ඩොලර් බිලියන 24 ක තරම් සාමාන්‍ය ආර්ථිකයක්ව තිබූ ශ්‍රී ලංකාව එතැන් සිට යෝධ පිම්මක් පැනීමට සූදානම් බවය. එමෙන්ම, අපේක්ෂිත අනෙකුත් සීඝ්‍ර වෙනස් වීම් සමඟ, මෙරට විශාලතම විශ්‍රාමික අරමුදල වන සේ.අ.අ. මුහුණ දීමට ඇති අවස්ථා හා අභියෝග ද දැඩි පරිවර්තනයකට ලක්වනු ඇති බවය. **ඒ අනුව, වසර 2020 පමණ වනවිට තිබිය හැකි වාතාවරණය කුමක් විය හැකි ද?**

පළමුව, ඉහළ ආදායම් මට්ටම් හා විධිමත් ආර්ථික අංශයන්හි වර්ධනයත් සමඟම, ඉදිරි වසර වලදී සේ.අ.අ. සාමාජික සංඛ්‍යාව ඉතා ඉහළ අගයකින් වර්ධනය වනු ඇත. ඒ අනුව, 2020 වසර වන විට මිලියන 3.5 ඉක්මවූ සක්‍රීය සාමාජික සංඛ්‍යාවක් සමඟ කටයුතු කිරීමට සේ.අ.අ. ට බොහෝ දුරට සිදුවනු ඇත. දෙවනුව, අරමුදල මගින් කළමනාකරණය කරනු ලබන වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2.5 දක්වා අති විශාල වශයෙන් ඉහළ යනු ඇත. තෙවනුව, නව වටිනාකම් පද්ධතියක් කරා සංක්‍රමණය වීම සීඝ්‍ර හා තියුණු වනු ඇත. එම නිසා එම ගමන යාම සඳහා වඩාත් සුපරික්ෂාකාරී ලෙස සූදානම් වීමත් ප්‍රායෝගික ප්‍රතිචාරයනුත් අවශ්‍යය වනු ඇත.

මෙවැනි පසුබිම තුළ, සේ.අ. අරමුදලේ පරිපාලන කටයුතු හා අරමුදල් කළමනාකරණ කටයුතු, නව තත්ත්වයන් සඳහා මුහුණ දීමට හැකි අයුරින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ නවීන තාක්ෂණ ක්‍රමවල නව්‍යකරණයන් භාවිතා කරමින් තවදුරටත් වර්ධනය කිරීමත්, සුමට කිරීමත් කළයුතු බව මුදල් මණ්ඩලයේ අදහසයි.

**ඒ අනුව, පූර්ණ ස්වයංක්‍රීය සහ බොහෝදුරට නිර්ලේඛන කාර්යාල පරිසරයක් කරා මැදි හා දිගු කාලයේදී, ගමන් කිරීමට සේවක අර්ථසාධක අරමුදල සැලසුම් කරමින් සිටී. මෙම නව්‍යකරණයන් තුළින් සේ.අ.අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ගුණාත්මක තත්ත්වය, නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාවය වර්ධනය වනු ඇති අතර, එයින් සැලකිය යුතු මෙහෙයුම් වියදම් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට ද හැකි වනු ඇත.**

මෙයට අමතරව, කම්කරු දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතිව **සේ.අ.අරමුදලේ සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් නම් අනුව නැවත ලියාපදිංචි කිරීම** සහ ජාතික හැඳුනුම්පත් අංකය ඔවුන්ගේ අනන්‍යතාවය හඳුනා ගැනීමේ අංකය ලෙස යොදා ගැනීමේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කඩිනමින් ඉටු කරමින් සිටී. දැනට ක්‍රියාත්මක වන මෙම වැඩ සටහන මගින්, **දෙපාර්ශවයටම පොදුවේ පරිශීලනය කළ හැකි සාමාජික ගිණුම් තබා ගැනීමට පොදු දත්ත ගබඩාවක් නිර්මාණය කර ගැනීමට හැකි වන අතර, දැනට පවතින සේව්‍ය කේන්ද්‍රීය දත්ත පද්ධතිය, සේවක කේන්ද්‍රීය පද්ධතියක් බවට පත් කර ගැනීමට ද හැකි වේ.** 2012 වසර අවසානය වන විට සක්‍රීය සාමාජිකයින් (දැනට අරමුදලට දායක වන සාමාජිකයින්) නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු වලින් කොටසක් සම්පූර්ණ කොට ඇති අතර, සාමාජිකයින් මිලියන 1.2 ක ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ඇත.

එමෙන්ම දැනට ක්‍රියාත්මක වෙමින් පවතින තවත් ව්‍යාපෘතියක් වන්නේ **සේවක තොරතුරු හා දායක මුදල් විද්‍යුත් මාධ්‍යයෙන් එවීමට අනුබල දෙනු ලබන විද්‍යුත් ගොනු කිරීමේ ව්‍යාපෘතියයි.** මේ සඳහා සේ.අ.අ. පනත 2012 වසර තුළ දී සංශෝධනය කරනු ලැබූ අතර, ඒ අනුව සේවක සංඛ්‍යාව 50 හෝ ඊට වැඩි සේවකයන් සිටින සේවායෝජකයන් විසින් සේවක තොරතුරු හා මාසික දායක මුදල් විස්තර විද්‍යුත් ක්‍රමවලින් එවීම අනිවාර්යය කොට ඇත. බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක්ම සේ.අ.අරමුදලේ සේවායෝජකයන් වන තම ගනුදෙනුකරුවන් සඳහා සාමාජික තොරතුරු සිය ආයතනවල විද්‍යුත් පද්ධති තුළින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා සේ.අ.අ. හා ගිවිසුම්වලට එළඹ ඇත. සියළුම බැංකු ආයතන ඉදිරියේ දී සිය ගනුදෙනුකරුවන්ට මෙම පහසුකම් ලබා දීමට ඉදිරිපත් වනු ඇති බව අපගේ බලාපොරොත්තුවයි. විද්‍යුත් මාධ්‍යයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම මගින් සේවකයන් හා සේව්‍යයන් හට ප්‍රතිලාභ රැසක් අත්කර ගත හැකි බව දැනටමත් දන්නා කරුණකි. මෙම ප්‍රතිලාභ

නම් ක්ෂණිකව සාමාජික ගිණුම් බැර කිරීමට හැකිවීම, දත්ත කැවීමේ කටයුතුවල අඩුවීම නිසා ඇතිවන පිරිවැය පිරිමැසුම් හා කාලය ඉතිරිවීම සහ මිනිස් දෝෂ නිසා සිදුවන වැරදීම් අවම වීම යනාදියයි. එමෙන්ම, විද්‍යුත් යොමු කිරීම් ව්‍යාපෘතිය මගින් සේ.අ.අරමුදල් දායක මුදල් වැනි අනිවාර්ය ගෙවීම් කිරීම සඳහා ගතවන කාලය සැලකිය යුතු ලෙස අවම කර ගැනීමට හැකිවීම නිසා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ පහසුකම පෙන්නුම් කරන දර්ශකයේ (Doing Business Ranking) ද තවත් ඉහළ නංවා ගැනීමට හැකි වනු ඇත.

සේ.අ.අ. මුහුණ දුන් සහ මුහුණ දීමට සිදුවන තවත් අභියෝගයක් වන්නේ **වසර පුරා ලැබෙන අතිවිශාල ලේඛන ප්‍රමාණය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමයි.** සේ.අ.අ. ට මිලියන 2 වැඩි අධික ලේඛන සංඛ්‍යාවක් මසකට විවිධ වූ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අතර, මෙම ලේඛන ඉතා ක්‍රමානුකූලව යොමු කිරීම, ගොනු කිරීම හා අනාගත ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කිරීම සුපරික්ෂාකාරීව සිදු කළ යුතු වේ. මෙයට අමතරව සේ.අ.අ. අරම්භ වූ 1958 වසරේ සිට රැස් වූ සාමාජික ලේඛන අතිවිශාල ප්‍රමාණයක් සේ.අ.අ. සතුවන අතර, මිලියන 12 වැනි සාමාජික සංඛ්‍යාවක ප්‍රතිලාභ නිකුත් කිරීමේ කටයුතු වලදී නිසි හිමිකරුවන් හඳුනා ගැනීමේ දී මෙම ලේඛන නිරන්තරයෙන් පරිශීලනය කිරීමට ද සිදු වේ. මේ අවශ්‍යතාවයන් සඳහා ලේඛන ගබඩා කිරීම හා ලේඛන ලබා ගැනීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර, මෙමගින් කාර්යක්ෂමතාව හීන වන අවස්ථා ද ඇත. මෙලෙස වර්ධනය වෙමින් පවතින අභියෝග, පිරිවැය සහ අවදානම් නිසා, **සේ.අ.අ. විසින් සියළුම වැදගත් ලේඛන විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම සඳහා නවීන තාක්ෂණයෙන් හෙබි, දිගුකාලීන ප්‍රතිලාභ ලැබෙන විද්‍යුත් ගබඩාවක් ගොඩනැගීමේ ව්‍යාපෘතියක් ආරම්භ කොට ඇත.** මෙය මේ වනවිට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එය 2015 වසරේ මුල් භාගයේ දී අවසන් කිරීමට නියමිතය.

එමෙන්ම ඉදිරි වසර කිහිපය තුළ දී, **ආයෝජන වාතාවරණය ද සේ.අ. අරමුදලේ කළමනාකරුවන්ට තවත් අභියෝග ගෙන දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** පසුගිය කාලය පුරා ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවැති, නව සහ නැගී එන තත්ත්වයන් හා උපනතීන්වල ප්‍රතිඵලයක් ලෙස මෙම අභියෝග පැන නැගෙනු ඇත. මෙම ප්‍රධාන සාධක නම්;

(අ) රාජ්‍ය අයවැය හිඟය අඩු කිරීමත් සමඟ ක්‍රමයෙන් අඩු වේ යැයි අපේක්ෂිත රාජ්‍ය ණය අවශ්‍යතාවයන් සඳහා වූ සැලසුම්ගත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය;

(ආ) උද්ධමනය සැලකිය යුතු ආකාරයෙන් අඩුවීම සහ දීර්ඝ කාලයක් දක්වා උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීම;

(ඇ) එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාත පහත වැටීමේ පරිසරයක් ඇතිවීම; සහ

(ඈ) මධ්‍යම හා දිගුකාලයේ දී ඇතිවන ඉහළ ආර්ථික වර්ධනය නිසා කොටස් වෙළෙඳපොළ හා සමාගම් බැඳුම්කර වෙළෙඳපොළෙහි ඇතිවීමට අපේක්ෂිත වර්ධනය.

**මෙම වෙනස්කම් වලින් බොහොමයක් සේ.අ.අ. අරමුදල් කළමනාකරුවන් විසින් දැනටමත් අපේක්ෂා කර ඇති ඒවා වන අතර, 2001 තරම් ඈත කාලයක සිට සුළුවෙන් ආරම්භ කරන ලද, සේ.අ.අරමුදලේ ආයෝජන කළඹට සමාගම් කොටස් ඇතුලත් කිරීමෙන් විවිධාංගීකරණ කිරීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් දියත් කිරීම තුළින් මේ බව මනාව පෙන්නුම් කෙරේ.**


එවැනි සුපරික්ෂාකාරී විවිධාංගීකරණය කිරීම තුළින්, විවිධ ආර්ථික අංශ නියෝජනය කරන සමාගම් කොටස්වල මෙන්ම සාංගමික බැඳුම්කර සහ ණයකරවල, ක්‍රමාණුකූලව ආයෝජනය කිරීමෙන්, ආයෝජන කළඹේ සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමට සේ.අ.අරමුදලට හැකි වී තිබේ. රූපසටහන් 2 සහ 3 බලන්න.

ඉදිරි වසරවලදී, ඉහතින් විස්තර කරන ලද උපනතීන් හා තත්වයන් වඩාත් තීව්‍ර ආකාරයෙන් සිදුවීම අපේක්ෂා කරන බව ද මෙහිදී සැලකිය යුතු වේ. මෙම පසුබිම තුළ, නව වත්කම් පන්ති සහ ආර්ථික

ක්ෂේත්‍ර කරා ආයෝජන කළඹ තවදුරටත් විවිධාංගීකරණය කිරීම අනාගතයේ දී සලකා බැලීමට සිදු වනු ඇත. ඇත්ත වශයෙන්ම, එවැනි ප්‍රතිපත්තියක් අවදානම් අවම කිරීමේ ප්‍රධාන මෙවලමක් වනු ඇත. එයට හේතුව, සීමිත උපකරණ කිහිපයක් තුළ වත්කම් සංකේන්ද්‍රණය වීමෙන් ඇතිවන අවදානම් පාලනය කිරීම සඳහා කදිම උපක්‍රමයක් වනු ඇත්තේ කළඹ කළමනාකරණයේ මූලික සිද්ධාන්තයක්වන විවිධාංගීකරණයයි.


**මෙම ආකාරයේ විවිධාංගීකරණ ප්‍රතිචාරයන්, නැගී එන ආර්ථිකයන් තුළ ඇති බොහෝ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික අරමුදල්වල වත්කම් විභාජනයේ දී පැහැදිලිව දැකිය හැකිය. අපට සමාන රටවල් අනුගමනය කරනු ලබන එවැනි උපායමාර්ග සේ.අ. අරමුදල විසින් අධ්‍යයනය කිරීම ද අවශ්‍ය වේ.** සමාගම් කොටස්, බොහෝ රටවල විශ්‍රාමික පාරිතෝෂික අරමුදල්වල ප්‍රධාන වත්කම් පන්තියක් වන අතර, ප්‍රධාන සාධක දෙකක් හේතුවෙන් එම ප්‍රතිපත්තිය සාධාරණ සාර්ථකත්වයක් ලබාගෙන තිබෙන බව පෙනෙන්නට තිබේ. මින් පළමු වැන්න වන්නේ, අවුරුදු 25 සිට 30 දක්වා වූ පරිණත කාල වලින් යුත් සාමාජික විශ්‍රාම අරමුදල්වල වගකීම්, පරිණත කාල අසමතුලිතතාවයන්ගෙන් ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා, ඊට සමාන පරිණත කාලයක් සහිත දිගුකාලීන වත්කම් සමඟ ගැළපීමට සිදුවීමයි. දෙවැනි කරුණ නම් විවිධ වත්කම් අතුරින් දිගු කාලයේ දී ඉහලම ප්‍රතිලාභ අනුපාතයක් ලබාදෙන වත්කම් පන්තියක් වන්නේ, සමාගම් කොටස් වීමයි. ඉහත සඳහන් කරනු ලැබූ සාධකයන්

රූප සටහන 2 ආයෝජන කළඹෙහි සංයුතිය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 3 ආයෝජන කළඹෙහි සංයුතිය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 4

විශ්‍රාම අරමුදල්හි වත්කම් වර්ගීකරණය (%)




මූලාශ්‍රය : විශ්‍රාම සැලසුම් හඳුන්වා දීම : ශ්‍රී ලංකාවට ඇති දිගුකාලීන ප්‍රතිලාභ, සිටි බැංකු සම්මන්ත්‍රණ, ජුනි, 2014, කොළඹ


දෙක ආසියානු පැසිෆික් කලාපය තුළ විශේෂයෙන් නිරීක්ෂණය කළ හැකි අතර, රූප සටහන 4 පෙන්වන පරිදි මෙම බොහොමයක් රටවල් විශ්‍රාම පාරිතෝශික අරමුදල්වල ආයෝජන කළඹ වලින් 30% -40%ක් අතර ප්‍රමාණයක් කොටස්වල ආයෝජනය කර ඇත.

## ස්තුතිය සහ ඇගයීම

තමන්ගේ කාර්යයන් කැපවීමෙන්, නිපුනතාවයෙන් හා විශේෂඥ බවකින් යුතුව කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයේ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විසින් ගන්නා ලද ප්‍රයත්නයන් වෙනුවෙන් මුදල් මණ්ඩලය තම ප්‍රශංසාව පිරිනමන බව දන්වා සිටිමු. මෙම පරිශ්‍රමය නිසා 2012 වසර තුළ දී, අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ වුවද, ප්‍රශංසනීය ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී ඇත.

අසත්‍ය සහ උද්වේගකාරී දෝෂාරෝපණ හා නින්දා සහගත ඇනුම්පද තුළින් අරමුදල විනාශ කිරීම අරමුණ කරගත් දේශපාලන අංශයන්ගේ ප්‍රයත්නයන් හමුවේ අරමුදල පිළිබඳව විශ්වාසය තවදුරටත් අඛණ්ඩව තබා ගැනීම වෙනුවෙන්, මුදල් මණ්ඩලය තම අවංක කෘතඥතාවය අරමුදලේ සියළුම සාමාජිකයින්ට හා සේවාදායකයින්හට පළ කර සිටිමි.

අවසාන වශයෙන්, සේ.අ. අරමුදලේ සාමාජිකයන් සහ පොදු ජනතාව අරමුදල කෙරේහි තබා ඇති විශ්වාසය වර්තමානයේදීත් අනාගතයේ දී හොඳින් ආරක්ෂා වී ඇති බවටත්, අරමුදලේ ස්ථායීතාව සහ වර්ධනය පවත්වා ගන්නා අතරම, සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවූ ප්‍රතිලාභ ඉපයීම සහතික කරනු වස් අවශ්‍ය සියළු පියවර ගන්නා බවටත්, මුදල් මණ්ඩලය දන්වා සිටී.



**අජිත් නිවාඩ් කබ්රාල්**

අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් මණ්ඩලයේ සභාපති

# කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවිඩය



**කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය - 2012 වසර සඳහා**

සේවක අර්ථසාධක අරමුදල 2012 වර්ෂය තුළ අත් කරගත් ප්‍රගතිය දැක්වෙන 2012 වාර්ෂික වාර්තාව නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය වෙත මාගේ සුභාශිංසනය පිරිනමමි.

දැනට විශ්‍රාම ප්‍රතිලාභ නොලබන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ශ්‍රමිකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කර දීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අද වනවිට ශ්‍රී ලංකාවේ පවතින දැවැන්තම සමාජ ආරක්ෂණ ක්‍රමයක් බවට පත් වී ඇත. වසරින් වසර මෙහෙයුම් හා පරිපාලනමය කටයුතු ව්‍යාප්ත කිරීම තුළින් තම සාමාජිකයන් සඳහා වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දීම කම්කරු දෙපාර්තමේන්තුවේ අරමුණ වී ඇත. මේ අනුව 2012 වර්ෂය තුළ දී ද විවිධ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින් ඉටු වන සේවක අර්ථසාධක ගෙවීම් කටයුතු තවදුරටත් පුළුල් කරමින්, සේවක අර්ථසාධක අරමුදල් නොගෙවා පැහැරහරිනු ලබන ආයතන වලින් අරමුදල් අයකර ගැනීම වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දිවයින පුරා පවතින දිස්ත්‍රික් කම්කරු කාර්යාල එක් කොට පරිගණක ජාලයක් ස්ථාපිත කරන ලද අතර, සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් අධීක්ෂණ පරිගණක පද්ධතියේ කටයුතු 2012 වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. තවද, කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2012 වසර තුළ දී සේවක අර්ථසාධක අරමුදල් නොගෙවා පැහැර හරින ලද ආයතන 2991 කට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ ඇඟිලි සළකුණු ඩිජිටල් ක්‍රමයට ලබාගෙන දත්ත ගබඩාවක් සකස් කිරීම 2012 වසර තුළ දී ආරම්භ කරන ලද අතර, මෙය සාමාජිකයන් හට සේවා සැපයීමට මහෝපකාරී වී ඇත.

මෙයට අමතරව සියයට 30%ක පූර්ව ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයක් හඳුන්වාදීමේ අරමුණින් 2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත සම්මත කර ගැනීමට හැකි විය. මෙහිදී අදාළ කොන්දේසි සපුරන සෑම සාමාජිකයෙකුටම තම පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදලින් සියයට තිහක් නොඉක්මවන ප්‍රතිශතයක් ආපසු ලබා ගැනීමේ හිමිකම ලබා දී ඇත. මෙම පනත ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය ඉදිරි කටයුතු මේ වනවිටත් ක්‍රියාවට නංවමින් පවතී.

සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි ඉටු කිරීමට මෙන්ම සේවක හා සේවායෝජක දෙපාර්ශවයම අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් මහඟු සේවයක් සලසන කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද, සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සාර්ථක කිරීම සඳහා උරදෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ද වෙත මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පළ කරමි.

සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව, සේව්‍ය සේවක දෙපාර්ශවයටත් පරිපාලන හා මූල්‍ය ආයතනවලට සම්බන්ධ නිලධාරීන්ටත් මෙම විෂය ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන ශිෂ්‍යයන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ටත් ප්‍රයෝජනවත් වාර්තාවක් වනු ඇතැයි අපේක්ෂා කරමි.



**වී.බී.පී.කේ. වීරසිංහ මිය**

කම්කරු කොමසාරිස් ජනරාල්


# කාර්ය සාධනය - වැදගත් තොරතුරු

## වගුව 2 මූල්‍ය තොරතුරු

රු. මිලියන

| අයිතමය | 2011 | 2012 |
|---|---|---|
| දායක මුදල් | 61,879 | 70,171 |
| ප්‍රතිලාභ ගෙවීම් | 47,311 | 48,712 |
| ශුද්ධ දායක මුදල් | 14,568 | 21,459 |
| දළ ආදායම | 116,043 | 121,413 |
| ශුද්ධ ආදායම | 107,202 | 111,829 |
| සංචිත සඳහා මාරු කිරීම | 3,500 | 5,700 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලිය | 107,284 | 115,771 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී ප්‍රතිශතය (%) | 11.50 | 11.50 |
| සාමාන්‍ය ආයෝජන මත වූ ප්‍රතිලාභ ප්‍රතිශතය (%) | 12.50 | 11.61 |
| මෙහෙයුම් වියදම් | 786 | 948 |
| මෙහෙයුම් වියදම් මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස (%) | 0.68 | 0.78 |


## රූප සටහන 5 අරමුදලේ වර්ධනය




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ වත්කම් (රු. බි.) | 560 | 653 | 770 | 900 | 1,018 | 1,144 |
| වර්ධන අනුපාතිකය (%) | 14.29 | 16.55 | 17.82 | 16.94 | 13.11 | 12.38 |

නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව 2011 වසරේ සංඛ්‍යා නැවත ප්‍රකාශනය කොට ඇත.
මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව


## රූප සටහන 6 සාමාජිකයන්ගේ අවසාන ශේෂ මත ගෙවූ පොලිය




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| පොලී ගෙවීම් (රු. මි.) | 75,027 | 90,691 | 96,268 | 101,284 | 115,771 |
| පොලී අනුපාතිකය (%) | 13.20 | 13.75 | 12.50 | 11.50 | 11.50 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව


## රූප සටහන 7 දායක මුදල් ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු. මි) | 45,951 | 48,712 | 54,796 | 61,879 | 70,171 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු. මි) | 25,931 | 31,901 | 34,896 | 47,311 | 48,712 |
| ශුද්ධ දයක මුදල් (රු. මි) | 20,020 | 16,811 | 19,900 | 14,568 | 21,459 |


මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 8 ප්‍රතිලාභ ගෙවීම සඳහා පවතින ද්‍රවශීලතාවය





මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 9 සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොළී අනුපාතික





මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 10 සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභය




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව


## රූප සටහන 11 ආයෝජන කළඹෙහි සංයුතිය




| කාණ්ඩය | | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| මුළු ආයෝජන කළඹ (රු.බි.) | | 627.3 | 738.1 | 867.1 | 988.0 | 1,105.5 |
| සංයුතිය | | | | | | % |
| රජයේ සුරැකුම්පත් | | 97.9 | 97.1 | 94.1 | 90.8 | 93.6 |
| කොටස් | | 1.1 | 1.3 | 5.0 | 7.9 | 5.4 |
| ණයකර සහ වෙනත් | | 2.0 | 1.6 | 0.9 | 1.3 | 1.0 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 12 සාමාජික ගිණුම් සංඛ්‍යාව




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| දායකත්වය | 2.3 | 2.0 | 2.2 | 2.2 | 2.3 |
| දායකත්ව නොවන | 10.7 | 10.7 | 11.2 | 11.8 | 12.3 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## මෙහෙයුම් තොරතුරු

1. සියයට 11.5 ක පොළී ප්‍රතිශතයක් සාමාජිකයන්ට ගෙවන ලදී.
2. මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 14.6 ක් දක්වා වර්ධනය විය.
3. අරමුදලේ මුළු අගය රු. බිලියන 1,144 ක් දක්වා වැඩි විය.
4. දායක මුදල් ගෙවනු ලබන සාමාජික සංඛ්‍යාව මිලියන 2.2 සිට 2.3 ක් දක්වා වැඩි විය.
5. සාමාජිකයන් 115,654 දෙනෙකුට විශ්‍රාම ප්‍රතිලාභ රු.මිලියන 48,712 ක් ගෙවන ලදී.
6. ණය දෙන ආයතනවලින් නිවාස ණය ලබාගැනීම පිණිස සාමාජිකයන් 11,234 ක් සඳහා සේ.අ.අ. ශේෂයන් ඇපයට තබා ඇප සහතික නිකුත් කරන ලදී.
7. සම්බන්ධිත පාර්ශවයන්ගේ සබඳතා ශක්තිමත් කිරීම පිණිස විවිධ ප්‍රදේශවල සේවාදායකයන්ට ජංගම සේවා 12 ක් ක්‍රියාත්මක කරන ලදී.
8. සේ.අ.අ. සාමාජික දායක මුදල් බැංකු වෙබ් අඩවි හරහා මංගත ගෙවීම් ක්‍රම මගින් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු 3 ක් පත්කරන ලදී.

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවානියුක්තයින් වෙත විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණ පෙරදැරි කොට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලෙහි භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල හා කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත අනුව තමන් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගිනි.

සේවක අර්ථසාධක අරමුදල අනිවාර්ය දායක මුදල් මත පදනම් වූ, විශ්‍රාම පාරිතෝෂික අරමුදලකි. අරමුදලට ලැබිය යුතු අවම මාසික දායක මුදල් ප්‍රමාණය අරමුදලෙහි සාමාජිකයකුගේ මාසික දළ වැටුපෙන් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික වැටුපෙන් සියයට 12 ක ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 8 ක ප්‍රමාණයක් සාමාජිකයා විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ.

තම සේවා නියුක්තිකයන් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ තොරතුරු අදාළ කාලසීමාවක් තුළ එවීමට සේවායෝජකයා බැඳී සිටී. සේවක සංඛ්‍යාව 150 දෙනෙකුට වඩා අඩු සේවායෝජකයින් (C කාණ්ඩය) තම දායක මුදල් හා අදාළ විස්තර මාසිකව එවිය යුතු වන අතර සේවක සංඛ්‍යාව 150 දෙනෙකුට වැඩි ආයතනවල සේවායෝජකයන් (C 3 කාණ්ඩය) අදාළ දායක මුදල් මාසිකව එවා අදාළ විස්තර වාර්තා අර්ධ වාර්ෂිකව එවිය යුතුය. නමුත් 2012 වසරේදී පනතේ කරනු ලැබූ සංශෝධනය අනුව, අවම සේවක සංඛ්‍යාව 50 ක් සිටින සියලුම සේවායෝජකයන් විසින් මාසික දායක මුදල් හා දායක මුදල් විස්තර විද්‍යුත් මාධ්‍යයන් තුළින් මාසිකව එවිය යුතුය.

අරමුදලෙහි සාමාජිකයන් විශ්‍රාම යන වයස සම්පූර්ණ කළවිට (පිරිමින් වයස 55 සම්පූර්ණවීම හා කාන්තාවන් වයස 50 සම්පූර්ණවීම) තම ප්‍රතිලාභ මුදල් ලබාගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. මේ හැර ස්ථිරව රට හැරයාම, පූර්ණ දුබලතාවයට පත්වීම, විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම (කාන්තාවන් සඳහා පමණි) සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු ද ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට ඇති සුදුසුකම් වේ. මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් මියගිය සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබාගැනීමට සුදුස්සෝ වෙති. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන හයකින් නිවාස ණය ලබාගැනීමට ද අරමුදල පහසුකම් සපයා ඇත.

## කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය

- සේවායෝජකයන් හා සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.
- පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කර ගැනීම පිණිස අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සහ දායක මුදල් නිසි ලෙස ගෙවීම පැහැර හැරීම සම්බන්ධව නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ප්‍රමාද වී ගෙවනු ලබන දායක මුදල් සම්බන්ධයෙන් සේවායෝජකයන්ගෙන් දඩ මුදල් අයකර ගැනීම.
- ප්‍රතිලාභ හිමිකම් සඳහා වූ අයදුම්පත් භාර ගැනීම හා එම අයදුම්පත්වලට අදාලව ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධ තීරණ ලිපි මහ බැංකුවට නිකුත් කිරීම.
- සාමාජිකයන්ගේ පෙර පැවති සාමාජික ගිණුම් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීම.
- සාමාජිකයින්ට තම ගිණුම් ශේෂ ඇපයට තබා අනුමත ණය දෙන ආයතන වලින් නිවාස ණය ලබා ගැනීමට හැකිවන පරිදි අදාල නිවාස ණය අයදුම්පත් අනුමත කිරීම.

## මුදල් මණ්ඩලයේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ආදයම් රැස්කිරීම.

සාමාජික ගිණුම් පවත්වාගෙන යාම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා සාමාජිකයින් වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාල ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබාගැනීම සඳහා අයදුම්කොට ඇති සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික අනුමත ණය දෙන ආයතනවලට නිකුත් කිරීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයාටත්, ගරු මුදල් ඇමතිවරයාටත් ඉදිරිපත් කිරීම.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - 2012.12.31 දිනට

සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| ඩී.පී.කේ.ආර්. වීරකෝන් මයා | කම්කරු කොමසාරිස් | |
| වී. උමාමගල් මිය | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ප්‍රතිලාභ ඉල්ලීම් |
| පී.එච්.පී.අයි. බණ්ඩාර මෙනෙවිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ටී. යෝගරාජා මයා | සහකාර කම්කරු කොමසාරිස් | |
| කේ.එල්.කේ. පෙරේරා මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | අයකර ගැනීමේ අංශය |
| ඩී.එච්.ටී. දේශප්‍රිය මයා | සහකාර කම්කරු කොමසාරිස් | |
| යූ.පී.ආර්. සිරිනාග මයා | සහකාර කම්කරු කොමසාරිස් | |
| බී. වසන්තන් මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | පරිගණක අංශය |
| ඩී.වී.ටී.පී. දයානන්ද මෙනෙවිය | සහකාර කම්කරු කොමසාරිස් | පාලන අංශය |
| එන්.එම්.වයි. තුෂාරි මිය | සහකාර කම්කරු කොමසාරිස් | ප්‍රතිලාභ ඉල්ලීම් L |
| ජී.ඒ.ඩී.ආර්. ගයානි මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ඩී.ආර්. පෙරේරා මිය | සහකාර කම්කරු කොමසාරිස් | |

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| කේ. ගුණතිලක මිය | අධිකාරී | |
| සී.එම්.ඩී.එන්.කේ. සෙනවිරත්න මිය | අතිරේක අධිකාරී | |
| එල්.ඩී.ඩී.වයි. පෙරේරා මයා | අතිරේක අධිකාරී | |
| ඒ.ජී.යූ. තිලකරත්න මයා | නියෝජ්‍ය අධිකාරී | |
| එස්.ඒ.එල්. මුතුකුමාර මයා | නියෝජ්‍ය අධිකාරී | |
| එස්.එන්. තිලකවර්ධන මිය | ජ්‍යෙෂ්ඨ පුද්ගලික ලේකම් | |
| ඕ.කේ.එස්.පී. බණ්ඩාර මිය | පුද්ගලික ලේකම් | |
| එස්.එස්.පී.ද. සිල්වා මයා | සහකාර අධිකාරී | පරිපාලන හා ආයතනික සේවා අංශය |
| එච්.ජී.එල්. වික්‍රමසිංහ මයා | සහකාර අධිකාරී | |
| කේ.ජී.එන්. විජේරත්න මිය | සහකාර අධිකාරී | |
| එම්.එම්. සුනිල් ශාන්ත මයා | සහකාර අධිකාරී | රැස්කිරීමේ අංශය |
| වී.කේ. දම්පහලගේ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | නැවත ලියාපදිංචි කීමේ අංශය |
| බී.එම්.ඩබ්.එස්. බාලසූරිය මිය | සහකාර අධිකාරී | |
| සුනිල් කොස්වත්තගේ මයා | සහකාර අධිකාරී | ජංගම දායක මුදල් අංශය |
| කේ.ඒ. සේනාරත්න මිය | සහකාර අධිකාරී | |
| ජී.බී.එන්.ඒ. සමරනායක මෙනෙවිය | සහකාර අධිකාරී | |

| | | |
|---|---|---|
| කේ.ජී. තිලකසිරි මයා | සහකාර අධිකාරී | ගිණුම්ගත දායක මුදල් අංශය |
| පී.ඩී.එන්. ගුණතිලක මෙනෙවිය | සහකාර අධිකාරී | |
| යූ.ඒ. ගුණවර්ධන මයා | සහකාර අධිකාරී | |
| ඩී.එම්.ජී. පියතිලක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | විද්‍යුත් මාධ්‍යයෙන් දායක මුදල් ගිණුම්ගත කිරීමේ අංශය |
| එම්. එන්. වීරසිංහ මයා | සහකාර අධිකාරී | |
| ජේ.ඩී.එස්.ජේ. නානායක්කාර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | අරමුදල් කළමනාකරණ අංශය |
| එන්.එල්.එම්. අබේසේකර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| අයි.ටී.ආර්.එම්. ගුණරත්න මිය | සහකාර අධිකාරී | |
| ඩබ්.ජී.ආර්. හර්ෂප්‍රිය මයා | සහකාර අධිකාරී | |
| ටී. උදයසීලන් මයා | සහකාර අධිකාරී | |
| ඩී.පී. උඩුගමකෝරාළ මෙනෙවිය | සහකාර අධිකාරී | |
| එස්. පද්මනාපන් මයා | සහකාර අධිකාරී | |
| ජී.ඒ.සී.එන්. ගනේපොල මයා | සහකාර අධිකාරී | |
| කේ.එල්.ඒ.සී.එන්. අනුරාධ මයා | සහකාර අධිකාරී | |
| ජී.බී.එම්.පී. දිසානායක මෙනෙවිය | සහකාර අධිකාරී | ගිණුම් සහ පියවීම් අංශය |
| ඩී.වයි.එස්. මහගෙදරවත්ත මෙනෙවිය | සහකාර අධිකාරී | වාර්තා කළමනාකරණ අංශය |
| කේ.එම්.සී. සෝමසිරි මිය | සහකාර අධිකාරී | |
| එම්. වික්‍රමරත්න මයා | සහකාර අධිකාරී | වාර්තා සංශෝධන අංශය |
| පී.එච්.ඩී.ඒ. අත්තනායක මිය | සහකාර අධිකාරී | |
| සී.පී. ජයවීර මෙනෙවිය | සහකාර අධිකාරී | |
| එච්.ඒ.එස්. කුලසිංහ මිය | සහකාර අධිකාරී | නිවාස ණය අංශය |
| ඩබ්.ඒ. නන්දසේන මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ පාලන අංශය |
| එස්.ඒ. ජයවර්ධන මයා | සහකාර අධිකාරී | |
| ජී. ප්‍රේමදාස මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| කේ.කේ.සී.එස්. කන්නන්ගර මෙනෙවිය | සහකාර අධිකාරී | |
| එම්.එම්. සුනිල් ශාන්ත මයා | සහකාර අධිකාරී | මහජන සම්බන්ධතා පැමිණිලි සහ විමසීම් අංශය |

# මෙහෙයුම් සමාලෝචනය

## 1.1 ආර්ථික වර්ධනය

ගෝලීය සාර්ව ආර්ථික අභියෝග හමුවේ, 2012 වසර තුළ සියයට 6.4 ක සැලකිය යුතු වර්ධනයක් පැවතුනි. පසුගිය වසර දෙක තුළ සියයට 08 ඉක්මවූ ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2012 වසර තුළදී ආර්ථික වර්ධනය මන්දගාමී වුවද, දකුණු ආසියානු කලාපය තුළ ඉහළ දළ ජාතික නිෂ්පාදන වර්ධනයක් පසුගිය වසර 2 තුළ අඛණ්ඩව වාර්තා කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය. 2012 වර්ෂය සලකා බලන විට සංවර්ධිත මෙන්ම නැගී එන ආර්ථිකයන්ගේ මන්දගාමී ආර්ථික කටයුතු, යුරෝපා ස්වෛරීත්ව ණය අර්බුදය, එක්සත් ජනපදයේ රාජ්‍ය මූල්‍ය ගැටළු සහ ඉහළ ඛනිජ තෙල් මිල ගණන් යනාදිය තුළින් පැන නැගුනු ගෝලීය අවිනිශ්චිතතාවයන් අපනයන වර්ධනය කෙරෙහි අයහපත් ලෙස බලපාන ලදී. තවද, අයහපත් කාලගුණික තත්ත්වය 2012 වසරේ ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපාන ලදී.

මෙම වර්ෂය තුළ ආර්ථික වර්ධනයට මූලික ජවය සපයන ලද්දේ කාර්මික අංශයෙහි වූ ඉහළ වර්ධනයයි. කාර්මික අංශයෙහි වර්ධනයට ඉදිකිරීම් උප අංශයෙහි වර්ධනය ප්‍රමුඛ ලෙස දායකත්වය සැපයීය. එසේ වුවද, නිෂ්පාදන කර්මාන්ත උප අංශයෙහි වර්ධනය, දේශීය හා විදේශීය ඉල්ලුමෙහි පහත වැටීම නිසා මන්දගාමී විය. වසරෙහි දෙවන භාගයෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය තුළ වුවද, කෘෂිකාර්මික අංශය සියයට 5.8 ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුවද, බාහිර වෙළෙඳ කටයුතුවල පසුබෑම හා ප්‍රවාහන උප අංශයෙහි මන්දගාමීත්වය නිසා සේවා අංශය සියයට 4.6 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලදී.

## 1.2 සේවා නියුක්තිය සහ වැටුප්

ගෙවීමක් නොලබන පවුලේ සේවකයන් සහ සේවා නියුක්තිකයන්ගේ අඩුවීම නිසා 2012 වසරේදී සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව මිලියන 8.129 ක් දක්වා සියයට 0.8 කින් පහළ ගිය ද, පෞද්ගලික, රජයේ සහ ස්වයං රැකියා අංශවල සේවා නියුක්ති ජනගහනයේ නිරපේක්ෂ සංඛ්‍යාව සහ කොටස 2012 වසරේදී ඉහළ ගියේය. විශේෂයෙන්ම, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව මිලියන 3.356 ක් දක්වා සියයට 1 කින් වැඩි විය. පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිකයන්ගේ වැඩිවීම සේ.අ.අ. ට වැදගත් වන අතර එයට හේතුව එවැනි සේවා නියුක්තිකයන් සේ.අ.අ. ගිණුම්වලින් විශාල කොටසකට දායකවීමය. මීට අමතරව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 4.3 කින් වැඩි වූ අතර ස්වයං රැකියා කටයුතුවල නියුක්ත වූවන්ගේ සංඛ්‍යාව ආන්තිකව වැඩි විය. 2012 වර්ෂය තුළ ද ශ්‍රම බලකායෙන් සියයට 41.3 කට දායක වෙමින් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් තම ආධිපත්‍යය රැක ගැනීමට සමත් විය.

පසුගිය වසර කිහිපය තුළ දක්නට ලැබුණු සේවා වියුක්තියේ පහළ යාමේ උපනතිය 2012 වර්ෂය තුළ ද පැවතුණි. කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම ආර්ථික ක්‍රියාකාරකම්හි සිදුවූ ප්‍රසාරණය නිසා සේවා වියුක්ති අනුපාතය පසුගිය වසරේ වාර්තා වූ සියයට 4.2 හි සිට 2012 වසරේදී සියයට 04 ක් දක්වා පහත වැටුණි.


මීට අමතරව, විධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් පෙර වසර හා සසඳන විට 2012 වසරේදී සියයට 22.2 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ කෘෂිකර්මාන්ත අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය එම අංශයේ වැටුප් සංශෝධනය නිසා සියයට 29.3 කින් ඉහළ යාමයි. කෙසේ වෙතත්, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි අවම වැටුප් ප්‍රමාණ දර්ශක වසර තුළදී නොවෙනස්ව පැවතුණි. විධිමත් පෞද්ගලික අංශයේ සැලකිය යුතු වැටුප් වැඩිවීම සේ.අ.අ. දායක මුදල් වැඩිවීමට හේතු විය.

## 1.3 උද්ධමනය

2012 වසරේදී ද උද්ධමනය අඛණ්ඩව සිව්වන වසරටත් තනි අංකයක මට්ටමෙහි පැවතුණි.

කෙසේ වුවත්, පිරිවැය පීඩනයන් සහ සැපයුම් අංශයේ සිදුවූ බාධාවන් හේතුකොට ගෙන 2012 වසරේදී උද්ධමනය ඉහළ නැගුණි. 2012 පෙබරවාරි මාසයේදී සියයට 2.7 ක් දක්වා ලක්ෂ්‍යමය පදනම මත පහළ වැටුණු මතුපිට උද්ධමන අනුපාතිකය එතැන් සිට ඉහළට යමින් 2012 ජූලි මාසයේදී සියයට 9.8 ක උපරිම මට්ටමට ළඟා විය. උද්ධමනය ඉහළ යාම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක වූයේ ඛනිජ තෙල් නිෂ්පාදන, එල්.පී. ගෑස්, විදුලිය හා බස් ගාස්තුවල පරිපාලිත මිල ගණන් ඉහළ නංවමින් කළ සංශෝධන, ආනයනික භාණ්ඩ කිහිපයක රේගු බදු වැඩි කිරීම, රුපියල අවප්‍රමාණය වීම සහ අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ආහාර මිල ගණන් ඉහළයාමයි.

රූප සටහන 13 — කොළඹ පාරිභෝගික මිල දර්ශකය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.4 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

2012 වසරේදී ශ්‍රී ලංකා රජය බදු පදනම පුළුල් කිරීම, පුනරාවර්තන වියදම් තාර්කීකරණය කිරීම හා ආර්ථික වර්ධනය දිරිගැන්වීම සඳහා රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමට ඉලක්ක කරන ලදී. ඒ අනුව, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2011 වසරේදී වාර්තා කළ සියයට 6.9 ට සාපේක්ෂව 2012 වසරේදී සියයට 6.4 ක් පවත්වාගෙන යාමට සමත් විය.

2012 වසර තුළ රාජ්‍ය ණය කළමනාකරණ උපායමාර්ගයේ අවධානය යොමු වූයේ අවම පිරිවැයක් යටතේ රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලන අතරතුර, අවදානම් විචක්ෂණශීලී මට්ටමක පවත්වා ගැනීම කෙරෙහිය. වසරේ රුපියල් බිලියන 489 ක් වූ සමස්ත අයවැය හිඟය ප්‍රධාන වශයෙන්ම විදේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරන ලදී.

ඒ අනුව, සමස්ත මූල්‍යන අවශ්‍යතාවයෙන් විදේශීය මූලාශ්‍ර වලින් ලැබුණු දායකත්වය පසුගිය වසරේ පැවති සියයට 49 ට සහ 2012 අයවැය මගින් ඉලක්කගත අගය වන සියයට 42 ට සාපේක්ෂව 2012 වසරේ සියයට 59 ක් විය. 2012 වසරේ විදේශීය ශුද්ධ මූල්‍යනය රුපියල් බිලියන 286.5 ක් වූ අතර ශුද්ධ දේශීය මූල්‍යනය රුපියල් බිලියන 200.4 ක් විය.

ශුද්ධ දේශීය මූල්‍යනයෙහි සංයුතිය සලකා බැලීමේදී රාජ්‍ය බැංකු මූලාශ්‍රයන් වෙත වැඩි වශයෙන් නැඹුරු විය. බැංකු අංශයෙන් රජයේ ණය ගැනීම් රුපියල් බිලියන 131.5 ක් වූ අතර බැංකු නොවන අංශයෙන් ණය ගැනීම් රුපියල් බිලියන 68.9 ක් පමණක් විය. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව 2012 වසරේ බැංකු නොවන අංශයෙන් ණය ගැනීම් සියයට 74.9 කින් වැඩි විය. පෙර වසරවලදී මෙන්ම සේ.අ.අ. සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව තවදුරටත් බැංකු නොවන අංශයෙහි ප්‍රධාන ආයතනික ආයෝජකයන් විය. ද.ජා.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4 ක් දක්වා අයවැය හිඟය අඩු කිරීමේ මැදිකාලීන අරමුණ කෙරෙහි සේ.අ.අ. සැලකිල්ල යොමු වී ඇත්තේ ඉතා ඉක්මණින් වත්කම් කළඹ විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාවය එයින් පිළිබිඹු කරන බැවිනි.

## 1.5 මූල්‍ය ප්‍රතිපත්තිය

ඉහළ මුදල් ප්‍රසාරණය හා ණය ගලායාම පාලනය කිරීම සහ ඉල්ලුමෙන් ඇදුනු උද්ධමන පීඩනයන් අඩු කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 වසර තුළදී දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. 2012 පෙබරවාරි මාසයේ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් ඉහළ දැමූ අතර විනිමය අනුපාතිකය තීරණය කිරීමේදී වඩාත් නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව 2012 අප්‍රේල් මාසයේදී ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7.75 ක් දක්වා පදනම් අංක 25 කින් ද, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.75 ක් දක්වා පදනම් අංක 75 කින් ද ඉහළ දමන ලදී. මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත සිය රුපියල් ණය වර්ධනය සියයට 18 ක් නොඉක්මවන


ලෙස ද, එතෙරින් අරමුදල් එක්රැස් කරන බැංකුවලට සියයට 23 ක් නොඉක්මවන ලෙස ද විධානයන් නිකුත් කරන ලදී. මෙම දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් වසර අවසානය වනවිට ණය වර්ධනය තියුණු ලෙස පහළ යන ලදී. ණය වර්ධනය පහළ යාම මෙන්ම හිතකර උද්ධමන අපේක්ෂාවන් සලකා බලා 2012 දෙසැම්බර් මාසයේදී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 කින් අඩු කරමින් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරන ලදී.

පළමු මාස අට තුළ බොහෝදුරට අතිරික්තයක්ව පැවති දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව ඉන්පසුව තුලිත මට්ටමක පැවතුණු අතර මහ බැංකුව විසින් ද්‍රවශීලතාවයෙහි ව්‍යුහාත්මක අසමතුලිතතා මගහරවා ගැනීමට දිගුකාලීන පදනම මත විවට වෙළෙඳ කටයුතු සිදු කරන ලදී.

## 1.6 පොලී අනුපාතික

ණය ලබාදීම් මත පැන වූ උපරිම සීමාව සහ මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීම පිළිබිඹු කරමින් 2012 වසරේ මුල් භාගයේදී වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යන ලදී. 2012 පෙබරවාරි සහ අප්‍රේල් යන මාසවල සිදුකළ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමත් සමග බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පදනම් අංක 120 කින් පමණ ඉහළ ගියේය. ජූලි මස මැද දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එම වසරේ ඉහළම අගය වූ සියයට 10.71 කට ළඟා වූ අතර ඉන්පසු සියයට 10.54 ක් පමණ මට්ටමේ ස්ථාවර වූ අතර, ප්‍රතිපත්ති අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ පැවතුණි. පොලී අනුපාතික පහළ දැමීම සහ වසර අවසානයේදී ණය සීමාව අහෝසි වනු ඇතැයි පැවති අපේක්ෂාවන් හේතුවෙන් දෙසැම්බර් මස මැද භාගයේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ තියුණු පහත වැටීමක් සිදුවිය. එක් දින ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය, එක දින මුදල් අනුපාතිකයට සමගාමීව වෙනස් විය. 2011 වසරේ හතරවන කාර්තුවේදී වැඩිවීමට පටන්ගත් තැන්පතු පොලී අනුපාතික 2012 වසර මුළුල්ලේම අඛණ්ඩව වැඩිවිය. තැන්පතු පොලී අනුපාතික ඉහළ යාම වෙළෙඳපොළ පැවති දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් සහ මූල්‍ය ආයතන විසින් දැඩි ලෙස තැන්පතු රාශීකරණයෙහි නිරතවීම නිසා තැන්පතු අනුපාතික වැඩිවිය. සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතිකය පෙර වසර අගදී

රූප සටහන 14 තෝරාගත් පොලී අනුපාතිකයන්ගේ ප්‍රවණතාවයන් - 2012




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

වගුව 3 රජයේ සුරැකුම්පත් සඳහා වූ ද්විතියික වෙළෙඳපොළ ඵලදා අනුපාතික

%වාර්ෂික

| | | කාර්තුව අග | | | | |
|---|---|---|---|---|---|---|
| | | දෙසැ-11 | මාර්තු-12 | ජූනි-12 | සැප්-12 | දෙසැ-12 |
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 8.6 | 10.9 | 11.05 | 11.3 | 10.1 |
| | දින 182 | 8.78 | 11 | 12.5 | 12.73 | 11.3 |
| | දින 364 | 9.25 | 11.15 | 12.81 | 12.98 | 11.65 |
| භාණ්ඩාගාර බැඳුම්කර | වසර 2 | 9.45 | 11.7 | 13.2 | 13.2 | 11.7 |
| | වසර 3 | 9.85 | 11.95 | 13.75 | 13.33 | 11.75 |
| | වසර 4 | 9.92 | 12.1 | 14.03 | 13.6 | 11.95 |
| | වසර 5 | 9.95 | - | 14.15 | 13.8 | 11.85 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

පැවති සියයට 7.24 සිට 2012 දෙසැම්බර් වන විට සියයට 10.10 ක් දක්වා ඉහළ යන ලදී. මීට සාපේක්ෂව, 2012 වසරේදී සේ.අ.අ. සියයට 11.5 ක ප්‍රතිලාභ අනුපාතයක් සේ.අ.අ. සාමාජිකයන් වෙත ගෙවන ලදී.

## 2.1 රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ

ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ යාම, රජයේ ණය ලබාගැනීමේ අවශ්‍යතාවන් ඉහළ යාම සහ දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් හේතුවෙන් ප්‍රාථමික වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යන ලදී. මෙම ඉහළ යාමේ ප්‍රවණතාවය 2012 මැයි මස දක්වා පැවතුණි. බලපත්‍රලාභී බැංකුවලට ණය සීමා පැනවීමත් සමගම, භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කිරීමේ ඉල්ලුම ඉහළ ගිය අතර, ඒ හේතුවෙන් ප්‍රාථමික වෙළෙඳපොළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික පහළ යාමක් දක්නට ලැබුණි. තවද, මහ බැංකුව අනුගමනය කරන ලද විවිධ උපායමාර්ග එනම්, වෙළෙඳපොළට නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් අඩු කිරීමත්, භාණ්ඩාගාර බිල්පත් සඳහා කරනු ලබන සෘජු සහභාගිත්වය අහෝසි කිරීමත් නිසා බර තබන ලද සාමාන්‍ය බිල්පත් අනුපාතිකය අඩු විය. එමනිසා 2012 මැයි මාසයේ සිට දින 91කේ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික පහළ යාමක් සහ ඉන් අනතුරුව අනෙකුත් පරිනත කාලයන්ට අදාළ ඵලදා අනුපාතික යම් ස්ථායීතාවයක් පෙන්වන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීමේ සංශෝධනවලට අනුව 2012 දෙසැම්බර් සිට සියලූ පරිනත කාලයන්ට අදාළ ඵලදා අනුපාතික පහළ වැටීමක් දක්නට ලැබුණි.

රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය, සමස්ත පොලී අනුපාතික ව්‍යුහයේ සිදුවූ ඉහළ යාම පිළිබිඹු කරමින් 2012 අගෝස්තු දක්වා වැඩි විය. ප්‍රාථමික වෙළෙඳපොළෙහි ඵලදා අනුපාතික ස්ථාවර වීමත් සමගම ද්විතියීක වෙළෙඳපොළෙහි ද සියලූ පරිනත කාලයන්ට අදාළ ඵලදා අනුපාතික පහළ වැටීමක් 2012 සැප්තැම්බර් සිට දක්නට ලැබුණි.

තවද, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විදේශීය ආයෝජකයන්ගේ ඉල්ලුම වැඩිවීමත් ද්විතියීක වෙළෙඳපොළෙහි ඵලදා අනුපාතික අඩුවීමට හේතු විය.

## 2.2 සාංගමික ණය උපකරණ වෙළෙඳපොළ

2012 වර්ෂය තුළදී සාංගමික ණය උපකරණ වෙළඳපොළ පෙර වර්ෂය සමග සැසඳීමේදී සාපේක්ෂව ක්‍රියාකාරී වී ඇත. වසර තුල සිදුකල සමාලෝචනයේදී සමාගම් විසින් නිකුත් කල වාණිජ පත්‍රිකා වල වටිනාකම රු. බිලියන 36.9 ක් වූ අතර එය 2011 වර්ෂයේදී රු. බිලියන 13.6 ක් පමණක් විය. තවද වර්ෂය තුළදී බැංකු ආයතන 2 ක් මගින් සාංගමික ණයකර ලැයිස්තුගතවීම් නවයක් පවත්වන ලදි. මෙම ණයකර ස්ථාවර සහ පාවෙන පොළී අනුපාත දෙකෙන්ම සමන්විත වූ අතර පස් අවුරුදු කල්පිරීම් කාල සීමාවක් විය. සාංගමික ණයකර නිකුත් කිරීම මගින් 2012 වසරේදී රු. බිලියන 12.5 ක අරමුදලක් රැස් කරන ලදි. එසේ වුවත්, සාංගමික ණය උපකරණ සඳහා වූ ද්විතික වෙළෙඳපොළ පෙර වසර මෙන්ම 2012 වසර තුලදී ද නොවෙනස්ව පැවතුණි.

## 2.3 කොටස් වෙළෙඳපොළ

කොටස් වෙළෙඳපොළ 2009 සහ 2010 වර්ෂ වලදී දක්නට ලැබුණු ඉහළ යාම හා සංසන්දනය කිරීමේදී 2012 වර්ෂය තුළදී අසතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. 2010 වර්ෂයේ අග භාගයේදී ආරම්භ වූ කොටස් වෙළෙඳපොළ මිල දර්ශක පහළ යාම 2011 වසර තුළදී සහ 2012 වර්ෂයේ පළමු අර්ධය තුළදී දක්නට ලැබුණි. කොටස් තැරැව්කරුවන්ගේ ණය මත පනවන ලද සීමාවන්, වෙළෙඳපොළෙහි දක්නට ලැබුණු ද්‍රවශීලතා සීමාවන්, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි ඇති වූ අහිතකර බලපෑම්, විනිමය අනුපාතයේ විචලනයන් සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල තිබුණු ඉහළ ප්‍රතිලාභ අනුපාතයන් යනාදී කරුණු කොටස් වෙළෙඳපොළ මිල පහළ යාමට බලපෑ ප්‍රධාන සාධක විය.


එසේ වුවද, 2012 දෙවන අර්ධය තුළදී කොටස් වෙළෙඳපොළේ ධනාත්මක වර්ධනයක් දක්නට ලැබුණි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් කොටස් තැරැව්කරුවන්ගේ ණය හා ගනුදෙනු කිරීම මත පනවන ලද රීතීන් ලිහිල් කිරීම, ප්‍රතිපත්ති පොලී අනුපාත සංශෝධනය කිරීම, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ ක්‍රමික වර්ධනය සහ

විදේශ ආයෝජකයන්ගේ අඛණ්ඩ සහභාගිත්වය කොටස් වෙළෙඳපොළ වර්ධනයට උපකාරි විය. ඒ අනුව, 2011 වසරේ සියයට 8.5 කින් සියලු කොටස් මිල දර්ශකයේ (ASPI) පහත වැටීමට සාපේක්ෂව 2012 වර්ෂයේදී එම දර්ශකය පහළ වැටුණේ සියයට 07 කින් පමණි. 2012 වර්ෂය අවසානයේදී මිලංක මිල දර්ශකය (MPI) පෙර වර්ෂය අවසානයේ සිට සසඳන කළ සියයට 02 කින් පහත වැටුණි. විනිවිද පෙනෙන, රීති මත පදනම් වූ මිණුම් දණ්ඩක් සඳහා වූ ආයෝජකයන්ගේ ඉල්ලුමට අනුව, එස් ඇන්ඩ් පී.එස්.එල්. 20 (S&PSL 20) දර්ශකය 2012 ජුනි 27 වන දින හඳුන්වා දෙන ලදී. 2012 වසර අවසානයේදී, මෙම දර්ශකය හඳුන්වාදුන් දින සිට සියයට 8 ක ප්‍රතිශතයකින් වර්ධනය වී ඇත. ආහාරපාන සහ දුම්කොළ අංශය හැර අනෙකුත් සියලුම උප අංශයන් කොටස් වෙළෙඳපොළෙහි පහළ යාමට දායක විය.

දර්ශකවල පහළ යාමට අනුගාමී වූ කොළඹ කොටස් වෙළෙඳපොලේ ප්‍රාග්ධනීකරණය සියයට 2 කින් 2011 පැවති රුපියල් ට්‍රිලියන 2.21 සිට රුපියල් ට්‍රිලියන 2.17 ක් දක්වා 2012 වසර අවසානය වනවිට පහත වැටුණි. සමාලෝචනයට අදාළ වර්ෂය තුළදී, මූලික මහජන කොටස් නිකුතුන් මගින් (IPO) නව ලැයිස්තුගතවීම් හයක් සිදුවූ අතර, හිමිකම් නිකුතුන් දහ නවයක් සහ හඳුන්වාදීම් මාර්ගයෙන් නව ලැයිස්තුගතවීම් දොළහක් ද විය. ඒ අනුව, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් ගණන 287 දක්වා 15 කින් 2012 වසර අවසානයේදී වැඩි විය.

තවද, කොටස් වෙළෙඳපොළ 2011 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 546 ක පිරිවැටුමට සාපේක්ෂව, රුපියල් බිලියන 214 ක පිරිවැටුම දක්වා අඩුවීමක් 2012 වර්ෂයේදී වාර්තා කරනු ලැබීය. එමනිසා කොළඹ කොටස් වෙළෙඳපොලේ දිනක සාමාන්‍ය පිරිවැටුම පෙර වසරේ පැවති රුපියල් මිලියන 2,286 සාපේක්ෂව, මෙම වසරේදී රුපියල් මිලියන 884 ක් පමණක් විය. පෙර වසරවල මෙන් මෙම වසරේදී ද දේශීය ආයෝජකයන් අභිබවනය කරන ලදී. පිරිවැටුම හා ගනුදෙනු සංඛ්‍යාව සඳහා දේශීය ආයෝජකයන්ගේ දායකත්වය පිළිවෙලින් සියයට 75 ක් සහ සියයට 97 ක් විය.

**රූප සටහන 15** — **සියළු කොටස් මිල දර්ශක හා ශ්‍රී ලංකා එස් ඇන්ඩ් පී මිල දර්ශකය**




මූලාශ්‍රය : කොළඹ කොටස් වෙළෙඳපොළ

2010, 2011 කාලසීමාව තුළ කොළඹ කොටස් හුවමාරුව තුළ ශුද්ධ විදේශ විනිමය ගලායාමක් තිබුණි ද, 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය ඉහළ ගොස් ඇත. විදේශීය මිලදී ගැනීම් සහ විකිණීම් පිළිවෙලින්, රුපියල් බිලියන 72.7 ක් සහ රුපියල් බිලියන 34 ක් වූ අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ විදේශ විනිමය ලැබීම් රුපියල් බිලියන 38.7 ක් විය (ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 304). 2011 වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙතින් ගලා ගිය ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය රුපියල් බිලියන 19ක් විය (ඇ.එ.ජ. ඩොලර් මිලියන 167).

ආයතනික ආයෝජකයන්ගේ දායකත්වය විදේශ මිලදී ගැනීම් වලින් සියයට 95.8 ක් සඳහා දායක විය.

### 3. සේ.අ.අ. ප්‍රගති සමාලෝචනය

2012 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වත්කම් රුපියල් බිලියන 1,144 ක් වූ අතර, මෙය 2011 වසරේ රුපියල් බිලියන 1,018 හා සැසඳීමේ දී සියයට 12.4 ක වර්ධනයකි. මෙම වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ සාමාජික දායක මුදල් ඉහළ යාම හා විචක්ෂණශිලි කළමනාකරණය හේතුවෙන් වසර තුළ ඉපැයූ ආදායම ඉහළ යාමය. 2012 වසර අගභාගයේ දී සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 14.6 ක් වූ අතර, මෙය 2011 වසර අගභාගයේ වූ මිලියන 14 හා සැසඳීමේ දී සියයට 4.3% ක වර්ධනයකි. සක්‍රීය සාමාජික


| වගුව 4 | සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් 2012 |
|---|---|

| ප්‍රතිලාභ ලැබීමේ සුදුසුකම | ප්‍රතිලාභ අයදුම්පත් ගණන | | මුළු ප්‍රතිලාභ ගෙවීම් (අ) | |
|---|---|---|---|---|
| | ගණන | % | ප්‍රමාණය (රු.බි.) | % |
| විශ්‍රාමික දිවියට එළඹීම | 74,161 | 61.0 | 35.79 | 75.3 |
| විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වීම | 27,114 | 22.8 | 4.85 | 9.5 |
| සංක්‍රමණය | 1,654 | 1.7 | 1.95 | 5.2 |
| වෛද්‍ය හේතු | 1,080 | 1.1 | 0.53 | 1.2 |
| සාමාජිකයාගේ මරණය | 5,181 | 8.2 | 2.09 | 4.3 |
| විශ්‍රාම වැටුප් ලබන රැකියාවකට බැඳීම | 5,293 | 4.3 | 0.96 | 1.9 |
| වෙනත් | 1,171 | 1.0 | 1.77 | 2.7 |
| **මුළු ගණන** | **115,654** | **100.0** | **47.94** | **100.0** |

මූලාශ්‍රයඃ සේ.අ.අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙහි ඇතුළත් වන්නේ කොටස් ගෙවීම්, හිමිකම් නොපෑ ප්‍රතිලාභ හා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ හැර අනෙකුත් ප්‍රතිලාභ ගෙවීම්ය.

රූප සටහන 16 දයක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් හා ශුද්ධ දයක මුදල් 2008-2012




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| දයක මුදල් | 46 | 48.7 | 54.8 | 61.9 | 70.2 |
| ප්‍රතිලාභ ගෙවීම් | 25.9 | 31.9 | 34.9 | 47.3 | 48.7 |
| ශු. දයක මුදල් | 20.1 | 16.8 | 19.9 | 14.6 | 21.5 |

මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ගිණුම් ප්‍රමාණය 2011 වසරේ මිලියන 2.2 සිට මිලියන 2.3 දක්වා වර්ධනයක් වාර්තා කළ අතර, අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව 2011 වසර අග වූ මිලියන 11.8 ට සාපේක්ෂව මිලියන 12.3 දක්වා 2012 වසර අගදී වර්ධනය විය. එමෙන්ම දායක වන සේවායෝජක සංඛ්‍යාව 2011 දී වූ 64,562 ට සාපේක්ෂව, 68,140 දක්වා සියයට 5.5 කින් 2012 වසරේ දී වර්ධනය විය.

### 3.1. සාමාජික දායකත්වය හා අරමුදල් ප්‍රතිලාභ ගෙවීම්.

2012 වසරේ දී ලැබුණු දායක මුදල් ප්‍රමාණය රු. බිලියන 70.2 ක් වූ අතර, එය 2011 වසරේ රු. බිලියන 61.9 හා සැසඳීමේ දී සියයට 13.4 ක වර්ධනයකි. සාමාජික ප්‍රතිලාභ ලෙස 2012 වසරේ දී රු.බිලියන 48.7 ක් අදාළ සාමාජිකයින්ට හා හිමිකරුවන්ට ගෙවූ අතර, මෙය 2011 වසරේ රු.බිලියන 47.3 හා සැසඳීමේ දී සියයට 3 ඉහළ යාමයි. ඒ අනුව, ශුද්ධ දායක මුදල් (දළ දායක මුදලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) රු. බිලියන 14.6 සිට රු.බිලියන 21.5 දක්වා සියයට 47.3 ක ප්‍රතිශතයක ඉහළ යාමක් වාර්තා විය.


රූප සටහන් 16 හි දක්වා ඇති පරිදි, සාමාජික දායක මුදල් ලැබීම් හා ප්‍රතිලාභ ගෙවීම් යන අංශ දෙකෙහිම ඉහළයාමේ නැඹුරුතාවයක් පසුගිය වසර 5 තුළ පෙන්නුම් කෙරීන. වගු අංක 4 දක්වා ඇති පරිදි ගෙවනු ලැබූ ප්‍රතිලාභ වලින් වැඩි කොටසක් විශ්‍රාමික දිවියට එළඹි සාමාජිකයින් සඳහා විය. තවද, ප්‍රතිලාභ ගෙවීම් වලින් සැළකිය යුතු තරම් ප්‍රතිශතයක් විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වූ සාමාජිකාවන් සඳහා ගෙවා ඇත.

### 3.2. සේ.අ.අ. ආයෝජන කළඹ

අරමුදලේ මුළු ආයෝජන කළඹ (පොත් අගය) 2011 වසරේ වූ රු. බිලියන 985.6 සිට රු.බිලියන 1,105.5 දක්වා 2012 වසරේ දී සියයට 12.2 වර්ධනය විය. ආයෝජන කළඹේ වර්ධනයට මූලිකව හේතු වූයේ අයෝජන ආදායමේ හා සාමාජික අරමුදල්වල ඉහළ යාමයි.

සුපුරුදු පරිදි 2012 වසරේ දී ද අරමුදලේ ප්‍රමුඛ ආයෝජනය වූයේ රාජ්‍ය සුරැකුම්පත්ය. ඒ අනුව, මුළු ආයෝජනයෙන් සියයට 93.6 ක් රාජ්‍ය සුරැකුම්පත් වල ද සියයට 5.4 ක් සමාගම්

රූප සටහන 17 | ආයෝජන කළඹෙහි සංයුතිය 2008 - 2012




මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

කොටස් වල ද සියයට 0.7 ක් සාංගමික ණයකර වල ද ආයෝජනය කොට තිබිණි. සියයට 0.3 ක් වූ සෙසු ආයෝජන අධි ද්‍රවශීල වත්කමක් වන රාජ්‍ය සුරැකුම්පත් ප්‍රති විකුණුම් තුළ ආයෝජනය කෙරුනේ අරමුදලේ ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීම සඳහාය. පසුගිය වසර හා සසඳා බැලීමේ දී 2012 දී රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන ප්‍රතිශතය සියයට 2.8 කින් වර්ධනය වී ඇති අතර, සමාගම් කොටස් ආයෝජන ප්‍රතිශතය සියයට 2.5 කින් පහළ වැටී ඇත.

### 3.2.1.රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹ


භාණ්ඩාගාර බැඳුම්කර, රුපියල් ණය හා භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹ 2011 වසරේ දී වූ රු. බිලියන 897.7 සිට 2012 වසරේ දී රු. බිලියන 1,035.2 දක්වා රු. බිලියන 137.5 කින් වර්ධනය විය. 2012 වසර අවසානයේ දී භාණ්ඩාගාර බැඳුම්කර, මුළු ආයෝජන කළඹින් සියයට 91.5 ක් වූ අතර, රුපියල් ණය ප්‍රතිශතය සියයට 2.3 සිට සියයට 2.1 දක්වා ආන්තිකව පහත වැටුනේ සුරැකුම්පත් කල්පිරීම හේතුවෙනි.

2012 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත් වලින් රු.බිලියන 119.75 ක් පොලී ආදායම, ක්‍රමක්ෂය හා ප්‍රාග්ධන ලාභ ලෙස ඉපැයූ අතර, එය අරමුදලේ පූර්ණ දළ ආදායමෙන් සියයට 98.4 ක ප්‍රතිශතයක් නියෝජනය කෙරිනි. 2012 වසරේ දී සාමාන්‍යය රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹේ උපලබ්ධි වූ ප්‍රතිලාභ අනුපාතය සියයට 12.1 වූ අතර, රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹේ හරිත සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය සියයට 11.1 විය (වගුව 5). සංඛ්‍යා සටහන 5 හි දක්වා ඇති පරිදි මුළු රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹින් සියයට 54.8 ක් ඊලඟ වසර 4 තුළ දී කල්පිරීමට නියමිත අතර, ඉතිරි සියයට 45.2 ක ප්‍රතිශතය ඉන් වසර 5 කට පසු කල් පිරීමට නියමිතය.

### 3.2.2. සමාගම් කොටස් කළඹ

ලැයිස්තුගත මෙන්ම ලැයිස්තුගත නොකළ ආයෝජනවලින් සමන්විත වන අරමුදලේ

රූප සටහන 18 | කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය 2012 වසර අවසානයට




මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

5 වගුව | රාජ්‍ය සුරැකුම්පත් කළඹේ ආයෝජන කල්පිරීම පිළිබඳ වර්ගීකරණය - 2012 අවසානයේ දී

| කල්පිරීම | ප්‍රමාණය | කොටස් (%) | හරිත සාමාන්‍ය ප්‍රතිලාභය (%) |
|---|---|---|---|
| වසරකට අඩු | 231,193 | 22.3 | 12.7 |
| වසර 1 -2 | 126,146 | 12.2 | 9.8 |
| වසර 3 -4 | 209,817 | 20.3 | 10.1 |
| වසර 5 ට වැඩි | 468,082 | 45.2 | 11.1 |
| මුළු එකතුව | 1,035,238 | 100.0 | 11.1 |

මූලාශ්‍රයː සේ.අ.අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සමාගම් කොටස් කළඹ, 2011 වසරේ වූ ලැයිස්තුගත ආයෝජනයන්ගෙන් කොටසක් අලෙවි කිරීම හේතුවෙන් රු. බිලියන 78.3 සිට රු. බිලියන 59.2 දක්වා 2012 වසරේ දී රු. බිලියන 16.7 කින් පහත වැටිණි. රු .බිලියන 59.1 කින් සමන්විත කොටස් ආයෝජන කළඹකින් ද, රු. බිලියන 0.1 වූ වෙළෙඳ කළඹකින් ද සමන්විත සමාගම් කොටස් කළඹ 2012 වසරේ දී අරමුදලේ සමස්ත ආයෝජන කළඹින් සියයට 5.4 ක් විය.

කොළඹ කොටස් වෙළෙඳපොළේ ඇති මූල්‍ය හා බැංකු, විවිධාංගීකරණ, හෝටල් හා සංචාර, නිෂ්පාදන, ඉදිකිරීම් හා ඉංජිනේරු යන අංශයන්ගේ, මනා මූල්‍ය ශක්තියකින් යුත් සමාගම්වලින් සමන්විත සහ මනා ලෙස විවිධාංගීකරණය වූ, විකිණීම සඳහා ඇති ආයෝජන කළඹක්, මෙම වසර තුළ දී ද අරමුදල විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය (රූප සටහන 18). 2011 වසරේ රු. බිලියන 2.4 ක් වූ සමාගම් කොටස් කළඹේ ආදායම 2012 වසරේ දී රු. බිලියන 2.6 දක්වා සියයට 8.3 කින් ඉහළ ගිය අතර, එය ලාභාංශ, ප්‍රාග්ධන ලාභ හා වෙළෙඳ කළඹේ වෙළෙඳ පොළ මිලට අගය කිරීමෙන් ලැබූ ලාභ/අලාභ වලින් සමන්විත විය.

### 3.2.3. සාංගමික ණය කළඹ

2012.12.31 දිනට රු.බිලියන 8 ක් වූ සේ.අ.අ. සාංගමික ණයකර, භාර සහතික සහ උකස් සුරැකුම් වැනි ආයෝජන ශ්‍රේණියේ සාමාන්‍ය ණය උපකරණවල ආයෝජනය කරයි. 2012 වසරේ දී, අරමුදල් ණය නිකුතු කිහිපයක ආයෝජන කරන ලදී. අරමුදලේ සාංගමික ණය කළඹ, මුළු කළඹින් සියයට 1 ක් විය. වසර තුළ දී පොලී ආදායම ලෙස රු. මිලියන 1,049 ක් ඉපැයූ අතර, සාමාන්‍ය අරමුදලේ ප්‍රතිලාභ අනුපාතය වසරකට සියයට 12.2 විය.

### 3.2.4. ප්‍රති විකුණුම් හා භාණ්ඩාගාර බැඳුම්කර තාවකාලිකව ණයට දීම

අරමුදලේ දෛනික ද්‍රවශීලතා කළමනාකරණය සඳහා අතිරේක මුදල් ප්‍රති මිලදී ගැනීම් හා විකිණීම් වෙළෙඳපොළේ ආයෝජනය කෙරේ. 2012 වසරේ ප්‍රති විකුණුම් තුලින් ඉපැයූ ආදායම රු.මිලියන 251 විය.

### 3.2.5. අරමුදලේ ආදායම

අරමුදලේ දළ ආදායම 2011 වසරේ වූ රු. බිලියන 116 ට සාපේක්ෂව 2012 වසරේ දී රු. බිලියන 121.4 දක්වා රු. බිලියන 4.6 කින් වර්ධනය විය (වගු අංක 6). පොලී ආදායම හා ක්‍රමක්ෂය ලාභ සියයට 97.8 ඉහළම දායකත්වය මුළු ආදායමට සැපයූ අතර, ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ සියයට 2.4 විය. වෙළෙඳපොළ මිලට අගය කිරීම හේතුවෙන් වෙළෙඳ කළඹ සියයට 0.3 අලාභයක් වාර්තා කරන ලදී.

2012 වසරේ දී පොලී ආදායම හා ක්‍රමක්ෂය ලාභ රු.බිලියන 118.7 දක්වා රු. බිලියන 5.3 කින් ඉහළ ගියේය. වසර ආරම්භයේ කොටස් විකිණීම හේතුවෙන් 2012 වසරේ ඉපැයූ ප්‍රාග්ධන ලාභ ප්‍රමාණය 2011 වසරේ රු. මිලියන 715 සිට රු. මිලියන 1,020 දක්වා, රු. මිලියන 305 ක් වැනි සැළකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය විය.

වගුව 6 ආයෝජන ආදායම

| ආදායම් මූලාශ්‍රය | 2011 | | 2012 | | වර්ධනය % |
|---|---|---|---|---|---|
| | රු.මි. | ප්‍රතිශතය % | රු.මි. | ප්‍රතිශතය | |
| පොලිය හා ක්‍රමක්ෂය ලාභ | 113,400 | 97.7 | 118,696 | 97.8 | 4.7 |
| රාජ්‍ය සුරැකුම්පත්වලින් ලැබූ ප්‍රාග්ධන ලාභ | 10 | .. | 34 | .. | 240 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලැබූ ලාභ/අලාභ | (267) | (0.2) | (388) | (0.3) | 45.3 |
| කොටස් විකිණීමෙන් ලැබූ ප්‍රාග්ධන ලාභ | 715 | 0.6 | 1,020 | 0.8 | 42.7 |
| ලාභාංශ | 1,963 | 1.7 | 1,996 | 1.6 | 1.7 |
| වෙනත් | 222 | 0.2 | 55 | 0.1 | (75.2) |
| මුළු එකතුව | 116,043 | 100.00 | 121,413 | 100.0 | 4.6 |

මූලාශ්‍රය : සේ.අ.අ. දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| 7 වගුව | මෙහෙයුම් වියදම් | | |
|---|---|---|---|
| අයිතමය | 2011 රු.මි. | 2012 රු.මි. | වර්ධනය % |
| කාර්ය මණ්ඩල වියදම් | 417 | 514 | 23.3 |
| පරිපාලන වියදම් | 335 | 397 | 18.5 |
| වෙනත් වියදම් | 34 | 37 | 8.9 |
| මුළු එකතුව | 786 | 948 | 20.6 |
| මුළු වියදම් දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස (%) | **0.68** | **0.78** | **12.82** |

මූලාශ්‍රය : සේ.අ.අ. දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ථයක් වශයෙන් අධි ඵලදා සහිත රාජ්‍ය සුරැකුම්පත් කල්පිරීම හේතුවෙන් 2012 වසරේ සම්පූර්ණ කළඹේ ඵලදා අනුපාතය 2011 වසරේ ඵලදා අනුපාතය වූ සියයට 12.5 ට සාපේක්ෂව සියයට 11.6 දක්වා පහත වැටින.

## 3.3. මෙහෙයුම් වියදම්

අරමුදලේ මුළු මෙහෙයුම් වියදම් 2011 වසරේ වූ රු. මිලියන 785.7 සිට රු. මිලියන 947.7 දක්වා සියයට 20.6 කින් 2012 වසරේ දී වර්ධනය වූ අතර, එයට මූලික වශයෙන් හේතු වූයේ, පෙර වසරවල සිදු වූ පරිදිම සේවක මණ්ඩල වියදම් ඉහළ යාමය. එසේ නමුත්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම් සියයට 0.78 මට්ටමේ රඳවා ගැනීමට අරමුදල සමත් විය. පසුගිය වසර කිහිපය මුළුල්ලේම මෙහෙයුම් වියදම් දළ ආදායමෙන් සියයට 1 ට අඩු අගයකින් පවත්වා ගැනීමට හැකිවීම අරමුදලේ විශේෂ ලක්ෂණයකි.

## 3.4. බදු වියදම


2012 වසරේ දී අරමුදල විසින් රු.මිලියන 8,637 ආදායම් බදු ලෙස ගෙවා ඇති අතර, මෙය 2011 වසරේ රු. මිලියන 8,055 හා සැසඳීමේ දී සියයට 7.2 ක වර්ධනයකි.

## 3.5. සාමාජික ගිණුම් ශේෂ හා පොලී ගෙවීම්

2012 වසරේ දී සියළු සාමාජික ගිණුම් ශේෂයන් සියයට 14 ක අගයකින් ඉහළ දමමින්, රු. බිලියන 115.7 ක් පොලී ලෙස සාමාජිකයින් හට බෙදාහරින ලද අතර, ඒ අනුව සාමාජික ගිණුම් ශේෂ එකතුව 2011 වසරේ වූ රු. බිලියන 986 සිට රු.බිලියන 1,124 දක්වා වර්ධනය විය.

පොලී අනුපාතය පහළ යැමේ පරිසරයක් තුළ වුවද සියයට 11.5 වැනි පොලී අනුපාතිකයක් 2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර තුළ ප්‍රකාශ කිරීමට අරමුදලට හැකි විය.

රූප සටහන 19 සාමාජික ශේෂ සහ පොලී ගෙවීම්




මූලාශ්‍රය : සේ. අ. අ. දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.6 අවදානම් කළමනාකරණය

විශාලතම ජාතික විශ්‍රාමික අරමුදල ලෙස සේ.අ.අ. එහි ආරක්ෂාව සහ වර්ධනය සුරක්ෂිත කරන අතරතුර අර්ධ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ට උපරිම විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීම සඳහා ඔවුන්ගේ දිගුකාලීන ඉතිරි කිරීම් සේ.අ.අ. විසින් කළමනාකරණය කරනු ලැබේ. එමෙන්ම, 2012 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රධාන පෙළේ මූල්‍ය ආයතනවල මුළු වත්කම් වලින් සියයට 12.7 ක් පමණ නියෝජනය කරනු ලැබූ බැවින්, සේ.අ.අ. මූල්‍ය අංශයේ වැදගත් ස්ථානයක් ද හිමිකර ගන්නා ආයතනයකි. එමනිසා එහි විචක්ෂණශීලීව අවදානම් කළමනාකරණය කිරීම

| වගුව 8 | ප්‍රතිලාභ ගෙවීම් සඳහා පවතින ද්‍රවශීලතාවය |
|---|---|

| වර්ෂය | මුදල් ප්‍රවාහය | | | | ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභ/මුළු මුදල් ගලා ඒම % |
|---|---|---|---|---|---|---|
| | දායක මුදල් | පොලී සහ අනෙකුත් ආදායම් | ආයෝජන කල්පිරීමෙන් ලද ආදායම් | එකතුව | | |
| 2008 | 45.95 | 55.03 | 235.75 | 336.73 | 25.93 | 7.7 |
| 2009 | 48.71 | 75.11 | 249.47 | 373.30 | 31.90 | 8.5 |
| 2010 | 54.80 | 89.77 | 303.28 | 447.84 | 34.90 | 7.8 |
| 2011 | 61.88 | 89.80 | 380.94 | 532.62 | 47.31 | 8.9 |
| 2012 | 70.17 | 86.92 | 401.68 | 558.77 | 48.71 | 8.7 |

මූලාශ්‍රය : සේ.අ.අ. දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

සාමාජිකයන්ගේ සමෘද්ධියටත්, රටේ සමස්ත මූල්‍ය පද්ධතියටත් ඉතා වැදගත් වේ. අරමුදලට බලපාන ප්‍රධාන අවදානම් වනුයේ, ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් අවදානමයි.

### 3.6.1 ණය අවදානම

ආයෝජනයන් සමග සම්බන්ධ වන ගනුදෙනුකරුවන් හෝ ණය උපකරණ නිකුත් කරන්නන් ඔවුන් විසින් ගෙවිය යුතු අදාළ මුදල් ගෙවීමට නොහැකි වීම හේතුවෙන් අරමුදලට සිදුවිය හැකි පාඩුව ණය අවදානම ලෙස හැඳින්විය හැක. මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 94 ක් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති බැවින් සේ.අ.අ. වෙත ඇති ණය අවදානම් ඉතා අවම වේ. අවදානම සහ ප්‍රතිලාභය සලකා බලමින් දැඩි ලෙස විශ්ලේෂණය කර තෝරාගත් ඉහළ ණය සුදුසුකමක් ඇති සාංගමික ණය උපකරණවල අරමුදලින් සියයට 1 ක් ආයෝජනය කර ඇත. ඊට අමතරව සියලුම ප්‍රතිවිකුණුම් ගිණුම් සඳහා ඇප වශයෙන් ප්‍රමාණවත් පරිදි රාජ්‍ය සුරැකුම්පත් තබාගෙන ඇත.

### 3.6.2 වෙළෙඳපොළ අවදානම

මූල්‍ය වෙළෙඳපොළේ විනිමය අනුපාත, කොටස් සහ පොලී අනුපාත වැනි වෙළෙඳපොළ මිල හේතුවෙන් අරමුදලෙහි ආදායම සහ එහි ආයෝජනවල වටිනාකමට සිදුවිය හැකි බලපෑම් වෙළෙඳපොළ අවදානම් ලෙස හැඳින්විය හැක. මේ වනවිට අරමුදල විසින් මුහුණපානු ලබන වෙළෙඳපොළ අවදානම් වර්ග දෙකකි. එනම්, පොලී අනුපාතික අවදානම සහ කොටස් මිල අවදානමයි. වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාමේදී, අලෙවිය සඳහා ඇති භාණ්ඩාගාර බැඳුම්කර කළඹේ වටිනාකම අඩුවන අතර, පොලී අනුපාතික පහළ යාමේදී අරමුදලට අඩු පොලී අනුපාතිකවල ආයෝජනය කිරීමට සිදුවිය. කෙසේ වෙතත්, මෙම අවදානම යම් දුරකට මගහරවා ගෙන ඇත්තේ විවිධ කල්පිරීම් සහ ප්‍රතිලාභ සහිත භාණ්ඩාගාර බැඳුම්කර තෝරා ගැනීම හා වෙළෙඳ ආයෝජන කළඹේ විශාලත්වය සීමා කිරීම සඳහා අරමුදල විසින් ගනු ලබන ක්‍රියාමාර්ග තුළිනි.

කොටස් මිල අවදානම ලෙස හඳුන්වන්නේ කොටස් මිල පහළ යාමෙන් කොටස් කළඹේ වටිනාකම පහළ යාමයි. කොටස් කළඹ මත උපරිම සීමා පැනවීම සහ බැංකු, මූල්‍ය හා රක්ෂණ, විවිධ හෝටල් හා සංචාරක, ඉදිකිරීම් හා ඉංජිනේරු, නිෂ්පාදිත හා විදුලි සංදේශ යන අංශවලට ආයෝජනය විවිධාංගීකරණය කිරීම තුළින් මෙම අවදානම හැකිතාක් අවම කරගෙන ඇත. තවද, සේ.අ.අ. ඉතාමත් සැලකිලිමත් ලෙස විශ්ලේෂණය කර මූල්‍ය වශයෙන් ශක්තිමත් සහ වෙළෙඳපොළ තුළ ඌන මිලට ලක්වී ඇති කොටස්වල පමණක් ආයෝජනය කර ඇත. සමස්ත ආයෝජන කළඹ තුළ, කොටස් වෙළෙඳපොළ ආයෝජනය සියයට 5.4 ක් පමණ වන නිසා, කොටස් ආයෝජන කළඹෙන් ඇතිවිය හැකි වෙළෙඳපොළ අවදානම සාපේක්ෂව අවම මට්ටමක පවතී.

### 3.6.3 ද්‍රවශීලතා අවදානම

නිසි වේලාවට මූල්‍ය වගකීම් ගෙවීමට නොහැකි වීමෙන් පැන නැගිය හැකි මූල්‍යමය හෝ

මූල්‍යමය නොවන අලාභ ද්‍රවශීලතා අවදානම වේ. පසුගිය වර්ෂ වලදී අරමුදලට ලැබුණ මාසික හෝ වාර්ෂික දායක මුදල ප්‍රතිලාභ ගෙවීම් වලට වඩා ඉහළ අගයක් ගනී. තවද, නිතිපතා පොලී ආදායම හා ආයෝජන කල්පිරීමෙන් ලැබෙන මුදල් අරමුදලට වසර පුරාම ලැබේ. අරමුදලේ වාර්ෂික ප්‍රතිලාභ ගෙවීම් සමස්ත මුදල් ප්‍රවාහයෙන් සියයට 08 ක් පමණ වේ (වගුව 8). මීට අමතරව, ද්‍රවශීලතා අවශ්‍යතාවයන් පැන නැගුනේ නම් ආයෝජන කල්පිරීමෙන් ලද ආදායම රඳවා ගැනීමෙන් හෝ ද්‍රවශීල සුරැකුම්පත් විකිණීමෙන් මුදල් රැස්කිරීමේ හැකියාව ද අරමුදල සතුව පවතී. අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් එක් දින ප්‍රතිමිලදී ගැනීම් වෙළෙඳපොළ තුළ ක්‍රියාශීලීව කටයුතු කරන අතර ඒ තුළින් තම අතිරික්ත මුදල් ශේෂවලින් ආදායමක් ද උපයා ගනී. ඒ අනුව, අරමුදලේ ද්‍රවශීලතා අවදානම ඉතා අවම මට්ටමක පවතී.

### 3.6.4 මෙහෙයුම් අවදානම

අරමුදලට මුහුණපෑමට සිදුවන මෙහෙයුම් අවදානම් අවම කර ගැනීම පිණිස අරමුදල විසින් පූර්ව ක්‍රියාමාර්ග සහ කඩිනම් නිවැරදි ක්‍රියාමාර්ග යොදනු ලැබේ. සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන AS 400 පද්ධතිය නව ලෙජර් පද්ධතියකට අනුගත කිරීමට 2011 ජනවාරි මස දී සිදුකරන ලදී. මෙම නව පද්ධතිය මගින් අරමුදලේ ක්‍රියාවලීන් අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා පහසුකම් සලසන අතර ගනුදෙනු කේන්ද්‍රීය වශයෙන් වාර්තා කිරීම සිදුකරයි. මෙමගින් අවම ශ්‍රම මැදිහත්වීමක් සහිතව අරමුදලේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා දත්ත නිරවද්‍යතාවය ඉහළ දැමීමට සමත් වී ඇත. අරමුදලේ සියලු මෙහෙයුම් කටයුතු නිරන්තරයෙන් අභ්‍යන්තර විගණනයට භාජනය වන නිසා මෙහෙයුම්වල පවතින දුර්වලතා සහ අභ්‍යන්තර පාලනයේ ඇතිවන අපගමනයන් කළමනාකරණයට වාර්තා වේ. තවද, මාංගත තත්කාලීන උපස්ථ පද්ධතිය (On Line Real Time Backup System) පරිහරණය හේතුවෙන් අරමුදලේ කාර්යයන් කිසි බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට හැකි වී ඇති අතර මේ හේතුවෙන් අරමුදලේ මෙහෙයුම් අවදානම් තව දුරටත් අඩුකර ගැනීමට හැකි වී ඇත. මීට අමතරව, අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාපටිපාටියේ ඇනහිටීම වැළැක්වීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් (BCP) සහ ආපදා ප්‍රතිසාධන භූමිය (DRS) පරීක්ෂණයට ලක් කිරීම සෑම වසරකදීම සිදුකරනු ලැබේ.

### 3.7 නිවාස ණය පහසුකම්

අරමුදලේ සාමාජිකයන්හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, සමූපකාර ග්‍රාමීය බැංකු සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන සහභාගිත්ව ණය දෙන ආයතන 6 මගින් නිවාස ණයක් ලබාගත හැකි නිවාස ණය යෝජනා ක්‍රමයක් 1998 දී හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ අරමුදලේ සාමාජිකයන් වෙනුවෙන් ශේෂ සහතික නිකුත් කිරීමේ කාර්යය 2012 වසර තුළදී ද ක්‍රියාත්මක කරන ලදී.

මෙම වසර තුළදී ශේෂ සහතික 11,234 ක් සහභාගිත්ව ණය දෙන ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත

වගුව 9 නිවාස ණය පහසුකම්

| වර්ෂය | නිකුත් කළ සහතිකපත් (සංඛ්‍යාව) | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහල මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2001 | 16,066 | 2,091 | 381 |
| 2002 | 19,502 | 2,673 | 541 |
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| එකතුව | 192,232 | 40,871 | 14,559 |

මූලාශ්‍රය : සේ.අ.අ. දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 3,973 කි. තවද, 2012 වසරේදී, ගෙවීම් පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,019 ක මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම්වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත ප්‍රේෂණය කරන ලදී.

මෙම නිවාස ණය යෝජනා ක්‍රමය සේ.අ.අ. විසින් පිරිනමනු ලබන අමතර පහසුකමක් වුවද, ඇතැම් සාමාජිකයන් මෙම සේවාව ඵලදායී ලෙස භාවිතයට නොගෙන, ණය ආපසු ගෙවීම් පැහැර හරිනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස සේ.අ.අ. ට මෙම ණය ගෙවීම් පැහැර හැරීම සඳහා වූ හිඟ ණය වාරික සහ සහභාගිත්ව ණය දෙන ආයතන මගින් අයකරනු ලබන දඩ පොලී ඊට අදාළ සාමාජිකයාගේ ගිණුමෙන් අඩුකර ගැනීමට සිදුවන අතර එම මුදල් අදාළ ණය දෙන ආයතන වෙත 1988 අංක 42 දරන (සංශෝධිත) සේ.අ.අ. පනතේ විධිවිධාන වලට අනුකූලව ප්‍රේෂණය කිරීමට සිදුවේ. මේනිසා අදාළ සාමාජිකයාගේ සේ.අ.අ. ශේෂය උග්‍ර ලෙස අඩුවීමකට භාජනය වන අතර, එයින් අපේක්ෂිත ප්‍රතිලාභයට වඩා අඩු ප්‍රතිලාභයක් සේවකයා විශ්‍රාම යාමේදී ලැබේ. 2012 වසර තුළදී ණය දෙන ආයතන විසින් මසකට සියයට 2 සිට සියයට 4 ට ආසන්න දඩ පොලී අනුපාතයක් අයකරනු ලැබූ අතර, එය සියයට 24 සිට සියයට 36 ට ආසන්න වාර්ෂික සඵල දඩ පොලී අනුපාතයකට සමාන විය. එහෙයින්, මෙම නිවාස ණය යෝජනා ක්‍රමයේ උපරිම ප්‍රතිලාභ නෙලා ගැනීම සඳහා ණය පහසුකම් ලබාගන්නා ලද සාමාජිකයන් ණය පැහැර හැරීම්වල ප්‍රතිවිපාක ගැන හොඳින් දැනුවත් කළ යුතුය.

## 3.8 නීතිය ක්‍රියාවට නැංවීම

සේ.අ.අ. පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2012 වසරේදී දිස්ත්‍රික් කම්කරු නිලධාරීන් හා අනු නිලධාරීන් සේවායෝජකයන් 9,799 දෙනෙක් හා සේවා නියුක්තිකයන් 412,255 දෙනෙක්, උතුරු නැගෙනහිර පළාත් සහ සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2012 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙන් සියයට 37 කට වැඩි සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් වූ අතර උතුරු සහ නැගෙනහිර පළාත් මුළු සේවායෝජක ලියාපදිංචි ගණනින් සියයට 24 කට දායක විය.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් ගෙවීම් නොකරන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබාදී ඇත. ඒ අනුව, මේ වනවිට දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කාර්යාල විසින් පිළිවෙලින් රුපියල් මිලියන 4,604 ක් හා රුපියල් මිලියන 2,792 ක් හිමිකම් සඳහා පළමු නිවේදන 13,134 ක් ද, රතු නිවේදන 7,874 ක් ද යවා ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන ලබා දින 28 ක් ඇතුලත ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 2,991 ට එරෙහිව නඩු පවරා රුපියල් මිලියන 1,387 ක අයකර ගෙන ඇත.

## 3.9 සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම

සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී සිදුකළ ප්‍රධාන ව්‍යාපෘති අතරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයන්, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි නම සඳහන්ව ඇති ආකාරයට, නැවත ලියාපදිංචි කරන අතර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (UID) ලෙස භාවිතා කිරීම. සිදුකරනු ඇත. එයින්, සේ.අ.අ. දත්ත ගබඩාව සේවායෝජක කේන්ද්‍ර වූ දත්ත ගබඩාවක සිට සාමාජික කේන්ද්‍ර කරගත් දත්ත ගබඩාව බවට පරිවර්තනය වනු ඇත.

2012 වසර අවසාන වනවිට මිලියන 1.2 කට ආසන්න සක්‍රීය සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් නැවත ලියාපදිංචි කිරීම යටතේ තොරතුරු ප්‍රමාණ රැස්කර තිබුණි. ඒ අතුරින් සියයට 79 කට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබාදී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටළු නිසා රැස්කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම් ලබාගැනීමෙන් පසුව ලියාපදිංචි කරමින් පැවතිනි.

සේ.අ.අ. සාමාජිකයන් තත්කාලීනව නැවත ලියාපදිංචි කිරීම. 2010 නොවැම්බර් මාසයේ

ආරම්භ කරන ලද අතර එය 2012 වසර තුළදී ද සිදුකරන ලදී. නව සාමාජිකයන් 40,000 ක් පමණ මේ යටතේ ලියාපදිංචි කිරීම. සහ නව සාමාජික තොරතුරු ගොනුව (NMR) යාවත්කාලීන කිරීම ද මෙම කාලපරිච්ඡේදයේදී සිදුකර ඇත. පළමුවරට දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත්වලින් තොරතුරු ලබාගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රමයක් ද හඳුන්වාදෙන ලදී.

සාමාජිකයන්ගේ පූර්ව සේවා නියුක්තියන්ට අදාළ වන සාමාජික ගිණුම් ඒකීය හඳුනා ගැනීමේ අංකයට (UID) සම්බන්ධ කිරීම, 2012 වසර තුළදී ද සිදුකරන ලදී. ඒ අනුව, එවැනි සාමාජික ගිණුම් 6,000 ක් ඒකීය හඳුනා ගැනීමේ අංකයට සම්බන්ධ කරන ලදී. මෙම ක්‍රමය මගින් අන්තර්ජාලය හරහා සහ ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවාව හරහා ජා.හැ.අ. ඉදිරිපත් කිරීමෙන් සාමාජිකයන්ට තමන්ට හිමි සියලුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු විමසීමට හැකියාව තිබේ.

## 3.10 විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය

'සී' වාර්තාව හා 'සී 3' වාර්තාව මගින් සාමාජික දායක මුදල් ගෙවීම සඳහා වූ තොරතුරු ඉදිරිපත් කිරීම වෙනුවට සේවායෝජකයන්ට විද්‍යුත් මාධ්‍යයෙන් එම තොරතුරු සැපයීමේ ක්‍රමයක් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. ලේඛන ඉදිරිපත් කිරීමෙන් තොරව විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු දීමේ මෙම නව ක්‍රමය මගින් අරමුදලට හා සේවායෝජකයන් දැනට මුහුණ පාන ගැටළු අවම කර ගැනීමට හැකිවේ. මෙම ක්‍රමය 2012 වසර දක්වා සිය කැමැත්තෙන්ම සහභාගිවීමට සේවායෝජකයන් සමග පවත්වාගෙන යන ලදී. අවම සේවක සංඛ්‍යාව 50 ක් සිටින සේවායෝජකයන්ට මෙය අනිවාර්යය කිරීම. සඳහා 2012 අංක 02 දරන සේ.අ.අ. පනත මගින් සේ.අ.අ. පනත සංශෝධනය කරන ලදී.

තවද, මෙම ක්‍රමය යටතේ සේවායෝජකයන්ට තමන්ගේ දායක මුදල් සෘජු හර කිරීමක් මගින් සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට සෘජුවම ප්‍රේෂණය කිරීමට ක්‍රමයක් හඳුන්වා දී ඇත.

2012 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය දායක මුදල් රැස් කිරීමේ ක්‍රමය පිළිබඳව සේවායෝජකයන් දැනුවත් කිරීමේ වැඩමුළු 12 ක් පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 වසර අවසානයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී සිටි 1,098 ක් වූ සේවායෝජක සංඛ්‍යාව 2012 වසර තුළදී 1,385 ක් දක්වා වර්ධනය විය.

මීට අමතරව, විද්‍යුත් මාධ්‍ය මගින් දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු පත්කිරීම මගින් ඔවුන්ගේ සේවය ලබා ගැනීම දෙපාර්තමේන්තුව ගන්නා ලද තවත් පියවරකි. ඒ අනුව, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව පිළිවෙලින් 2011 ඔක්තෝබර් හා 2012 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සිය ගනුදෙනුකරුවන්ට මේ සඳහා තම සේවය ලබාදීමට පියවර ගන්නා ලදී. 2012 වසර අවසානය වනවිට මුළු සේවායෝජකයන්ගෙන් 235 දෙනෙකු මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී තිබූ. තවද, සම්පත් බැංකුව, මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව මෙම ක්‍රමයට ඇතුළුවීමට අවශ්‍ය තාක්ෂණ වෙනස්වීම් කරමින් තිබූ.

## 3.11 විද්‍යුත් දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම. (පිළිබිඹු ඡායා පිටපත් ව්‍යාපෘතිය)

සේ.අ.අ. දෙපාර්තුමේන්තුවේ ලේඛනගත මෙහෙයුම් පරිසරය, අවම ලේඛන සහිත විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම උදෙසා ලේඛන පිළිබිඹු ඡායාස්ථානුගත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කඩදාසිමය ලියකියවිලි පරිහරණය සඳහා වැයවන කාලය, අවකාශය, පිරිවැය සහ මානව සම්පත අවම කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

1. දැනට පවතින ලියකියවිලි ඡායාගත කිරීම.

   (ප්‍රධාන ලිපිගොනු, ඩී ආකෘතිපත්‍ර, නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘති ලේඛන වාර්තා RR6, ජා.හැ. පිටපත).

2. ඡායාගත පිළිබිඹු ගබඩා කිරීම. සහ අවශ්‍ය වූ විට බැලීම සඳහා වූ ඒකාබද්ධ ලේඛන

කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ දියත් කිරීම.

3. පිරික්සුම් ඡායාස්ථගත ලේඛන හා ලේඛන කළමනාකරණ පද්ධතිය දැනට පවත්නා සේ.අ.අ. පරිගණක පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම.

4. සී/සී3 පෝරම, ඞී පෝරම, RR6 පෝරම සහ ජාතික හැඳුනුම්පත්වල පිටපත් යනාදිය ලැබෙන අවස්ථාවේදීම ඡායා පිළිබිඹුවක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපනය කිරීම.

### 3.12 මහජනතාව දැනුවත් කිරීම

2012 වසරේ සම්බන්ධතා ගොඩනැංවීම තුළින් මහජනතාව දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමුඛත්වය ලබාදී තිබුණි. එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් මූලික වශයෙන් පවත්වන ලද්දේ විශාල සාමාජික සංඛ්‍යාවක් සහිත සේවා ආයතනවලය. තවද, මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සාමාජිකයන්, සේව්‍යයන්, රැකියා වෙළෙඳපොළට අලුතින් ඒකතුවන්නන්, කම්කරු නිලධාරීන්, ග්‍රාමීය බැංකු නිලධාරීන් හා පොදු මහජනතාවට ද අර්ථසාධක අරමුදල සම්බන්ධ කරුණු පිළිබඳව අවබෝධයක් ලබාදෙන ලදී.

2012 වසරේදී, ජංගම සේවා 12 ක්, සේවායෝජකයන් වෙනුවෙන් විවිධ ප්‍රදේශවලදී පවත්වන ලදී. ඒ අනුව, මෙම ජංගම සේවාවන් හෙන්ෆෝල්ඩ් වතු සමාගම, කුරුණෑගල මහ නගර සභාව, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය, මොරටුව වෛද්‍ය හා සමාජ සත්කාර දිනය, කොළඹ මානව සම්පත් සේවා සැපයීමේ ප්‍රදර්ශනය, කුරුණෑගල යුනිවෙලා පුද්ගලික සමාගම, ඇල්පිටිය ප්ලාන්ටේෂන් සමාගම, කොළඹ මාස් ස්ලිම්ටෙක්ස්, කටුනායක ඇක්වීව් ට්‍රේඩින් පුද්ගලික සමාගම සහ හැටන් මෙගා කැරියර් සහ ට්‍රේඩ් ෆෙයාර් යන ස්ථානවලදී පවත්වන ලදී.

ජංගම සේවාවන් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අදාළ ආයතනයන්හි ද සහභාගිත්වය ඇතිව පවත්වන ලදී. ඒ අනුව, ජංගම සේවාවන් ඔස්සේ පහත දැක්වෙන සේවාවන් ලබාදෙන ලදී.

- සාමාජිකයන් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම.
- සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සහ නම් සංශෝධනය කිරීම.
- සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම.
- කෙටි පණිවුඩ හා අන්තර්ජාලය හරහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කිරීම.
- සාමාජිකයන්ට උපදෙස් දීම.
- සේ.අ.අ. සාමාජිකයන්ට ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.
- සේ.අ.අ. සාමාජිකයන්ට උප්පැන්න සහතික, අනුමාන වයස් සහතික ලබාගැනීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කිරීම.

## සේවක අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය

(රු.)

| | සටහන | 2012 | | එකතුව | |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | 2012 | 2011 |
| පොලී ආදායම් | 1 | 90,904,169,498 | - | 90,904,169,498 | 84,673,560,227 |
| ලාභාංශ ආදායම් | 2 | 1,996,329,740 | - | 1,996,329,740 | 1,963,273,422 |
| උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ / (අලාභ) | 3 | 1,054,177,803 | - | 1,054,177,803 | 724,640,967 |
| ක්‍රමක්ෂය ලාභ | 4 | 27,791,502,310 | - | 27,791,502,310 | 28,726,516,148 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ / (අලාභ) | 5 | (387,735,742) | - | (387,735,742) | (267,206,331) |
| **ආයෝජන ආදායම්** | | **121,358,443,609** | **-** | **121,358,443,609** | **115,820,784,433** |
| වෙනත් ආදායම් | 6 | 50,575,946 | 4,050,764 | 54,626,710 | 222,327,067 |
| **මුළු දළ ආදායම** | | **121,409,019,555** | **4,050,764** | **121,413,070,320** | **116,043,111,500** |
| මුළු මෙහෙයුම් වියදම් | 7 | (537,351,390) | (410,355,553) | (947,706,943) | (785,747,131) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභය** | | **120,871,668,165** | **(406,304,789)** | **120,465,363,376** | **115,257,364,369** |
| අඩු කළා : ආදායම් බදු | | (8,636,643,180) | - | (8,636,643,180) | (8,055,297,870) |
| **වසර සඳහා ලාභය** | | **112,235,024,985** | **(406,304,789)** | **111,828,720,197** | **107,202,066,499** |
| එකතු කළා : පෙර වසරේ රඳවාගත් ලාභය | | | | 368,792,047 | 293,931,074 |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | **112,197,512,243** | **107,495,997,573** |
| අඩු කළා : ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී (වර්ෂය තුළ) | | | | (2,098,085,270) | (2,343,039,090) |
| එකතු/ (අඩු) කළා : ලාභ සමකිරීමේ සංචිත අරමුදලෙන් / (අරමුදලට) මාරු කිරීම | | | | 5,700,000,000 | (3,500,000,000) |
| 2012.12.31 දිනට සාමාජික ශේෂ සඳහා පොලිය 11.50% (2011-11.50%) | | | | (115,771,416,227) | (101,284,166,436) |
| **ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන ලද ශේෂය** | | | | **28,010,746** | **368,792,047** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

## සේවක අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(රු.)

| | සටහන | එකතුව | |
|---|---|---|---|
| | | 2012 | නැවත ප්‍රකාශිත 2011 |
| වසර සඳහා ලාභය | | 111,828,720,197 | 107,202,066,499 |
| **වෙනත් ආදායම් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම | 8 | (6,240,881,426) | (2,367,430,983) |
| **කාලපරිච්ඡේදය සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම** | | **105,587,838,770** | **104,834,635,516** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

# සේවක අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(රු.)

| | සටහන | 2012 | නැවත ප්‍රකාශිත 2011 | නැවත ප්‍රකාශිත 2010 |
|---|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ (ශුද්ධ පොත් අගයට) | 9 | **584,952,243** | **494,764,779** | **214,022,022** |
| **මූල්‍ය වත්කම්** | 10 | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 980,371,915,815 | 874,572,559,685 | 768,900,946,449 |
| රුපියල් ණය | | 23,100,000,000 | 23,100,000,000 | 40,921,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් | | 31,757,671,753 | - | 5,936,349,430 |
| ලැයිස්තුගත කොටස් | | 54,744,901,555 | 71,405,897,425 | 57,029,447,126 |
| ලැයිස්තුගත නොකළ කොටස් | | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 |
| සාංගමික ණයකර | | 7,981,853,041 | 9,237,746,504 | 6,285,997,690 |
| ප්‍රතිමිලදී ගැනීම් | | 3,106,900,000 | 2,802,100,000 | 1,357,000,000 |
| | | **1,105,543,867,164** | **985,598,928,614** | **884,911,365,695** |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | | 12,416,925 | 8,172,914 | 9,362,613 |
| ලැබිය යුතු පොලී | | 30,807,809,156 | 25,570,393,546 | 28,024,941,778 |
| ලැබිය යුතු දායක මුදල් | | 6,239,874,709 | 5,430,068,285 | 4,540,823,513 |
| වෙනත් ජංගම වත්කම්/ලැබිය යුතු මුදල් | 11 | 1,116,540,675 | 1,205,141,516 | 1,329,874,793 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12 | 2,377,212,886 | 2,025,632,477 | 1,310,405,686 |
| | | **40,553,854,350** | **34,239,408,738** | **35,215,408,383** |
| **අඩු කළා : ජංගම වගකීම්** | | | | |
| ණයහිමියෝ | 13 | 10,366,364 | 7,987,850 | 2,094,146,943 |
| උපචිත වියදම් | | 240,005,104 | 91,185,623 | 89,916,665 |
| වෙනත් ජංගම වගකීම් | 14 | 2,023,301,642 | 2,529,608,902 | 656,770,432 |
| | | **(2,273,673,110)** | **(2,628,782,375)** | **(2,840,834,040)** |
| **ශුද්ධ ජංගම වත්කම්** | | **38,280,181,241** | **31,610,626,363** | **32,374,574,343** |
| **මුළු ශුද්ධ වත්කම්** | | 1,144,409,000,648 | 1,017,704,319,756 | 917,499,962,060 |
| **නියෝජනය කරනු ලබන්නේ** | | | | |
| සාමාජික ශේෂ | 15 | 1,124,508,128,334 | 986,045,793,692 | 869,199,254,939 |
| සංචිත | 16 | 19,872,696,568 | 31,289,569,017 | 48,006,611,047 |
| රඳවාගත් ලාභ | | 28,010,746 | 368,792,047 | 293,931,074 |
| | | **19,900,707,314** | **31,658,361,064** | **48,300,542,121** |
| **අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම** | | **1,144,408,835,648** | **1,017,704,154,756** | **917,499,797,060** |
| ජංගම නොවන වගකීම් | | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 165,000 | 165,000 | 165,000 |
| **අරමුදලේ ශුද්ධ වටිනාකම හා ජංගම නොවන වගකීම්** | | **1,144,409,000,648** | **1,017,704,319,756** | **917,499,962,060** |

**මුදල් මණ්ඩලය වෙනුවෙන්**

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

(රු.)

| | සටහන | 2012 | | | නැවත ප්‍රකාශිත 2011 එකතුව |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | 2,025,632,477 | 47,595,217 | 2,073,227,694 | 1,472,933,961 |
| එකතු කළා : මුළු ලැබීම් | 17 | 157,088,616,231 | 579,247,017 | 157,667,863,248 | 151,435,387,103 |
| අඩු කළා : මුළු ගෙවීම් | 18 | 156,737,045,822 | 581,930,495 | 157,318,976,317 | 150,835,093,370 |
| වසර අවසාන මුදල් ශේෂය | | **2,377,212,886** | **44,911,739** | **2,422,114,625** | **2,073,227,694** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රු.)

| විස්තරය | 2012 | නැවත ප්‍රකාශිත 2011 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් :** | | |
| ආයෝජන මගින් ලද පොලී | 83,928,914,594 | 86,070,971,262 |
| භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර හා කොටස් වලින් ලද ප්‍රාග්ධන ලාභ | 1,054,177,803 | 724,640,967 |
| කොටස් වලින් ලද ලාභාංශ | 1,881,100,206 | 1,851,639,102 |
| අධිභාර | 50,736,975 | 113,160,172 |
| වෙනත් ආදායම් | 5,978,873 | 144,367,937 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | - | (2,429) |
| වියදම් ප්‍රතිපූර්ණය කිරීම් | - | (27,241,554) |
| අත්තිකාරම් | (1,702,500) | 25,136,334 |
| මෙහෙයුම් වියදම් | (645,754,880) | (623,094,532) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | (2,092,881,197) | (1,973,696,812) |
| **මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **84,180,569,874** | **86,305,880,447** |
| බදු ගෙවීම් | (18,918,362,215) | (13,571,791,103) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල්** | **65,262,207,659** | **72,734,089,343** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් :** | | |
| ආයෝජන | (487,822,962,364) | (467,249,516,811) |
| ආයෝජන කල්පිරීම් | 401,678,999,670 | 380,942,026,911 |
| ආයෝජන තුළින් උත්පාදනය කරන ලද මුදල් | (86,143,962,694) | (86,307,489,900) |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | **(191,775,238)** | **(224,968,474)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | **(86,335,737,932)** | **(86,532,458,374)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් :** | | |
| දායක මුදල් | 70,170,727,965 | 61,878,995,006 |
| පොදු තැන්පතු | 10,882,301 | (7,001,939) |
| ප්‍රතිලාභ ගෙවීම් | (48,711,597,845) | (47,310,802,028) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල්** | **21,470,012,421** | **14,561,191,039** |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ (අඩු) / වැඩි වීම්** | **396,482,148** | **762,822,008** |
| **වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ** | **2,025,632,477** | **1,310,405,686** |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපුම්වලට පෙර** | **2,422,124,625** | **2,073,227,694** |
| **ගැළපීම් : කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය** | **(44,911,739)** | **(47,595,217)** |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ** | **2,377,212,886** | **2,025,632,477** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

# සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශය

(රු.)

| 2012 | | | | | ආයෝජන කාණ්ඩය | සටහන් | නැවත ප්‍රකාශිත 2011 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුහුණත අගය | පිරිවැය | ක්‍රමක්ෂය අගය | වෙළෙඳපොළ අගය | පොත් අගය | | | මුහුණත අගය | පිරිවැය | ක්‍රමක්ෂය අගය | වෙළෙඳපොළ අගය | පොත් අගය |
| 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | රුපියල් ණය | 21 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 | 23,100,000,000 |
| 1,117,360,267,000 | 939,109,002,211 | 980,371,915,815 | 950,709,557,308 | 980,371,915,815 | භාණ්ඩාගාර බැඳුම්කර | 21 | 927,373,717,000 | 823,140,421,731 | 874,368,823,883 | 877,973,114,218 | 874,572,559,685 |
| 33,409,900,000 | 30,962,701,825 | 31,757,671,753 | 31,811,458,284 | 31,757,671,753 | භාණ්ඩාගාර බිල්පත් | 21 | - | - | - | - | - |
| 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 | 3,106,900,000 | ප්‍රතිවිකුණුම් | 22 | 2,802,100,000 | 2,802,100,000 | 2,802,100,000 | 2,802,100,000 | 2,802,100,000 |
| 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 | 5,316,930,000 | සාංගමික ණයකර | 21 | 6,152,500,000 | 6,152,500,000 | 6,152,500,000 | 6,152,500,000 | 6,152,500,000 |
| 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 | උකස් සුරැකුම්පත් | 21 | 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 | 500,000,000 |
| 2,493,372,496 | 1,942,880,973 | 2,164,923,041 | 2,164,923,041 | 2,164,923,041 | භාරකාර සහතිකපත් | 21 | 2,834,902,632 | 2,462,048,888 | 2,585,246,504 | 2,585,246,504 | 2,585,246,504 |
| - | 63,102,761,384 | 63,102,761,384 | 54,744,901,555 | 54,744,901,555 | ලැයිස්තුගත කොටස් | 19,20 | - | 73,948,947,927 | 73,948,947,927 | 71,405,897,425 | 71,405,897,425 |
| - | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 | ලැයිස්තුගත නොකළ කොටස් | 20 | - | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 | 4,480,625,000 |
| **1,185,287,369,496** | **1,071,621,801,393** | **1,113,901,726,993** | **1,075,935,295,188** | **1,105,543,867,164** | එකතුව | | **962,763,219,632** | **936,586,643,546** | **987,938,243,314** | **988,999,483,147** | **985,598,928,614** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

# සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජිකයන්ගේ හිමිකම / ධනය වෙනස්වීමේ ප්‍රකාශනය

(රු.)

| විස්තරය | සාමාජික ශේෂය | ගොඩනැගිලි සංචිත අරමුදල | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල | ලාභ සම කිරීමේ සංචිත අරමුදල | පොදු සංචිත අරමුදල | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභ | පොදු තැන්පතු ගිණුම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2010.12.31 දිනට ශේෂය | **868,895,015,717** | **3,157,000,000** | **350,000,000** | **20,000,000,000** | **6,650,000,000** | **-** | **293,931,075** | **304,239,221** | **899,650,186,013** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් | | | | | | (2,367,430,983) | | | (2,367,430,983) |
| 2011 වසරේ ශුද්ධ ලාභය | | | | | | | 107,202,066,499 | | 107,202,066,499 |
| ශුද්ධ දායක මුදල් | 15,520,078,603 | | | | | | | 42,458,714 | 15,562,537,317 |
| 2011 වසරේ සාමාජිකයන්ට ගෙවූ පොලී | | | | | | | (2,343,039,090) | | (2,343,039,090) |
| සාමාජික පොලී (2011 : 11.50%) | 101,284,166,436 | | | | | | (101,284,166,436) | | - |
| රඳවාගත් ලාභයෙන් මාරු කිරීම් | | | | 3,500,000,000 | | | (3,500,000,000) | | - |
| 2011.12.31 දිනට ශේෂය | **985,699,260,756** | **3,157,000,000** | **350,000,000** | **23,500,000,000** | **6,650,000,000** | **(2,367,430,983)** | **368,792,048** | **346,697,935** | **1,017,704,319,756** |
| පෙර වසරේ ගැළපීම් | | | | | | | | | - |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් | | | | | | (6,240,881,426) | | | (6,240,881,426) |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් ලාභයට මාරු කිරීම | | | | | | 524,008,977 | | | 524,008,977 |
| 2012 වසරේ ශුද්ධ ලාභය | | | | | | . | 111,828,720,196 | (5,020,172) | 111,823,700,024 |
| ශුද්ධ දායක මුදල් | 22,695,773,588 | | | | | | | | 22,695,773,588 |
| 2012 වසරේ සාමාජිකයන්ට ගෙවූ පොලී | | | | | | | (2,098,085,270) | | (2,098,085,270) |
| සාමාජික පොලී (2012 : 11.50%) | 115,771,416,227 | | | | | | (115,771,416,227) | | - |
| රඳවාගත් ලාභය මාරු කිරීම් | | | | (5,700,000,000) | | | 5,700,000,000 | | - |
| 2012.12.31 දිනට ශේෂය | **1,124,166,450,571** | **3,157,000,000** | **350,000,000** | **17,800,000,000** | **6,650,000,000** | **(8,084,303,432)** | **28,010,747** | **341,677,763** | **1,144,408,835,648** |

**මුදල් මණ්ඩලය වෙනුවෙන්**

සහතික කළේ :

කේ. ගුණතිලක
වැඩබලන අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

සකස් කළේ :

ජී. බී. එම්. පී. දිසානායක
සහකාර අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 18/02/2013

# සේවක අර්ථසාධක අරමුදල
# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ ආයතනය හා ව්‍යවස්ථාපිත පදනම

සේවක අර්ථසාධක අරමුදල (''සේ.අ.අ.'' හෝ ''අරමුදල'') යනු 1958 අංක 15 දරණ සේ.අ.අ. පනත මගින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා වෙළෙඳ අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය අරමුදලක් වූ දායකත්ව විශ්‍රාම ක්‍රමය වේ. අරමුදලේ පොදු පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස්වරයා සතු වන අතර, අරමුදලේ භාරකරු ලෙස වගකීම දරණුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වේ.

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ 5 (1) (ඌ) සහ (එ) වගන්ති යටතේ, මුදල් මණ්ඩලය විසින් අරමුදලට අදාළ පොදු ගිණුම් පවත්වාගෙන යාම සහ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ.

- අ. ආදායම් හා වියදම් ප්‍රකාශය
- ආ. වත්කම් හා වගකීම් ප්‍රකාශය
- ඇ. ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය හා
- ඈ. එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශය.

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1. පිළියෙල කිරීමේ පදනම

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. අරමුදලේ මූල්‍ය වාර්තා වෙනත් ලෙසකින් දක්වා නොමැති විට ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

### 2.2. අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුවය. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය මගින් නිකුත් කරන ලද අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හා බොහෝ සෙයින් ගැළපේ.

### 2.3. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මෙම නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ක්‍රියාත්මක වන දිනය වන්නේ 2012 ජනවාරි 1 දින සිට වන බැවින් ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, ක්‍රම සහ ඉදිරිපත් කිරීම් වෙනස් කර හෝ වැඩි දියුණු කර ඇති අතර සැලකිය යුතු වෙනස්කම් පහත දක්වා ඇත. එම වෙනස්කම හැර, අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වසර හා සමාන වේ.

### 2.4. ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගත තත්ත්වයන් පිළිබඳව ඇස්තමේන්තු හා උපකල්පන අවශ්‍ය වේ. තිබෙන තොරතුරු යොදා ගැනීම සහ විනිශ්චයන් භාවිතා කිරීම

ඇස්තමේන්තු කිරීමේ දී ආවේණික වේ. ඇස්තමේන්තු භාවිතා කර පිළියෙල කරන ලද මූල්‍ය තොරතුරු අනාගතයේ සත්‍ය ප්‍රතිඵල වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වන්නේ මූල්‍ය වත්කම් තක්සේරු කිරීම, වත්කම් හානිකරණය, දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම, විලම්භිත බදු, වත්කම් හා වගකීම සඳහා වෙන් කිරීම් වේ.

### 2.5. අඛණ්ඩ පැවැත්ම

අරමුදල සතුව සසම්භාවි අනාගතයකට අවශ්‍ය වන සම්පත් පවතින බැවින්, අඛණ්ඩ පැවැත්මක් පිළිබඳව සෑහීමකට පත්ව ඇත. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කර ඇත.

### 2.6. ශේෂ පත්‍ර දිනට පසු සිදු විම හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමේ දී ශේෂ පත්‍ර දිනට පසු සිදුවූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා ඇත. සියළුම දැනගැනීමට ඇති වගකීම් සඳහා වෙන්කිරීම් සිදුකර ඇත.

## 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

### 3.1. මූල්‍ය වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

#### 3.1.1. මූල්‍ය වත්කම් හඳුනාගැනීම හා ඇගයීම

අරමුදල මූල්‍ය උපකරණයක් හා සම්බන්ධ ගිවිසුමක එක් පාර්ශ්වකරුවකු බවට පත්වූවිට පමණක් මූල්‍ය වත්කමක් හඳුනාගන ලබයි. මූල්‍ය වත්කම් යන්නට මූලිකව අඩංගු වන්නේ කල් පිරෙන තෙක් තබාගෙන ඇති ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයකට සුරැකුම්පත්, ණය සහ ලැබිය යුතු මුදල් සහ විකිණීමට ඇති ආයෝජයන්ය. සියළුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ අගයෙහි වටිනාකමට හුවමාරු වූ නිසා පිරිවැයට හඳුනාගනු ලබන අතර, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හැර අනෙකුත් ඒවාට අදාළ ගණුදෙණුවේ පිරිවැය සහ අත්කර ගැනීමට අදාළ වියදම් එකතු කරනු ලැබේ.

මූල්‍ය වත්කම්වල වර්ගීකරණය හා පසු අගය කිරීමේ පදනම් පහත පරිදි වේ.

**(අ) කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන**

කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලබන්නේ කල් පිරෙන තුරු තබා ගැනීමට අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරීමක් ඇති මූල්‍ය වත්කම් වේ. කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන පසුව අගය කරනු ලබන්නේ අඩු කළ සඵල පොලී අනුපාතිකය භාවිතයෙන් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත වේ. මෙම ආයෝජන අත්පත්කර ගැනීමේ දී වන අධි මිල සහ වට්ටම්, සඵල පොලී අනුපාතය ගණනයේ දී යොදා ගනු ලැබේ. කල් පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන හානිකරණය හෝ පොත් වලින් ඉවත් කිරීමක් මත වන ලාභ හා අලාභ, ආදායම් ප්‍රකාශයේ ගළපනු ලැබේ.

**(ආ) ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම් සහ මූලිකව හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට නම් කළ වත්කම්, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට සුරැකුම් පත් යටතේ වර්ගීකරණය කරනු ලැබේ. අදාළ වන ගණුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනේ.

ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට සුරැකුම්පත් පසුව අගය කරනු ලබන්නේ වෙළෙඳපොළ වටිනාකමක් අගවනු ලබන සාධාරණ අගයටය. වෙළෙඳපොළ අගයන්ගේ වෙනස්වීම් සුරැකුම්පත්වල වටිනාකම ඉහළ හෝ පහළ යාමක් ලෙස හඳුනාගන්නා අතර, එමගින් වන ශුද්ධ ලාභය සහ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

**(ඇ) ණය හා ලැබිය යුතු මුදල්**

සක්‍රිය වෙළඳපොළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත සේ.අ.අ. ට ලැබිය යුතු දෑ ණය හා ලැබිය යුතු මුදල් යටතේ වර්ගීකරණය කරයි. නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් (ප්‍රති විකිණුම්) ද ණය හා ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කෙරේ. ණය හා ලැබිය යුතු මුදල් පසුව අගය කිරීම කරනුයේ සඵල පොලී ක්‍රමය යටතේ ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණයක් අලාභ අඩු කිරීමෙන් වේ.

**(ඈ) විකිණීමට ඇති මුල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට වර්ගීකරණය නොකරන ලද කොටස් ආයෝජන, ඉහත වර්ග තුන යටතේ වර්ගීකරණය නොකරණ ලද ණය උපකරණ සහ මූලික අත්පත් කර ගැනීමේදී විකිණීමට ඇති ආයෝජන ලෙස නම් කරන ලද සුරැකුම්පත්, විකිණීමට ඇති මුල්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීමට ඇති වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ අගය මත තවදුරටත් අගය කරනු ලැබේ. මෙම වත්කම්හි සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගන්නා අතර එම වත්කම් විකුණන තෙක් හෝ හානිකරණය වන තෙක් ප්‍රත්‍යාගණන සංචිත යොදා සාමාජිකයන්ගේ ධනය යටතේ සමුච්චිත කරනු ලැබේ.

විකිණීමට ඇති මූල්‍ය වත්කම් හානිකරණය ධාරණ පිරිවැය හා වර්තමාන සාධාරණ අගය අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ ගළපනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම්පත්වල පොලී ආදායම සඵල පොලී අනුපාත ක්‍රමයට හඳුනා ගනු ලැබේ. ලාභාංශ ලැබීමට හිමිකම් ලද විට ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**3.1.2. මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම ශේෂ පත්‍ර දිනකදීම මූල්‍ය වත්කමක් හානිකරණය වූවාද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික තිබේ දැයි තක්සේරු කළ යුතුය. හානිකරණ අලාභ හඳුනා ගනු ලබන්නේ මුල්‍ය වත්කම මුල් වශයෙන් හඳුනා ගැනීමෙන් පසු සිදු වූ (පාඩු ගෙනදෙන) එක් සිද්ධියක් සිද්ධි වැඩි ගණනකදී ප්‍රතිඵලයක් ලෙස හානිය සිදුවූ බවට විෂය මූලික සාක්ෂි තිබේනම් ද හා එම සිද්ධිය (සිද්ධි) ඇස්තමේන්තු කිරීමට හැකි වන්නාවූ මූල්‍ය වත්කමෙහි පාඩු ගෙන දෙන හෝ විශ්වාසනීය අන්දමට ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ගලා ඒම් කෙරෙහි තද බලපෑමක් කෙරේනම් පමණි.

නිකුත් කරන්නාගේ සැලකිය යුතු කරිමේ මූල්‍ය දුෂ්කරතා, පැහැරහැරීම්, බුන්වත් වීම් සහ අනෙකුත් මූල්‍ය ආපදා වැනි ගිවිසුම් කඩකිරීම් සුරැකුම්පතෙහි පිරිවැය ආවරණය කරගත නොහැකි වන අන්දමේ වෙළෙඳපොළ තත්ත්වයෙහි සැලකිය යුතු වෙනස්වීම් පිළිබඳව තොරතුරු ද සුරැකුම්පත් හානිකරණය වූ බවට විෂය මූලික සාක්ෂි වේ. වත්කමක සාධාරණ අගය සැලකිය යුතු හෝ දිගින් දිගට එහි පිරිවැයට වඩා පහත වැටීමක් හැනිකරණය සඳහා වූ විෂය මූලික සාක්ෂියක් වේ. සැලකිය යුතු ද යන්න ඇගයීමේ දී මූලික හඳුනාගැනීමේ දී වත්කමෙහි මූලික පිරිවැය, එහි සාධාරණ අගයෙහි පහළ යාම සමඟ සසඳා බැලේ. දිගින් දිගට යන්න ඇගයීමේ දී වත්කමේ මූලික හඳුනාගැනීමේ දී එහි මූලික පිරිවැයට වඩා සාධාරණ අගය පහළ ගිය කාල පරිච්ඡේදය, එහි පහළ යාම හා සසඳා බැලේ.

### 3.1.3. මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත් හැරීම

වත්කම් වලින් වන මුදල් ප්‍රවාහයක් සඳහා වූ ගිවිසුම්ගත අයිතිය කල් ඉකුත් වීමෙන් හෝ අරමුදල විසින් මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය පැවරීම මගින් මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත් හැරීම කළයුතු වන්නේය. තවද,

- ප්‍රමාණාත්මක ලෙස අයිතියට අදාළ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම

  හෝ,

- අරමුදල ප්‍රමාණාත්මක ලෙස සියළුම අවදානම් සහ ප්‍රතිලාභ රඳවා නොගත් සේම පැවරීම ද නොකළ නමුත්, පාලනය රඳවා නොගත් විට ද මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත් හරියි.

### 3.2. අනෙකුත් වත්කම්

### 3.2.1. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් හා සමුච්චිත හානිකරණය අඩුකර ඇති වටිනාකමටය. දේපළ, පිරියත හා උපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමයට පහත දක්වා ඇති අනුපාත යටතේ ඇස්තමේන්තුගත ජීවකාලය පුරා ක්ෂය ප්‍රතිපාදන කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 02% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෝටර් රථ | 20% |
| පරිගණක උපාංග | 50% |

දේපළ, පිරියත උපකරණවල ධාරණ අගය ආපසු අයකරගත නොහැකි බවට ඇඟවෙන සාධක දක්වන සිදුවීම් හා වෙනස්වීම් දැක්වෙන විට දී එම ධාරණ අගයන් හානිකරණය මගින් නැවත සමාලෝචනය කරනු ලබයි.

තවද, දේපළ, පිරියත හා උපකරණ විකිණීම හෝ එය පාවච්චියෙන් හෝ විකිණීමෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ රහිත වීම මත හඳුනා ගැනීම අත් හැරීමෙන් කිසියම් ලාභයක් හෝ අලාභයක් වේ නම් එය හඳුනා ගැනීම අත් හැරි වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

### 3.2.2. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගයන්හි අවශ්‍යම කොටසක් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලබන අතර, ඒවා පිරිවැයට හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ඒවා පිරිවැයෙන් අවු.2 එළදායී ජීව කාලය මත පදනම් වූ සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ අගයට ඉදිරියට ගෙන යනු ලබයි.

### 3.2.3. තොග

තොග පවත්වාගෙන යනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට වේ. මන්දගාමීව සංචලනය වන තොග සඳහා දීමනා වෙන් කරනු ලබයි.

### 3.2.4. ලැබිය යුතු මුදල්

ලැබිය යුතු මුදල් විෂය මූලික සාක්ෂි මත පදනම් වූ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු අපේක්ෂිත උපලබ්ධි අගය මත ඉදිරියට ගෙන යනු ලබයි.

### 3.2.5. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම මූල්‍ය කාලපරිච්ඡේදයකම අවසානයේදී අරමුදල විසින් මූල්‍ය නොවන වත්කම් හානිකරණය වීමක් පිළිබඳ සංඥාවක් ලැබෙන වෙනස්වීමක් සිදුවී ඇති විට හෝ සිදුවීමක් වූ බවට තක්සේරු කරනු ලබයි. එවැනි සංඥාවක් දැනටමත් පවතී නම් ආපසු අයකර ගත හැකි අගය පිළිබඳ මූල්‍ය ඇස්තමේන්තුවක් අරමුදල විසින් කරනු ලබයි. එම ආපසු අයකරගත හැකි අගයට වඩා (ධාරණ අගය) වැඩි නම්, එම වත්කම හානිකරණය වූ බවට සලකා ආපසු අයකර ගත හැකි අගය දක්වා ලියාහරිනු ලැබේ.

## 3.3. වගකීම්

### 3.3.1. හිමිකම් නොපෑ ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ට හෝ අර්ථලාභීන්ට ලබා දුන් නමුත් විවිධ හේතු මත ආපසු එවූ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ වසරකට වඩා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ නැවත ලබා දෙනතුරු හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට බැර කරන ලදී.

### 3.3.2. රඳවාගත් ප්‍රතිලාභ

රඳවාගත් ප්‍රතිලාභ යටතේ දක්වා ඇති අගයන් කම්කරු කොමසාරිස්වරයාගේ උපදෙස් මත රඳවාගත් ප්‍රතිලාභ වන අතර, ඔහු විසින් නැවත ඉල්ලා සිටි විට නිදහස් කරනු ලබයි. මෙවැනි බැර කිරීම් එම ගිණුමේ පවත්වාගෙන යනු ලබන්නේ එක් ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා පමණි.

### 3.3.3. ඌණ සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම්

ඌණ සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් ගිණුමේ ශේෂයෙන් පෙන්වන්නේ කොටස් වශයෙන් කළ ප්‍රතිලාභ ගෙවීම් වේ.

### 3.3.4. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අරමුදලට ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක සහ එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභවලින් යුත් සම්පත් පිටතට ගලායෑම අවශ්‍ය වීම භව්‍ය වන විටෙක සහ බැඳීමේ ප්‍රමාණයෙහි විශ්වාසදායී ඇස්තමේන්තුවක් කළහැකි විටෙක ප්‍රතිපාදන හඳුනාගනී.

### 3.3.5. වගකීම් හඳුනාගැනීම අත් හැරීම

මූල්‍ය වගකීම් හඳුනාගැනීම අත් හරිනු ලබන්නේ එහි පැවැත්ම අහෝසි වන තත්ත්වයට පත් වූ විට වේ. එනම්, ගිවිසුමේ නිශ්චය කර ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීමෙන්, අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුවය.

### 3.4. ආදායම් හා වියදම්

අරමුදලට ආර්ථික ලාභ ගලා එන බවට සම්භාවිතාවක් ඇත්නම් සහ ආදායම් විශ්වාසනීය ලෙස අගය කළ හැකි තරමට පමණක් ආදායම් හඳුනා ගනු ලැබේ. වියදම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබන්නේ දරන ලද වියදම හා නිශ්චිත ආදායම් අයිතමයන්ගේ ඉපැයුම අතර ඍජු සම්බන්ධතාවය මත පදනම්ව වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය විසින් අරමුදල කළමනාකරණය වෙනුවෙන් දරණ ලද සියළුම වියදම් අරමුදලෙහි වියදම් ලෙස අය කරනු ලබයි.

ආදායම් හා වියදම් හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත නිර්ණායකයන් සලකා බලනු ලැබේ.

#### 3.4.1. පොලී ආදායම්

ගැණුම් මිලෙන් හානිකරණ අලාභ අඩු කල අගය පදනම් කරගත් සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් උපචිත පදනම මත සියළු පොලී දරණ උපකරණ සඳහා ආදායම් ප්‍රකාශය තුල පොලී ආදායම් හඳුනාගනී. පොලී ආදායම තුළ පොලී අනුපාතික ආදායම් හා උපකරණවල වට්ටම් හා අධි මිල මත ක්‍රමක්ෂය මත වන ඕනෑම ලාභ හෝ අලාභ ඇතුළත්ය.

#### 3.4.2. ලාභාංශ

අරමුදලට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත.

#### 3.4.3. සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම් තුළ අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාදක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශයේ සියළුම කාර්ය මණ්ඩල සඳහා වැය වූ වියදම් වේ. අරමුදල විසින් වෙන් වූ විශ්‍රාම අරමුදලක් හෝ වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් පවත්වාගෙන නොයයි.

#### 3.4.4. ආදායම් බදු

ආදායම් බදු ගණනය කරනු ලබන්නේ ආයෝජන ආදායම් මත ගෙවිය යුතු බදු ප්‍රමාණය අනුවය. අරමුදලේ ආදායම් බදු වගකීම පොලී, ලාභාංශ හා ශුද්ධ අධිහාර ලෙස ලැබෙන දළ ආදායමෙන් 10% ක් වේ. දේශීය ආදායම් බදු පනතට අනුව භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ කොටස් ආයෝජනයෙන් ලැබෙන ප්‍රාග්ධන ලාභ බදු වගකීමෙන් නිදහස් කොට ඇත.

සේවක අර්ථසාධක අරමුදල 2006.09.01 දින සිට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල් පත් ආයෝජන කළඹ, බදු පසු බර තැබූ සාමාන්‍ය පිරිවැයට අගය කරන බැවින් ක්‍රමක්ෂය ලාභද බදු පසු ශුද්ධ අගය මත සටහන් වේ.

ඒ අනුව, ක්‍රමක්ෂය ලාභ හා බදු වියදම පිළිබඳ සාධාරණ අදහසක් ලබා ගැනීම සඳහා වසර තුල ඉපැයූ ආදායම මත රඳවා ගැනීමේ බදු වියදම ක්‍රමක්ෂය ලාභ ගිණුමට නැවත එකතු කර ඇත.

**3.5. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

සේ.අ.අ. විස්තීරණ ආදායම් හා වෙනත් විස්තීරණ ආදායම් පෙන්නුම් කිරීම සඳහා වෙන් වූ ආදායම් ප්‍රකාශ 2 ක් පිළියෙල කරයි.

**3.6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුගමනය කරමින් සෘජු ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලබයි. මුදල් හා මුදල් සමාන දෑ යන්නට අගය වෙනස්වීම් සම්බන්ධවෙන් නොසැලකිය හැකි තරමේ අවදානමකට භාජනය වන නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කළහැකි කෙටිකාලීන ඉතා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජනයන් ඇතුලත් වේ.

**3.7. ලැබීම් හා ගෙවීම් ගිණුම**

ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය තුළින් වර්ෂය තුළ මුදලින් වූ සියළුම ලැබීම් හා ගෙවීම් නිරූපණය කරයි.

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට අදාළ සටහන්

### 1. පොලී ආදායම්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ශ්‍රී ලංකා රුපියල් ණය වලින් ලද පොලී | 2,247,000,000 | | 2,247,000,000 | 4,494,276,925 |
| කෙටිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලද පොලී | 80,152,862 | | 80,152,862 | 331,607,898 |
| දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලද පොලී | 86,097,955,986 | | 86,097,955,986 | 78,762,365,063 |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොලී | 1,178,685,268 | | 1,178,685,268 | 32,650,569 |
| ප්‍රති විකුණුම් වලින් ලද පොලී | 251,193,811 | | 251,193,811 | 255,799,221 |
| ලැයිස්තුගත ණයකර වලින් ලද පොලී | 46,569,389 | | 46,569,389 | 2,375,616 |
| ලැයිස්තුගත නොවන ණයකර වලින් ලද පොලී | 662,751,480 | | 662,751,480 | 600,461,482 |
| භාරකාර සහතිකවල ආයෝජනයෙන් ලද පොලී | 282,160,702 | | 282,160,702 | 134,090,026 |
| උකස් සුරැකුම්පත්වල ආයෝජනයෙන් ලද පොලී | 57,700,000 | | 57,700,000 | 59,933,425 |
| **පොලී ආදායම** | **90,904,169,498** | **-** | **90,904,169,498** | **84,673,560,227** |

### 2. ලාභාංශ ආදායම

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ලැයිස්තුගත සාමාන්‍ය කොටස් වලින් ලද ලාභාංශ ආදායම | 1,629,666,874 | | 1,629,666,874 | 1,272,355,918 |
| ලැයිස්තුගත නොවන සාමාන්‍ය කොටස් වලින් ලද ලාභාංශ ආදායම | 216,457,386 | | 216,457,386 | 541,002,841 |
| ලැයිස්තුගත නොවන වරණීය කොටස් වලින් ලද ලාභාංශ ආදායම | 150,205,480 | | 150,205,480 | 149,914,664 |
| **ලාභාංශ ආදායම** | **1,996,329,740** | **-** | **1,996,329,740** | **1,963,273,422** |

### 3. උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ / (පාඩු)

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ප්‍රාග්ධන ලාභ / (පාඩු) - භාණ්ඩාගාර බැඳුම්කර කෙටිකාලීන | - | | - | 9,645,477 |
| ප්‍රාග්ධන ලාභ / (පාඩු) - භාණ්ඩාගාර බැඳුම්කර දිගුකාලීන | 33,897,943 | | 33,897,943 | - |
| ප්‍රාග්ධන ලාභ / (පාඩු) - සාමාන්‍ය කොටස් විකුණුම් - කෙටිකාලීන | 14,897,563 | | 14,897,563 | 110,294,560 |
| ප්‍රාග්ධන ලාභ / (පාඩු) - සාමාන්‍ය කොටස් විකුණුම් - දිගුකාලීන | 1,005,382,297 | | 1,005,382,297 | 604,700,930 |
| **ප්‍රාග්ධන ලාභ** | **1,054,177,803** | **-** | **1,054,177,803** | **724,640,967** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට අදාළ සටහන්

### 4. ක්‍රමක්ෂය ලාභ

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ක්‍රමක්ෂය ලාභ / (පාඩු) - භාණ්ඩාගාර බැඳුම්කර - දිගුකාලීන | 27,791,502,310 | | 27,791,502,310 | 28,726,516,148 |
| **ක්‍රමක්ෂය ලාභ** | **27,791,502,310** | **-** | **27,791,502,310** | **28,726,516,148** |

### 5. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ආදායම

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ලාභ / (පාඩු) වෙළෙඳපොළ මිලට අගය කිරීම - කොටස් | (117,619,396) | | (117,619,396) | (174,077,469) |
| ලාභ / (පාඩු) වෙළෙඳපොළ මිලට අගය කිරීම - භාණ්ඩාගාර බැඳුම්කර | (270,116,346) | | (270,116,346) | (93,128,863) |
| **ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ආදායම** | **(387,735,742)** | **-** | **(387,735,742)** | **(267,206,331)** |

### 6. වෙනත් ආදායම්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| අධිභාර | 50,537,962 | | 50,537,962 | 112,961,262 |
| බැඳුම්කර ණයට දීමෙන් ලත් පොලී | - | | - | 105,483,513 |
| මුද්දර විකුණුම් | 1,500 | | 1,500 | 700 |
| වෙනත් ආදායම් | 36,484 | 4,050,764 | 4,087,248 | 3,881,592 |
| **වෙනත් ආදායම්** | **50,575,946** | **4,050,764** | **54,626,710** | **222,327,067** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට අදාළ සටහන්

7. මුළු මෙහෙයුම් වියදම්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | 2011 එකතුව |
| සේවක පිරිවැය | 287,634,732 | 226,584,331 | 514,219,063 | 416,968,530 |
| පරිපාලන පිරිවැය | 224,536,256 | 171,722,601 | 396,258,857 | 334,782,316 |
| වෙනත් වියදම් | 25,180,402 | 12,048,621 | 37,229,023 | 33,996,285 |
| **මෙහෙයුම් වියදම්** | **537,351,390** | **410,355,553** | **947,706,943** | **785,747,131** |

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනයට අදාළ සටහන්

8. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | 2011 එකතුව |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගය මත ලාභ/(අලාභ) ලැයිස්තුගත කොටස් | (6,240,881,426) | | (6,240,881,426) | (2,367,430,983) |
| **විකිණීම ඇති මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභය/(අලාභය)** | **(6,240,881,426)** | **-** | **(6,240,881,426)** | **(2,367,430,983)** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාළ සටහන්

### 9. දේපළ, පිරියත හා උපකරණ

(රු.)

| වත්කම් කාණ්ඩය | පිරිවැය | | සමුච්චිත ක්ෂය | | ශුද්ධ පොත් අගය | | 2012 එකතුව | 2011 එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | 439,147,335 | - | 3,598,214 | - | 435,549,121 | 435,549,121 | 338,380,011 |
| පරිගණක උපකරණ | 61,513,395 | 337,505,839 | 56,024,358 | 296,248,251 | 5,489,038 | 41,257,588 | 46,746,626 | 70,744,287 |
| කාර්යාලයීය ගෘහ භාණ්ඩ | 22,137,387 | 31,201,056 | 10,851,610 | 24,271,314 | 11,285,777 | 6,929,742 | 18,215,519 | 12,451,259 |
| කාර්යාලයීය උපකරණ | 7,774,434 | 209,392,820 | 5,656,125 | 203,077,835 | 2,118,309 | 6,314,985 | 8,433,295 | 17,112,077 |
| රථවාහන | - | 97,202,274 | - | 46,474,514 | - | 50,727,761 | 50,727,761 | 54,971,632 |
| පරිගණක මෘදුකාංග | 22,595,880 | - | 22,160,385 | - | 435,495 | - | 435,495 | 1,059,883 |
| අනෙකුත් වත්කම් | 2,567,354 | 24,489,427 | 1,860,251 | 352,104 | 707,103 | 24,137,323 | 24,844,426 | 45,632 |
| **එකතුව** | **116,588,451** | **1,138,938,751** | **96,552,728** | **574,022,231** | **20,035,723** | **564,916,520** | **584,952,243** | **494,764,779** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අදාළ සටහන්

### 10. මූල්‍ය වත්කම්

(රු.)

| | ලාභ/අලාභ තුලින් සාධාරණ අගයට වත්කම් | විකිණීම ඇති වත්කම් | කල්පිරීම තෙක් තබාගෙන ඇති වත්කම් | ණය මුදල් සහ ලැබිය යුතු මුදල් | 2012 එකතුව | 2011 එකතුව |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | - | - | 980,371,915,815 | - | 980,371,915,815 | 874,572,559,685 |
| රුපියල් ණය | - | - | 23,100,000,000 | - | 23,100,000,000 | 23,100,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් | - | - | 31,757,671,753 | - | 31,757,671,753 | - |
| ලැයිස්තුගත සාමාන්‍ය කොටස් | 147,603,472 | 54,597,298,083 | - | - | 54,744,901,555 | 71,405,897,425 |
| ලැයිස්තුගත නොවන සාමාන්‍ය කොටස් | - | 4,480,625,000 | - | - | 4,480,625,000 | 4,480,625,000 |
| සාංගමික ණයකර | - | - | 7,981,853,041 | - | 7,981,853,041 | 9,237,746,504 |
| ප්‍රතිවිකුණුම් | - | - | - | 3,106,900,000 | 3,106,900,000 | 2,802,100,000 |
| **එකතුව** | **147,603,472** | **59,077,923,083** | **1,043,211,440,609** | **3,106,900,000** | **1,105,543,867,164** | **985,598,928,614** |

### 11. වෙනත් ජංගම වත්කම් / ලැබිය යුතු ශේෂයන්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ලැබිය යුතු ලාභාංශ | 45,575,786 | - | 45,575,786 | 54,151,458 |
| අනෙකුත් ලැබිය යුතු ශේෂයන් | 1,736,722 | - | 1,736,722 | 1,736,722 |
| ප්‍රභවයේ දී ගෙවූ බදු | 544,646,451 | - | 544,646,451 | 674,911,772 |
| පෙර ගෙවීම් | 12,773,071 | 1,369,555 | 14,142,626 | 4,516,822 |
| වෙනත් ජංගම වත්කම් | 111,750,020 | 1,404,179 | 113,154,199 | 112,228,600 |
| කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ගිණුම | - | 397,800,922 | 397,800,922 | 358,112,173 |
| ආරම්භක ශේෂ සැසඳුම් ගිණුම - ආයෝජන | (516,031) | - | (516,031) | (516,031) |
| **එකතුව** | **715,966,019** | **400,574,656** | **1,116,540,675** | **1,205,141,516** |

# සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාළ සටහන්

### 12. මුදල් හා මුදල් සමාන වත්කම්

(රු.)

| | මුදල් මණ්ඩලය | |
|---|---|---|
| | 2012 | 2011 |
| ලංකා බැංකු ප්‍රධාන ගිණුම | 2,259,151,459 | 1,896,481,559 |
| ලංකා බැංකු බදු ගෙවිය යුතු ගිණුම ** | (6,276,289) | 4,810,964 |
| ලංකා බැංකු 7 ගිණුම ** | (12,867,942) | (13,220,160) |
| ලංකා බැංකු 6 ගිණුම | 33,052 | 33,053 |
| මහජන බැංකුව | 130,385,237 | 129,834,703 |
| SLIPS - ගිණුම | 6,777,369 | 6,777,369 |
| RTGS - ගිණුම | - | 909,141 |
| සුළු මුදල් අග්‍රිමය | 10,000 | 5,850 |
| **එකතුව** | **2,377,212,886** | **2,025,632,477** |

සටහන ** : මුදල් පොතේ බැංකු ශේෂය අයිරාවක් ලෙස පෙන්නුම් කළ ද සත්‍ය වශයෙන්ම වාසිදායක තත්ත්වයක් පවතී.

### 13. ණයහිමියෝ

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| සැපයුම්කරු - දේශීය | 9,328,828 | | 9,328,828 | 6,950,314 |
| රඳවාගත් මුදල් - ස්ථාවර වත්කම් | 343,752 | | 343,752 | 343,752 |
| විවිධ ණයහිමියෝ | 693,784 | | 693,784 | 693,784 |
| **එකතුව** | **10,366,364** | **-** | **10,366,364** | **7,987,850** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අදාළ සටහන්

### 14. වෙනත් ජංගම වගකීම්

(රු.)

| | 2012 | | | 2011 එකතුව |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | |
| ගෙවිය යුතු දායක මුදල් - සේ.අ.අ. | 30,040 | 1,320,018 | 1,350,058 | 1,350,058 |
| ගෙවිය යුතු දායක මුදල් - සේ.නි.භා.අ. | (172) | - | (172) | (172) |
| ගෙවිය යුතු ගිණුම් - ලිපි ද්‍රව්‍ය | (2,448,747) | - | (2,448,747) | 112,763 |
| ගෙවිය යුතු ගිණුම් - සේවා | 71,787 | - | 71,787 | 66,967 |
| ගෙවිය යුතු ගිණුම් - නිවාස ණය පැහැර හැරීම් | 2,095,000,000 | - | 2,095,000,000 | 1,975,000,000 |
| ගෙවිය යුතු ගිණුම් - වෙනත් | (3,870) | - | (3,870) | (3,870) |
| ගෙවිය යුතු ගිණුම් - ප්‍රතිලාභ | 34,890,774 | - | 34,890,774 | 503,036,227 |
| බදු | (138,321,959) | - | (138,321,959) | 50,698,449 |
| ගෙවිය යුතු ගිණුම් - ආයෝජන | 32,763,772 | - | 32,763,772 | (651,519) |
| **එකතුව** | **2,021,981,624** | **1,320,018** | **2,023,301,642** | **2,529,608,902** |

### 15. සාමාජික ශේෂ

(රු.)

| | 2012.01.01 දිනට ශේෂය | වසර තුළ හර කිරීම් | වසර තුළ බැර කිරීම් | 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ජංගම වර්ෂයේ දායක මුදල් - අංක 1 ගිණුම | 63,921,057,569 | 242,566,139,375 | 211,995,438,064 | 33,350,356,258 |
| ගිණුම්ගත දායක මුදල් - අංක 2 ගිණුම | 808,976,211,833 | 44,028,140,042 | 199,645,027,991 | 964,593,099,782 |
| කම්කරු කොමසාරිස්ගේ දායක මුදල් - අංක 1 ගිණුම | 4,671,769,511 | 1,637,162,951 | 2,374,655,520 | 5,409,262,080 |
| ඌණ හා අතිරික්ත දායක ගිණුම | 1,187,649,767 | 260,148,413 | 498,282,002 | 1,425,783,355 |
| දායක මුදල් අංක 96 - 1997/98 දායක මුදල් ලැබීම් | 193,376 | - | - | 193,376 |
| දායක මුදල් රැස්කිරීමේ ගිණුම | 1,404,446 | 140,637,096,733 | 140,642,971,413 | 7,279,126 |
| ශ්‍රී ලංගම - දායක මුදල් ගිණුම | - | - | 126,513,344 | 126,513,344 |
| හිමිකම් නොපෑ ප්‍රතිලාභ | 120,476,636 | 179,656,251 | 184,505,578 | 125,325,963 |
| රඳවාගත් ප්‍රතිලාභ | 13,160,612 | 2,969,345 | 23,947,385 | 34,138,653 |
| ඌණ හා අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් | (268,279,574) | 309,458,809 | 241,705,009 | (336,033,374) |
| පොදු තැන්පතු ගිණුම | 346,697,934 | 29,314,265 | 24,294,093 | 341,677,762 |
| ගෙවිය යුතු පොලී | 107,075,451,582 | 103,426,560,460 | 115,781,640,886 | 119,430,532,008 |
| **එකතුව** | **986,045,793,692** | **533,076,646,645** | **671,538,981,286** | **1,124,508,128,334** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාළ සටහන්

## 16. සංචිත

(රු.)

| | 2012.01.01 දිනට ශේෂය | වසර තුළ මාරු කිරීම් | 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ගොඩනැගිලි සංචිත අරමුදල | 3,157,000,000 | - | 3,157,000,000 |
| තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල | 350,000,000 | - | 350,000,000 |
| ආයෝජන ප්‍රත්‍යාගණන සංචිතය | (2,367,430,983) | (5,716,872,449) | (8,084,303,432) |
| ලාභ සමකිරීමේ සංචිත අරමුදල | 23,500,000,000 | (5,700,000,000) | 17,800,000,000 |
| පොදු සංචිත අරමුදල | 6,650,000,000 | - | 6,650,000,000 |
| එකතුව | **31,289,569,017** | **(11,416,872,449)** | **19,872,696,568** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාළ සටහන්

## 17. ලැබීම්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| දායක මුදල් | 70,170,727,965 | - | 70,170,727,965 | 61,878,995,006 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපූර්ණය කරන ලද වියදම් | - | 540,764,959 | 540,764,959 | 539,843,822 |
| අග්‍රිම ගිණුම (කම්කරු කොමසාරිස්) | - | 26,378,261 | 26,378,261 | 15,953,319 |
| පොදු තැන්පතු ගිණුම - (සේ.අ.අ. දායකත්වය) | - | 6,071,044 | 6,071,044 | 134,598,703 |
| ආදායම් - ආයෝජන පොලී | 83,928,914,594 | - | 83,928,914,594 | 86,070,971,262 |
| අඩු කිරීම් - ආදායම් බදු | - | - | - | - |
| අධිභාර | 50,537,962 | 199,013 | 50,736,975 | 113,160,172 |
| භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලාභ | 33,897,943 | - | 33,897,943 | 9,645,477 |
| කොටස් වලින් ලත් ප්‍රාග්ධන ලාභ | 1,020,279,860 | - | 1,020,279,860 | 714,995,490 |
| ලාභාංශ | 1,881,100,206 | - | 1,881,100,206 | 1,851,639,102 |
| විවිධ ආදායම් | 145,133 | 5,833,740 | 5,978,873 | 114,456,749 |
| ණයගැතියෝ | - | - | - | (2,429) |
| අතිතිකාරම් පියවීම් | 241,972 | - | 241,972 | 1,175,261 |
| හිමිකම් නොපෑ ප්‍රතිලාභ | 2,770,596 | - | 2,770,596 | (10,044,829) |
| එකතුව | **157,088,616,231** | **579,247,017** | **157,667,863,248** | **151,435,387,103** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාළ සටහන්

18. ගෙවීම්

(රු.)

| | 2012 | | | 2011 |
|---|---|---|---|---|
| | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| ප්‍රතිලාභ ගෙවීම් | 48,404,961,062 | - | 48,404,961,062 | 47,172,086,633 |
| ආයෝජන | 487,822,962,364 | - | 487,822,962,364 | 467,249,516,811 |
| අඩු කළා : ආයෝජන කල්පිරීම් | (401,678,999,670) | - | (401,678,999,670) | (380,942,026,911) |
| | **86,143,962,695** | **-** | **86,143,962,695** | **86,307,489,900** |
| ආයෝජන මත රඳවා ගැනීමේ බදු ගෙවීම් | 18,918,362,215 | - | 18,918,362,215 | 13,571,791,103 |
| මෙහෙයුම් වියදම් | 316,727,158 | 329,027,721 | 645,754,880 | 623,094,532 |
| ණය හිමියන්ට ගෙවීම් | 2,096,846,977 | - | 2,096,846,977 | 1,973,696,812 |
| ගෙවූ ප්‍රතිලාභ මත රඳවාගත් ආදායම් බදු | (3,965,780) | - | (3,965,780) | - |
| මෙහෙයුම් වියදම් ප්‍රතිපූර්ණය කිරීම් (කම්කරු කොමසාරිස්) | 540,764,959 | - | 540,764,959 | 516,662,149 |
| ඌණ/අතිරික්ත ගෙවීම් - ප්‍රතිලාභ | 309,407,379 | - | 309,407,379 | 128,670,566 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 8,034,685 | 183,740,553 | 191,775,238 | 224,968,474 |
| අත්තිකාරම් - සේවකයන් සඳහා | 86,500 | - | 86,500 | 44,000 |
| - විවිධ | 1,857,972 | - | 1,857,972 | 12,460,284 |
| පොදු තැන්පතු ගිණුම (සේ.අ.අ. දායකත්වය) | - | 21,567,004 | 21,567,004 | 304,128,917 |
| ගැළපීම් : වර්ෂය ආරම්භයේ මුදල් ශේෂය - කම්කරු දෙපාර්තමේන්තුව | - | 47,595,217 | 47,595,217 | - |
| එකතුව | **156,737,045,822** | **581,930,495** | **157,318,976,317** | **150,835,093,370** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

## 19. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් කොටස්

(රු.)

| ව්‍යාපාර වස්තු | පිරිවැය | පොත් අගය/වෙළෙඳපොළ අගය |
|---|---|---|
| ඒ.සී.එල්. ප්ලාස්ටික්ස් පී.එල්.සී. | 7,053,195 | 6,113,880 |
| බොගවන්තලාව ටී ස්ටේට්ස් පී.එල්.සී. | 1,050,584 | 486,009 |
| සී.ඩබ්. මැකී පී.එල්.සී. | 9,058,348 | 6,978,660 |
| චෙමනෙක්ස් පී.එල්.සී. | 68,990 | 37,500 |
| ශ්‍රී ලංකා කැපිටල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 524,500 | 251,760 |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 79,817,621 | 78,049,839 |
| කෑගල්ල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 24,733,977 | 12,719,200 |
| මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පි.එල්.සී. (ඡන්ද හිමි) | 8,782,890 | 3,722,400 |
| මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පි.එල්.සී. (නිෂ්ඡන්ද) | 3,100,739 | 1,522,400 |
| පාම් ගාර්ඩින්ස් හොටෙල් පී.එල්.සී. | 54,108,598 | 37,604,000 |
| සීගිරිය විලේජ් පී.එල්.සී. | 13,279 | 21,824 |
| ටී ස්මෝල් හෝල්ඩර්ස් ෆැක්ටරීස් පී.එල්.සී. | 136,949 | 96,000 |
| **එකතුව** | **188,449,670** | **147,603,472** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

## 20. විකිණීම සඳහා ඇති වත්කම්

(රු.)

| ව්‍යාපාර වස්තුව | පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|
| ලැයිතුගත කොටස් | | |
| ඒ.සී.එල්. කේබල්ස් පී.එල්.සී. | 162,879,449 | 227,796,228 |
| එයිට්කන් ස්පෙන්ස් පී.එල්.සී. | 494,336,252 | 547,327,560 |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් පී.එල්.සී. | 1,590,089,511 | 2,172,893,845 |
| අමායා ලෙෂර් පී.එල්.සී. | 340,028,021 | 388,142,076 |
| ඒෂියන් හොටෙල්ස් පී.එල්.සී. | 1,642,728,376 | 1,599,892,457 |
| ආසිරි සර්ජිකල් පී.එල්.සී. | 1,680,649 | 2,211,075 |
| බ්‍රවුන් සහ සමාගම පී.එල්.සී. | 1,769,404,852 | 821,746,145 |
| බුකිට් දාරා පී.එල්.සී. | 1,532,917,150 | 1,203,136,308 |
| සි.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී. - (නිඡ්ඡන්ද) | 192,174,270 | 134,527,313 |
| සි.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී. - (ඡන්ද හිමි) | 449,805,454 | 247,640,905 |
| කාර්ගිල්ස් (සිලෝන්) පී.එල්.සී. | 1,364,040,065 | 1,062,772,158 |
| කාසන්ස් කම්බර්බැච් පී.එල්.සී. | 1,632,133,647 | 1,461,577,482 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | 1,745,813,840 | 1,063,063,052 |
| සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පී.එල්.සී. | 27,026,584 | 152,300,000 |
| සිලෝන් ග්ලාස් සමාගම පී.එල්.සී. | 515,527,586 | 516,328,116 |
| සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පී.එල්.සී. | 1,005,584,993 | 318,357,666 |
| සිලෝන් හොස්පිට්ල්ස් පී.එල්.සී. (නිඡ්ඡන්ද) | 25,410,556 | 77,342,857 |
| සිලෝන් හොටෙල්ස් කෝපරේෂන් පී.එල්.සී. | 711,242,903 | 468,278,142 |
| සිලෝන් තියටර්ස් පී.එල්.සී. | 954,596,027 | 751,761,160 |
| චෙව්රොන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී. | 249,263,948 | 516,022,332 |
| කොළඹ නැව් තටාකාංගනය පී.එල්.සී. | 2,571,844,873 | 2,385,457,760 |
| කොමර්ෂල් බැංකුව පී.එල්.සී. | 7,795,536,650 | 7,688,040,304 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පී.එල්.සී. | 3,395,967,521 | 2,751,259,536 |
| ඩීසල් ඇන්ඩ් මෝටර් ඉන්ජිනියරින් පී.එල්.සී. | 1,265,738,355 | 739,192,745 |
| ඩයලොග් ටෙලිකොම් පී.එල්.සී. | 1,660,339,146 | 1,472,943,805 |
| ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පී.එල්.සී. | 888,569,146 | 860,228,160 |
| ඊඩන් හොටෙල්ස් පී.එල්.සී. | 213,341,783 | 175,632,900 |
| ගලධාරී පී.එල්.සී. | 810,321,610 | 336,713,240 |
| හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. | 4,956,264,453 | 4,504,618,576 |
| හේකාබ් පී.එල්.සී. | 212,329,485 | 217,982,427 |
| හේලීස් පී.එල්.සී. | 455,629,302 | 551,118,372 |
| හේලීස් එම්.ජී.ටී. පී.එල්.සී. | 199,555,228 | 47,133,120 |
| හේමාස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 607,825,728 | 735,996,294 |
| හොටෙල් සර්විසස් පී.එල්.සී. | 485,792,684 | 317,872,806 |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 2,849,118 | 2,163,388 |
| ජෝන් කීල්ස් හොටෙල්ස් පී.එල්.සී. | 934,672,605 | 846,248,554 |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන් (ඉතිරිය)

(රු.)

| ව්‍යාපාර වස්තුව | පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|
| ලංකා අයි.ඕ.සී. පී.එල්.සී. | 343,034,360 | 182,794,950 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම පී.එල්.සී. | 1,600,934,230 | 807,627,469 |
| ලංකා ටයිල්ස් පී.එල්.සී. | 429,782,093 | 341,614,130 |
| ලංකා වෝල්ටයිල්ස් පී.එල්.සී. | 74,559,013 | 85,188,704 |
| ලාෆ් ගෑස් පී.එල්.සී. (නිෂ්ඡන්ද) | 706,343,981 | 330,155,790 |
| ලාෆ් ගෑස් පී.එල්.සී. (ඡන්ද) | 2,684,119,965 | 1,482,183,680 |
| ලයිට් හවුස් හොටෙල් පී.එල්.සී. | 309,422,269 | 270,002,880 |
| මැක්වුඩ් එනර්ජි පී.එල්.සී. | 19,999,000 | 18,856,200 |
| ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී. | 1,399,456,780 | 2,180,233,199 |
| නවලෝක හොස්පිට්ල්ස් පී.එල්.සී. | 3,325,079 | 2,354,400 |
| නෙස්ට්ලේ ලංකා පී.එල්.සී. | 30,752,320 | 225,958,300 |
| ඔවර්සීස් රියලිටි පී.එල්.සී. | 665,633,871 | 611,019,230 |
| පීපල්ස් ලීසිං සමාගම පී.එල්.සී. | 1,088,967,972 | 816,875,268 |
| රයිගම් වයඹ සෝල්ටන් පී.එල්.සී. | 120,691,019 | 70,394,500 |
| රිචර්ඩ් පීරිස් සහ සමාගම පී.එල්.සී. | 1,432,247,818 | 1,070,014,756 |
| රෝයල් සෙරමික්ස් ලංකා පී.එල්.සී. | 992,601,477 | 892,778,238 |
| සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 133,137,480 | 78,812,450 |
| සම්පත් බැංකුව පී.එල්.සී. | 2,543,773,960 | 3,200,601,951 |
| සෙලාන් බැංකුව පී.එල්.සී. (නිෂ්ඡන්ද) | 589,754,755 | 575,617,501 |
| සෙලාන් බැංකුව පී.එල්.සී. (ඡන්ද හිමි) | 1,045,623,871 | 895,520,864 |
| සියෙරා කේබල්ස් පී.එල්.සී. | 30,564,660 | 19,471,277 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | 680,232,420 | 931,963,011 |
| ටාජ් සමුද්‍රා හොටෙල් පී.එල්.සී. | 319,203,353 | 198,928,608 |
| ටැන්ජරින් බීච් හොටෙල්ස් පී.එල්.සී. | 127,441,267 | 108,785,702 |
| ටෙක්ස්වර්ඩ් ජර්සි ලංකා පී.එල්.සී. | 203,802,870 | 122,937,480 |
| ද ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | 205,489,613 | 96,223,680 |
| ටෝකියෝ සිමෙන්ට් පී.එල්.සී. (නිෂ්ඡන්ද) | 292,059,585 | 187,967,351 |
| ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පී.එල්.සී. | 263,154,670 | 317,918,800 |
| වැලිබල් වන් පී.එල්.සී. | 1,714,940,146 | 1,108,778,850 |
| **උප එකතුව** | **62,914,311,714** | **54,597,298,083** |
| | | |
| ලැයිස්තුගත නොවන | | |
| ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | **625,000** | **625,000** |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් | 500,000,000 | 500,000,000 |
| ශ්‍රී ලංකන් කේටරින්ග් (15% වරණීය) | 1,005,000,000 | 1,005,000,000 |
| වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | 2,975,000,000 | 2,975,000,000 |
| **උප එකතුව** | **4,480,625,000** | **4,480,625,000** |
| | | |
| **එකතුව** | **67,394,936,714** | **59,077,923,083** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

21. කල් පිරීම තෙක් තබාගෙන ඇති

ශ්‍රී ලංකා රුපියල් ණය

(රු.)

| සුරැකුම්පත් | මුහුණත අගය | පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|
| 2009-2015 9.50% | 19,600,000,000 | 19,600,000,000 | 19,600,000,000 |
| 2009-2015 A 11.00% | 3,500,000,000 | 3,500,000,000 | 3,500,000,000 |
| එකතුව | **23,100,000,000** | **23,100,000,000** | **23,100,000,000** |

භාණ්ඩාගාර බැඳුම්කර

(රු.)

| කාණ්ඩ | මුහුණත අගය | ක්‍රමක්ෂය කළ පිරිවැය | මිලදී ගැනීමේ පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|---|
| 07.00%2023A | 55,308,500,000 | 45,737,288,777 | 45,147,558,132 | 37,739,920,901 |
| 07.50%2013A | 33,145,000,000 | 32,258,055,879 | 26,453,903,950 | 32,484,221,280 |
| 07.50%2013B | 31,775,000,000 | 30,236,412,379 | 23,529,313,357 | 30,888,223,300 |
| 07.50%2018A | 43,491,700,000 | 39,237,624,125 | 38,566,204,923 | 35,756,570,680 |
| 08.50%2013A | 28,507,000,000 | 28,443,744,734 | 23,257,151,164 | 28,480,146,406 |
| 08.50%2013B | 28,209,000,000 | 27,751,668,640 | 24,395,481,090 | 27,861,944,673 |
| 08.50%2018A | 40,032,500,000 | 34,166,577,912 | 32,133,609,540 | 35,000,815,075 |
| 10.50%2013A | 34,525,000,000 | 34,137,561,841 | 29,097,167,230 | 34,502,420,650 |
| 11.75 % 2014B | 31,408,200,000 | 31,276,286,220 | 30,914,832,089 | 31,424,940,571 |
| 13.50%2013A | 14,014,000,000 | 13,993,700,912 | 13,484,855,614 | 14,045,195,164 |
| 11.75%2015A | 30,120,500,000 | 29,848,326,410 | 29,456,891,067 | 30,082,126,483 |
| 11.50% 2013A | 27,752,100,000 | 27,905,322,798 | 28,643,370,687 | 27,877,150,963 |
| 08.50%2019A | 54,196,700,000 | 51,295,289,311 | 50,845,502,745 | 45,614,273,178 |
| 11.00% 2015A | 11,339,100,000 | 11,309,051,777 | 11,266,133,227 | 11,113,644,675 |
| 11.25% 2014A | 11,395,100,000 | 11,348,592,577 | 11,258,154,587 | 11,320,177,218 |
| 11.00% 2015B | 33,104,500,000 | 33,938,125,035 | 34,618,149,855 | 32,365,177,202 |
| 07.00%2014A | 21,074,000,000 | 20,440,877,342 | 19,252,629,619 | 20,024,894,132 |
| 7.25%2016A | 10,551,200,000 | 9,921,603,054 | 9,577,812,378 | 9,207,230,349 |
| 6.40%2016A | 29,873,700,000 | 27,159,145,183 | 25,782,898,323 | 25,087,694,270 |
| 6.50%2015A | 12,028,500,000 | 11,323,799,959 | 10,899,850,573 | 10,638,534,654 |
| 06.20%2020A | 64,320,167,000 | 52,403,632,207 | 51,016,767,094 | 45,560,868,694 |
| 6.60%2014A | 3,242,000,000 | 3,170,952,489 | 3,047,022,878 | 3,071,649,110 |
| 06.60%2014B | 42,804,000,000 | 41,865,651,070 | 40,719,042,814 | 40,010,525,352 |
| 06.75%2013A | 4,746,000,000 | 4,708,970,609 | 4,614,713,442 | 4,614,521,562 |
| 06.60%2014A | 16,401,000,000 | 16,119,886,189 | 15,674,072,255 | 15,539,209,455 |
| 06.50%2015A | 7,052,000,000 | 6,695,031,185 | 6,474,427,100 | 6,237,099,088 |
| 06.20%2015A | 8,929,000,000 | 8,598,591,074 | 8,335,119,509 | 8,032,108,737 |
| 07.25%2016A | 25,184,400,000 | 23,990,075,707 | 23,564,143,018 | 21,976,511,866 |
| 08.50%2018B | 44,706,900,000 | 40,089,991,302 | 39,611,489,778 | 38,722,657,901 |
| 08.50%2019A | 20,881,000,000 | 20,377,173,737 | 20,273,229,415 | 17,574,347,483 |
| 05.80%2017A | 19,426,300,000 | 17,409,255,946 | 16,822,073,655 | 15,709,038,642 |
| 05.35%2026A | 58,208,900,000 | 27,884,843,245 | 27,615,541,757 | 31,440,547,784 |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන් (ඉතිරිය)

(රු.)

| කාණ්ඩ | මුහුණත අගය | ක්‍රමක්ෂය කළ පිරිවැය | මිලදී ගැනීමේ පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|---|
| 06.40%2016A | 800,000,000 | 746,754,134 | 727,493,329 | 671,833,600 |
| 05.80%2017B | 21,468,800,000 | 18,851,190,563 | 18,323,632,673 | 17,009,837,584 |
| 05.65%2019A | 3,000,000,000 | 2,282,456,962 | 2,213,813,000 | 2,180,691,000 |
| 06.40%2016B | 4,300,000,000 | 3,689,713,953 | 3,606,863,000 | 3,594,249,600 |
| 08.00%2022A | 39,445,100,000 | 29,587,708,510 | 29,161,548,590 | 30,319,397,225 |
| 08.00%2017A | 24,052,400,000 | 22,107,944,956 | 21,766,524,740 | 21,080,677,875 |
| 06.20%2015B | 3,000,000,000 | 2,682,800,503 | 2,598,424,000 | 2,653,758,000 |
| 08.00%2032A | 60,099,000,000 | 34,662,268,627 | 34,545,718,061 | 39,992,518,956 |
| 08.00%2016A | 12,265,600,000 | 11,185,483,304 | 10,994,883,802 | 10,813,586,006 |
| 05.80%2017A | 3,268,500,000 | 2,629,743,218 | 2,541,190,345 | 2,643,065,988 |
| 08.00%2016B | 4,223,300,000 | 3,766,011,350 | 3,688,439,039 | 3,751,189,963 |
| 08.00%2019A | 12,256,700,000 | 9,327,609,088 | 9,160,793,769 | 9,811,733,484 |
| 09.00%2014A | 2,000,000,000 | 1,924,041,855 | 1,896,106,000 | 1,917,586,000 |
| 08.50%2015A | 2,000,000,000 | 1,853,835,723 | 1,822,164,000 | 1,835,000,000 |
| 08.00%2017B | 8,229,000,000 | 6,598,894,735 | 6,468,446,595 | 7,296,078,270 |
| 08.00%2020A | 9,225,000,000 | 6,588,692,186 | 6,487,112,250 | 7,322,721,975 |
| 08.00%2022A | 7,973,900,000 | 5,329,871,316 | 5,265,330,154 | 6,129,122,287 |
| 08.00%2018A | 2,000,000,000 | 1,513,785,207 | 1,491,406,000 | 1,682,122,000 |
| එකතුව | **1,117,360,267,000** | **980,371,915,815** | **939,109,002,211** | **950,709,557,308** |

භාණ්ඩාගාර බිල්පත්

(රු.)

| අයිතමය | මුහුණත අගය | ක්‍රමක්ෂය කළ පිරිවැය | මිලදී ගැනීමේ පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|---|
| 358D | 1,665,000,000 | 1,630,960,656 | 1,500,323,175 | 1,637,610,750 |
| 147D | 1,574,700,000 | 1,572,669,130 | 1,500,065,519 | 1,571,824,598 |
| 182D | 4,250,000,000 | 4,128,484,934 | 3,998,684,750 | 4,144,068,750 |
| 179D | 6,366,400,000 | 6,186,242,688 | 5,999,943,650 | 6,207,717,480 |
| 361D | 3,382,900,000 | 3,096,507,622 | 2,999,982,783 | 3,098,340,601 |
| 364D | 627,400,000 | 567,010,957 | 556,946,117 | 568,420,008 |
| 358D | 3,370,500,000 | 3,062,028,601 | 2,999,920,266 | 3,053,649,407 |
| 182D | 1,000,000,000 | 959,410,000 | 943,174,000 | 965,603,000 |
| 182D | 2,000,000,000 | 1,923,491,297 | 1,886,792,000 | 1,931,206,000 |
| 182D | 1,000,000,000 | 954,862,330 | 942,951,000 | 955,959,000 |
| 182D | 1,500,000,000 | 1,423,111,747 | 1,418,641,500 | 1,417,048,500 |
| 361D | 1,673,000,000 | 1,500,522,065 | 1,500,522,065 | 1,480,215,191 |
| 182D | 5,000,000,000 | 4,752,369,725 | 4,714,755,000 | 4,779,795,000 |
| එකතුව | **33,409,900,000** | **31,757,671,753** | **30,962,701,825** | **31,811,458,284** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන් (ඉතිරිය)

සාංගමික ණයකර සහ වෙනත් ආයෝජන

(රු.)

| උපකරණය | මුහුණත අගය | මිලදී ගැනීමේ පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|
| සාංගමික ණයකර | | | |
| එච්.ඩී.එෆ්.සී. ණයකර | 195,000,000 | 195,000,000 | 195,000,000 |
| එස්.එම්.අයි.බී ණයකර | 195,000,000 | 195,000,000 | 195,000,000 |
| ලංකා බැංකු ණයකර | 300,000,000 | 300,000,000 | 300,000,000 |
| ලංකා බැංකු ණයකර | 200,000,000 | 200,000,000 | 200,000,000 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම් ණයකර | 500,000,000 | 500,000,000 | 500,000,000 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකු ණයකර | 1,000,000,000 | 1,000,000,000 | 1,000,000,000 |
| ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව | 500,000,000 | 500,000,000 | 500,000,000 |
| හැටන් නැෂනල් බැංකු ණයකර | 2,000,000,000 | 2,000,000,000 | 2,000,000,000 |
| එම්.බී.එස්.එල්. ණයකර | 162,500,000 | 162,500,000 | 162,500,000 |
| පැන් ඒෂියා බැංකු ණයකර | 250,000,000 | 250,000,000 | 250,000,000 |
| සම්පත් බැංකු ණයකර | 14,430,000 | 14,430,000 | 14,430,000 |
| උප එකතුව | **5,316,930,000** | **5,316,930,000** | **5,316,930,000** |
| | | | |
| උකස් සුරැකුම් ආයෝජන | | | |
| එන්.ඩී.බී. උකස් සුරැකුම් ණයකර | 500,000,000 | 500,000,000 | 500,000,000 |
| උප එකතුව | **500,000,000** | **500,000,000** | **500,000,000** |
| | | | |
| භාරකාර සහතිකපත් | | | |
| කොමර්ෂල් ලීසිං | 94,632,546 | 73,433,744 | 93,643,748 |
| එල්.බී.ෆිනෑන්ස් | 487,622,564 | 388,700,000 | 451,281,154 |
| පීපල්ස් ලීසිං | 1,823,690,555 | 1,404,247,229 | 1,533,788,738 |
| සෙංකඩගල ෆිනෑන්ස් | 87,426,830 | 76,500,000 | 86,209,401 |
| උප එකතුව | **2,493,372,496** | **1,942,880,973** | **2,164,923,041** |
| එකතුව | **8,310,302,496** | **7,759,810,973** | **7,981,853,041** |

| කල් පිරීම තෙක් තබා ගෙන ඇති ආයෝජන | වටිනාකම (රු.) |
|---|---|
| ශ්‍රී ලංකා රුපියල් ණය | 23,100,000,000 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 980,371,915,815 |
| භාණ්ඩාගාර බිල්පත් | 31,757,671,753 |
| සාංගමික ණයකර සහ වෙනත් ආයෝජන | 7,981,853,041 |
| එකතුව | **1,043,211,440,608** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

## 22. ණය හා ලැබිය යුතු දෑ
### ප්‍රතිවිකුණුම්

(රු.)

| ව්‍යාපාර සහකරු | අනුපාතය | මුහුණත අගය | පිරිවැය | වෙළෙඳපොළ අගය |
|---|---|---|---|---|
| වෙල්ත් ට්‍රස්ට් සිකියුරිටීස් ලිමිටඩ් | 9.05 | 300,000,000 | 300,000,000 | 300,000,000 |
| නෙට් වෙල්ත් සිකියුරිටීස් ලිමිටඩ් | 9.05 | 289,000,000 | 289,000,000 | 289,000,000 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 9.05 | 1,347,000,000 | 1,347,000,000 | 1,347,000,000 |
| එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් | 9.05 | 650,900,000 | 650,900,000 | 650,900,000 |
| ලංකා බැංකුව | 7.92 | 520,000,000 | 520,000,000 | 520,000,000 |
| එකතුව | | **3,106,900,000** | **3,106,900,000** | **3,106,900,000** |

# සේවක අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

### 23. (i) දිගුකාලීන ආයෝජනයන්හි වෙනස්වීම්

(රු.)

| ආයෝජන වර්ගය | අනුපාතිකය | ආරම්භක ශේෂය | ආයෝජන | කල්පිරීම් | විකුණුම් | මාරු කිරීම් | ක්‍රමක්ෂය/ ප්‍රත්‍යාගණනය | අවසාන ශේෂය | 2012 % | 2011 % | වෙනස්වීම් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | | | | | | | | |
| | 5.35 | 1,748,012,042 | 25,877,757,207 | - | - | - | 259,073,996 | 27,884,843,245 | 2.6 | 0.2 | 2.4 |
| | 5.65 | 831,822,355 | 1,387,204,000 | - | - | - | 63,430,607 | 2,282,456,962 | 0.2 | 0.1 | 0.1 |
| | 5.80 | 33,122,592,745 | 4,847,125,345 | - | - | - | 920,471,636 | 38,890,189,726 | 3.6 | 3.4 | 0.3 |
| | 6.20 | 52,014,560,068 | 10,475,898,680 | - | - | - | 1,194,565,036 | 63,685,023,784 | 5.9 | 5.3 | 0.6 |
| | 6.40 | 29,364,866,657 | 1,526,628,000 | - | - | - | 704,118,613 | 31,595,613,270 | 3.0 | 3.0 | (0.0) |
| | 6.50 | 17,090,428,530 | 85,983,500 | - | - | 499,155,600 | 343,263,513 | 18,018,831,143 | 1.7 | 1.7 | (0.1) |
| | 6.60 | 60,249,502,474 | - | - | - | - | 906,987,274 | 61,156,489,748 | 5.7 | 6.1 | (0.4) |
| | 6.75 | 4,658,807,628 | - | - | - | - | 50,162,981 | 4,708,970,609 | 0.4 | 0.5 | (0.0) |
| | 6.85 | 83,022,307,022 | - | 82,371,450,000 | 3,402,632,058 | - | 2,751,775,036 | - | - | 8.5 | (8.5) |
| | 7.00 | 59,212,562,123 | 5,998,351,582 | - | - | - | 967,252,414 | 66,178,166,120 | 6.2 | 6.0 | 0.1 |
| | 7.25 | 28,400,596,017 | 5,061,995,309 | - | - | - | 449,087,435 | 33,911,678,761 | 3.2 | 2.9 | 0.3 |
| | 7.50 | 86,307,305,920 | 11,905,947,641 | - | - | - | 3,518,838,822 | 101,732,092,384 | 9.5 | 8.8 | 0.7 |
| | 8.00 | - | 129,030,203,001 | - | - | - | 1,638,066,277 | 130,668,269,278 | 12.2 | | 12.2 |
| | 8.50 | 139,083,207,363 | 61,177,067,639 | - | - | - | 3,718,006,358 | 203,978,281,360 | 19.1 | 14.2 | 4.9 |
| | 9.00 | - | 1,896,106,000 | - | - | - | 27,935,855 | 1,924,041,855 | 0.2 | - | 0.2 |
| | 10.50 | 32,759,105,135 | - | - | - | - | 1,378,456,706 | 34,137,561,841 | 3.2 | 3.3 | (0.1) |
| | 11.00 | 43,234,488,070 | 2,264,044,011 | - | - | - | (251,355,269) | 45,247,176,812 | 4.2 | 4.4 | (0.2) |
| | 11.25 | 9,356,009,978 | 1,959,445,279 | - | - | - | 33,137,320 | 11,348,592,577 | 1.1 | 1.0 | 0.1 |
| | 11.50 | 28,209,259,432 | - | - | - | - | (303,936,634) | 27,905,322,798 | 2.6 | 2.9 | (0.3) |
| | 11.75 | 58,535,721,481 | 50,190,471 | - | - | 2,371,483,044 | 167,217,633 | 61,124,612,630 | 5.7 | 6.0 | (0.3) |
| | 13.50 | 70,753,782,190 | - | 57,671,000,000 | - | - | 910,918,722 | 13,993,700,912 | 1.3 | 7.2 | (5.9) |
| | 14.50 | **33,476,867,464** | **-** | **33,522,000,000** | **-** | **-** | **45,132,536** | **-** | **-** | **3.4** | **(3.4)** |
| උප එකතුව | | **871,431,804,695** | **263,543,947,664** | **173,564,450,000** | **3,402,632,058** | **2,870,638,644** | **19,492,606,869** | **980,371,915,815** | **91.6** | **88.9** | **2.7** |
| රුපියල් ණය | | | | | | | | | | | |
| | 9.50 | 19,600,000,000 | - | - | - | - | - | 19,600,000,000 | 1.8 | 2.0 | 0.2 |
| | 11.00 | 3,500,000,000 | - | - | - | - | - | 3,500,000,000 | 0.3 | 0.4 | 0.1 |
| උප එකතුව | | **23,100,000,000** | **-** | **-** | **-** | | **-** | **23,100,000,000** | **2.2** | **2.4** | **(0.2)** |
| සාංගමික ණයකර | | | | | | | | | | | |
| එච්.ඩී.එෆ්.සී. බැංකු ණයකර | | 195,000,000 | - | - | - | - | - | 195,000,000 | 0.0 | 0.0 | (0.0) |
| එස්.එම්.අයි.බී. ණයකර | | 195,000,000 | - | - | - | - | - | 195,000,000 | 0.0 | 0.0 | (0.0) |
| එයිට්කන් ස්පෙන්ස් ණයකර | | 100,000,000 | - | 100,000,000 | - | - | - | - | - | 0.0 | (0.0) |
| සම්පත් බැංකු ණයකර | | 250,000,000 | - | 250,000,000 | - | - | - | - | - | 0.0 | (0.0) |
| සම්පත් බැංකු ණයකර | | 250,000,000 | - | 250,000,000 | - | - | - | - | - | 0.0 | (0.0) |
| ඩී.එෆ්.සී.සී. ණයකර | | 500,000,000 | - | 500,000,000 | - | - | - | - | - | - | - |
| ලංකා බැංකු ණයකර | | 300,000,000 | - | - | - | - | - | 300,000,000 | 0.0 | 0.0 | (0.0) |
| ලංකා බැංකු ණයකර | | 200,000,000 | - | - | - | - | - | 200,000,000 | 0.0 | 0.0 | (0.0) |

# සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන් (ඉතිරිය)

(රු.)

| ආයෝජන වර්ගය | අනුපාතිකය | ආරම්භක ශේෂය | ආයෝජන | කල්පිරීම් | විකුණුම් | මාරු කිරීම් | ක්‍රමක්ෂය/ ප්‍රත්‍යාගණනය | අවසාන ශේෂය | 2012 % | 2011 % | වෙනස්වීම් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම් ණයකර | | 500,000,000 | - | - | - | - | - | 500,000,000 | 0.0 | 0.1 | (0.0) |
| එන්.ටී.බී. ණයකර | | 1,000,000,000 | - | - | - | - | - | 1,000,000,000 | 0.1 | 0.1 | (0.0) |
| ඩී.එෆ්.සී.සී.වර්ධන බැංකු ණයකර | | 500,000,000 | - | - | - | - | - | 500,000,000 | 0.0 | 0.1 | (0.0) |
| එච්.එන්.බී. ණයකර | | 2,000,000,000 | - | - | - | - | - | 2,000,000,000 | 0.2 | 0.2 | (0.0) |
| **එම්.බී.එස්.එල්. ණයකර** | | **162,500,000** | **-** | **-** | **-** | **-** | **-** | **162,500,000** | **0.0** | **0.0** | **(0.0)** |
| පැන් ඒෂියා බැංකු ණයකර | | - | 250,000,000 | - | - | - | - | 250,000,000 | 0.0 | - | 0.0 |
| සම්පත් බැංකු ණයකර | | - | 14,430,000 | - | - | - | - | 14,430,000 | 0.0 | - | 0.0 |
| **උප එකතුව** | | **6,152,500,000** | **264,430,000.00** | **1,100,000,000** | **-** | | **-** | **5,316,930,000** | **0.5** | **0.6** | **(0.1)** |
| ලැයිස්තුගත කොටස් | | 73,086,911,313 | 5,018,155,587.35 | - | 15,800,232,387 | 376,767,000 | (8,084,303,431) | 54,597,298,083 | 5.1 | 7.4 | (2.3) |
| ලැයිස්තුගත නොවන කොටස් | | 4,480,625,000 | - | - | - | - | - | 4,480,625,000 | 0.4 | 0.5 | (0.0) |
| උකස් සුරැකුම්පත් | | 500,000,000 | - | - | - | - | - | 500,000,000 | 0.0 | 0.1 | (0.0) |
| භාරකාර සහතිකපත් | | 2,585,246,504 | 1,270,000,000 | 1,972,785,725 | - | - | 282,462,262 | 2,164,923,041 | 0.2 | 0.3 | (0.1) |
| **දිගුකාලීන ආයෝජන එකතුව** | | **981,337,087,512** | **270,096,533,252** | **176,637,235,725** | **19,202,864,444** | **3,247,405,644** | **11,690,765,700** | **1,070,531,691,939** | **100.0** | **100.0** | **(0.0)** |
| **(ii)** කෙටිකාලීන ආයෝජනයන්හි වෙනස්වීම් | | | | | | | | | | | |
| ආයෝජන වර්ගය | | ආරම්භක ශේෂය | ආයෝජන | කල්පිරීම් | විකුණුම් | මාරුකිරීම් | වෙළෙඳපොළ මිලට අගයකිරීම් ලාභ/පාඩු | අවසාන ශේෂය | 2012 | 2011 | වෙනස්වීම් % |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | | | | | | | | - |
| අනුපාතිකය | | | | | | | | | | | - |
| 6.50 | | 540,753,000 | - | - | - | (499,155,600) | (41,597,400) | - | - | 8.2 | (8.2) |
| 11.75 | | 2,600,001,990 | - | - | - | (2,371,483,044) | (228,518,946) | - | - | 39.2 | (39.2) |
| **උප එකතුව** | | **3,140,754,990** | **-** | **-** | **-** | **(2,870,638,644)** | **(270,116,346)** | **-** | **-** | **47.4** | **(47.4)** |
| භාණ්ඩාගාර බිල්පත් | | - | 40,458,186,485 | 9,879,200,000 | - | - | 1,178,685,268 | 31,757,671,753 | 90.7 | - | 90.7 |
| ලැයිස්තුගත කොටස් | | 686,417,096 | 54,108,598 | - | 43,214,673 | (118,831,951) | (430,875,598) | 147,603,472 | 0.4 | 10.4 | (9.9) |
| ප්‍රති විකුණුම් ගිවිසුම් | | 2,802,100,000 | 683,598,574,000 | 683,293,774,000 | - | - | - | 3,106,900,000 | 8.9 | 42.3 | (33.4) |
| **කෙටිකාලීන ආයෝජන එකතුව** | | **6,629,272,086** | **724,110,869,083** | **693,172,974,000** | **43,214,673** | **(2,989,470,595)** | **477,693,324** | **35,012,175,225** | **100.0** | **100.0** | **0.0** |
| | | | | | | | | | | | |
| **මුළු ආයෝජන එකතුව** | | **987,966,359,598** | **994,207,402,334** | **869,810,209,725** | **19,246,079,117** | **(257,935,049)** | **12,168,459,024** | **1,105,543,867,164** | | | |

# සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

### 24. 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය

(රු.) මිලි.

| ආයෝජන කාණ්ඩය | අනුපාතිකය | කල්පිරීම | | | | | | | | | | | | | නිශ්චිත නොවූ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2026 | 2032 | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 5.35 | | | | | | | | | | | | 58,209 | | | 58,209 |
| | 5.65 | | | | | | | 3,000 | | | | | | | | 3,000 |
| | 5.80 | | | | | 44,164 | | | | | | | | | | 44,164 |
| | 6.20 | | | 11,929 | | | | | 64,320 | | | | | | | 76,249 |
| | 6.40 | | | | 34,974 | | | | | | | | | | | 34,974 |
| | 6.50 | | | 19,081 | | | | | | | | | | | | 19,081 |
| | 6.60 | | 62,447 | | | | | | | | | | | | | 62,447 |
| | 6.75 | 4,746 | | | | | | | | | | | | | | 4,746 |
| | 7.00 | | 21,074 | | | | | | | | | 55,309 | | | | 76,383 |
| | 7.25 | | | | 35,735 | | | | | | | | | | | 35,735 |
| | 7.50 | 64,920 | | | | | 43,492 | | | | | | | | | 108,412 |
| | 8.00 | | | | 16,489 | 32,281 | 2,000 | 12,257 | 9,225 | | 47,419 | | | 60,099 | | 179,770 |
| | 8.50 | 56,716 | | 2,000 | | | 84,740 | 75,078 | | | | | | | | 218,534 |
| | 9.00 | | 2,000 | | | | | | | | | | | | | 2,000 |
| | 10.50 | 34,525 | | | | | | | | | | | | | | 34,525 |
| | 11.00 | | | 44,444 | | | | | | | | | | | | 44,444 |
| | 11.25 | | 11,395 | | | | | | | | | | | | | 11,395 |
| | 11.50 | 27,752 | | | | | | | | | | | | | | 27,752 |
| | 11.75 | | 31,407 | 30,120 | | | | | | | | | | | | 61,526 |
| | 13.50 | 14,014 | | | | | | | | | | | | | | 14,014 |
| **උප එකතුව** | | **202,673** | **128,323** | **107,574** | **87,198** | **76,445** | **130,232** | **90,335** | **73,545** | **-** | **47,419** | **55,309** | **58,209** | **60,099** | **-** | **1,117,360** |
| ශ්‍රී ලංකා රුපියල් ණය | | | | | | | | | | | | | | | | |
| | 9.50 | | | 19,600 | | | | | | | | | | | | 19,600 |
| | 11.00 | | | 3,500 | | | | | | | | | | | | 3,500 |
| **උප එකතුව** | | **-** | **-** | **23,100** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | | **23,100** |

## සේවක අර්ථසාධක අරමුදල
## 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රකාශයට අදාළ සටහන්

24. 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය

| ආයෝජන කාණ්ඩය | අනුපාතිකය | කල්පිරීම් | | | | | | | | | | | | | නිශ්චිත නොවූ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2026 | 2032 | | |
| එච්.ඩී.එෆ්.සී. ණයකර | | | | | | | | | 195 | | | | | | | 195 |
| එස්.එම්.අයි.බී. බැංකු ණයකර | | | | | | | | | 195 | | | | | | | 195 |
| සම්පත් බැංකු ණයකර | | | | | | 14 | | | | | | | | | | 14 |
| ලංකා බැංකු ණයකර | | 300 | | | | | | | | | | | | | | 300 |
| ලංකා බැංකු ණයකර | | | | 200 | | | | | | | | | | | | 200 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම් ණයකර | | | | 500 | | | | | | | | | | | | 500 |
| නේෂන් ට්‍රස්ට් බැංකු ණයකර | | | | | 1,000 | | | | | | | | | | | 1,000 |
| ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකු ණයකර | | | | | 500 | | | | | | | | | | | 500 |
| හැටන් නැෂනල් බැංකු ණයකර | | | | | | | | | | 2,000 | | | | | | 2,000 |
| එම්.බී.එස්.එල්. ණයකර | | | 163 | | | | | | | | | | | | | 163 |
| පෑන් ඒෂියා බැංකු ණයකර | | | | | | 250 | | | | | | | | | | 250 |
| | | | | | | | | | | | | | | | | |
| **උප එකතුව** | | **300** | **163** | **870** | **1,500** | **250** | **-** | **-** | **220** | **2,000** | **-** | **-** | **-** | **-** | | **5,317** |
| භාණ්ඩාගාර බිල්පත් | | 33,410 | | | | | | | | | | | | | | 33,410 |
| උකස් සුරැකුම්පත් ආයෝජන | | | | | | | | | 500 | | | | | | | 500 |
| භාරකාර සහතිකපත් | | 1,370 | 763 | 360 | | | | | | | | | | | | 2,493 |
| ලැයිස්තුගත සාමාන්‍ය කොටස් | | | | | | | | | | | | | | | 54,745 | 54,745 |
| ලැයිස්තුගත නොවන සාමාන්‍ය කොටස් | | | | | | | | | | | | | | | 4,481 | 4,481 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් | | 3,107 | | | | | | | | | | | | | | 3,107 |
| **මුළු එකතුව** | | **240,860** | **129,249** | **131,904** | **88,698** | **76,695** | **130,232** | **90,335** | **74,265** | **2,000** | **47,419** | **55,309** | **58,209** | **60,099** | **59,226** | **1,244,513** |

# සේවක අර්ථසාධක අරමුදල
# 2012 දෙසැම්බර් 31 දිනට
# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ මූල්‍ය තත්ත්වයෙහි සැසඳුම් ප්‍රකාශය

## ශේෂ පත්‍රයේ වත්කම්

(රු.)

| පූර්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLAS) අනුව මුළු ශුද්ධ වත්කම් එකතු කළා : | | | 1,020,071,750,739 |
|---|---|---|---|
| | SLAS (A) අනුව | SLFRS (B) අනුව | වෙනස (B-A) |
| ආයෝජන කළඹ | | | |
| රුපියල් ණය | 23,100,000,000 | 23,100,000,000 | - |
| භාණ්ඩාගාර බැඳුම්කර | 874,572,559,685 | 874,572,559,685 | - |
| භාණ්ඩාගාර බිල්පත් | - | - | - |
| ප්‍රති විකුණුම් | 2,802,100,000 | 2,802,100,000 | - |
| සාංගමික ණයකර | 6,152,500,000 | 6,152,500,000 | - |
| උකස් සුරැකුම් ආයෝජන | 500,000,000 | 500,000,000 | - |
| භාරකාර සහතිකපත් | 2,585,246,504 | 2,585,246,504 | - |
| ලැයිස්තුගත සමාගම් කොටස් | 73,773,328,408 | 71,405,897,425 | (2,367,430,983) |
| ලැයිස්තුගත නොවන සමාගම් කොටස් | 4,480,625,000 | 4,480,625,000 | - |
| **එකතුව** | **987,966,359,597** | **985,598,928,614** | **(2,367,430,983)** |
| **නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) අනුව මුළු ශුද්ධ වත්කම්** | | | **1,017,704,319,756** |

## ශේෂ පත්‍රයේ වගකීම්

| පූර්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLAS) අනුව අරමුදලේ ශුද්ධ වටිනාකම සහ ජංගම නොවන වගකීම් එකතු කළා : | | | **1,020,071,750,739** |
|---|---|---|---|
| | SLAS (A) අනුව | SLFRS (B) අනුව | වෙනස (B-A) |
| සංචිත | | | |
| ගොඩනැගිලි සංචිත අරමුදල | 3,157,000,000 | 3,157,000,000 | - |
| තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල | 350,000,000 | 350,000,000 | - |
| ලාභ සමකිරීමේ සංචිත අරමුදල | 23,500,000,000 | 23,500,000,000 | - |
| පොදු සංචිත අරමුදල | 6,650,000,000 | 6,650,000,000 | - |
| ආයෝජන ප්‍රත්‍යාගණන සංචිතය | - | (2,367,430,983) | (2,367,430,983) |
| **එකතුව** | **33,657,000,000** | **31,289,569,017** | **(2,367,430,983)** |
| **නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) අනුව අරමුදලේ ශුද්ධ වටිනාකම සහ ජංගම නොවන වටිනාකම** | | | **1,017,704,319,756** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එල්එස්/ඩී/ඊපීඑෆ්/එෆ්ඒ/12  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2014 ජුනි ?? දින

ගරු අමාත්‍යතුමා,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

**සේවක අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවක අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  oaggov@sltnet.lk  www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 වන වගන්තිය ප්‍රකාරව ස්ථාවර වත්කම් වර්ෂ 3 කට හෝ වර්ෂ 5 කට වරක්වත් ප්‍රත්‍යාගණනයක් කළ යුතු වුවත්, අරමුදලේ සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී ඇති නමුත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු. 76,656,104 ක් වූ ස්ථාවර වත්කම් එසේ ප්‍රත්‍යාගණනයකට භාජනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි 58 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය වත්කම් ආයෝජන ලෙස වර්ග කර ගිණුම් ගත කර ඇති සමාගම් වල ආයෝජනයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දී හානිකරණ පරික්ෂාවක් සිදුකර ඇති බව දන්වා තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

කෙසේ වුවද 2013 වර්ෂය අවසානයට හානිකරණ පරික්ෂාවක් සිදු කර තිබුණ අතර ඒ සඳහා මිනුම් දඬු ලෙස යොදාගෙන තිබුණේ කොටස් වෙළඳපොළ මිල, පිරිවැයෙන් සියයට 20කට වඩා අඩුවීම හෝ වර්ෂ 20 කට වැඩියෙන් එසේ සිදුවීමයි. මේ ප්‍රතිපත්ති මත සිදුකරන ලද පරික්ෂාවේදී සමාගම් 2 ක ආයෝජනය කරන ලද කොටස්වල 2013 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ වටිනාකම පිළිවෙලින් රු.189,944,490 හා රු.6,794,537 ක් වූ අතර එහි පිරිවැය රු.1,005,584,993ක් හා රු.43,925,523 සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.815,640,503 කින් හා රු.37,130,986 කින් වටිනාකම පිරිහී තිබුණි. ඒ අනුව මෙම ආයෝජන දෙකෙහි වෙළෙඳපොළ වටිනාකම පිරිහීම පිරිවැයෙන් සියයට 18.9 ක් හා සියයට 15.5 ක් වී තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී පුනරාවර්තන වියදම් ලෙස වැයකරන ලද රු.56,916,275 ක, ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා පරිගණක උපාංග මිලදී ගැනීම යටතේ ගිණුම්ගත කර තිබුණු අතර, මේ තුළ වාහන අලුත්වැඩියා හා යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා වියදම්, උපදේශන ගාස්තු, ඒබීඑච් පරිගණක ගත කිරීම, පුහුණු වැඩ සටහන් හා පුවත්පත් දැන්වීම් ගාස්තු, ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සහ රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවට කරන ලද ගෙවීම් අන්තර්ගත වී තිබුණි.

**2.2.3 නිරවුල් නොකළ ශේෂ**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාලව නඩු පැවරීමෙන් හා හිඟ වාරික ලෙස අයකර ගන්නා ලද 2012 දෙසැම්බර් 31 දිනට එක් එක් සාමාජිකයාගේ ගිණුම්වලට බැර නොකළ ශේෂය රු.5,409,262,080 ක් විය.

***නිසියාකාරව සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවන සේවා යෝජකයන් සඳහා නීති මගින් කටයුතු කර අධිකරණ තීන්දු මත වාරික වශයෙන් අයකර ගත් මුදල් හා කම්කරු නිලධාරීන් මැදිහත් වී අයකර ගත් මුදල් වලින් ද සමන්විත මෙම ශේෂය, වාරික සම්පූර්ණයෙන්ම ගෙවා අවසන්වීමේ අනුපිළිවෙල මත නිරවුල් කිරීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ආ) සේවක අර්ථසාධක අරමුදල් ලෙස අර්ථලාභීන්ගේ ගිණුම්වලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට රඳවාගෙන ඇති ශේෂය රු. 341,677,762 ක් විය.

(ඇ) අරමුදල ආරම්භයේ සිට වර්ධනය වෙමින් පැවති 2012 දෙසැම්බර් 31 දින වන විට රු.1,425,783,355 ක් වූ අඩුවැඩි දායක මුදල් ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

සේවක අර්ථසාධක අරමුදලේ කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රු.1,138,938,751 ක් වූ ස්ථාවර වත්කම්වල පැවැත්ම, වටිනාකම හා නිවැරදිතාවය තහවුරු කිරීමට අදාල වන ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ශුද්ධ ප්‍රතිඵලය ආදායම් බදුවලට පසු රු.111,828,720,197 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය රු.107,202,066,499 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තයෙහි රු.4,626,653,698 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ආයෝජන ආදායම් රු.5,537,659,176 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව අයවිය යුතු දායක මුදල් හා අධිභාර පහත සඳහන් පරිදි අයවී නොතිබුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත සමුදාය පද්ධතියට අනුව අරමුදලේ ලියාපදිංචි වී ඇති ආයතන 396 කින් 2009 - 2012 කාල පරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු රු.101,140,260 ක අධිභාර 2014 අප්‍රේල් 30 දින වනවිට ද අයකර ගෙන නොතිබුණි.

- නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන 148 කට අදාලව රු.175,449,814 ක හිඟහිටි දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට 2014 අප්‍රේල් 30 දින වනවිට ද කටයුතු කර නොතිබුණි.

- 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව පළාත් පාලන ආයතන 169 කින් රු. 14,379,993 ක්වූ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රමාද අධිභාර අයකර ගැනීම සඳහා නියමිත පරිදි දැන්වීම් යවා නොතිබුණි.

- ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන 297 කින් 2009 වර්ෂයේ සිට 2013 ජනවාරි දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.145,268,636 ක්වූ සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක මුදල් හා අධිභාර අයකරගෙන නොතිබුණි.

- අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයීය බල ප්‍රදේශයට අයත් ආයතන 205 කින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.184,570,423 ක්වූ සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක මුදල් හා අධිභාර අයකරගෙන නොතිබුණි.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල 22 ක සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු. 498,374,779 ක් වූ දායක මුදල් හා අධිභාර මෙම වාර්තාවේ දින දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීම සඳහා දිවයින පුරා නඩු 10,641 පවරා තිබුණු අතර, එම නඩු හා සම්බන්ධිත මුදල රු.8,244,403,544 ක් වී තිබුණි. මෙම නඩු වලින් කොපමණ මුදලක් අයවීද, නඩු කොපමණ සංඛ්‍යාවක් නිරවුල්වීද, යන තොරතුරු සේවක අර්ථසාධක අරමුදලේ යාවත්කාලීන වී නොතිබුණි.

(ඇ) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු සමාගම් 22 කින් 2007 ජනවාරි 01 දින සිට 2009 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට අයකර ගතයුතු එහෙත් අරමුදලට නොගෙවා ඇති හිඟ දායක මුදල රු.30,226,443 ක් හා ඊට අදාල අධිභාර මුදල රු.13,786,734 ක් විය. මීට අමතරව මෙම වතු සමාගම් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂයේ අවසානය දක්වාම සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි.

***2010 වර්ෂයේ සිට 2013 ජූනි 30 දිනෙන් අවසන් කාලයේදී රාජ්‍ය වතු සමාගම් 31 කින් අයවිය යුතු රු.208,378,193 ක් අයකර ගැනීමට නඩු පැවරීමට හා ඉදිරි අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දන්වා තිබුණි.***

(ඇ) මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ජනතා වතු සමාගම් 14 කින් 2003 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට අයවිය යුතු හිඟහිට ඇති දායක මුදල හා අධිභාර මුදලෙහි මුළු වටිනාකම රු.42,066,439 ක් විය. මෙම වතු සමාගම් 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වාම සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි.
***2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වතු සමාගම් 15 කින් අයවිය යුතු රු. 171,734,992 ක් අයකර ගැනීමට අවස්ථා 26 කදී නඩු පවරා ඇති බවද තවත් අවස්ථා 108 කදී මුදල් අයකර ගැනීමට නඩු පැවරීමට කටයුතු කෙරෙමින් පවතින බව ද කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දන්වා තිබුණි.***

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ ගිණුමේ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ ශේෂ පිළිවෙලින් රු.125,325,963 ක් හා රු.34,138,653 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලින් මිලදීගත් රු.2,093,000 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ කම්කරු දෙපාර්තමේන්තුවේ තොග පොත් වල සටහන් කර තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත අයකර ගත යුතු රු.6,459,092 ක උපයන විට ගෙවීම් බදු අදාල නිලධාරීන්ගෙන් අය නොකර සේවක අර්ථ සාධක අරමුදලින් ගෙවා තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

-----------------

**4.1.1 මෙහෙයුම් කාර්යසාධනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය අවසානයේ දී කාර්යසාධන තත්ත්වය පහත පරිදි විය.

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාරිත්වයට අදාල වූ සංඛ්‍යා | එහි ප්‍රතිශතයන් |
|---|---|---|---|
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවානියුක්තිය | 3,832,840 | 2,250,000 | 58.70 |
| සේවායෝජකයින් | 227,612 | 68,771 | 30.21 |
| අරමුදලේ සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 14.25 | 2.25 | 15.79 |

(ප්‍රභවය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2012)

වර්තමානයේ දී දායක මුදල් එවනු නොලබන අරමුදලේ සාමාජික ගිණුම් (අක්‍රීය ගිණුම්) 12,000,000 කට 2012 ජනවාරි 01 දින වනවිට බැරවී ඇති මුදල රු.497,306,421,269 ක් හා එම ගිණුම් හිමියන් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා බැර වූ පොලී මුදල රු.57,190,238,790 ක් ද විය.

(ආ) සාමාජිකයන් වෙත ගෙවන ප්‍රතිලාභ

---

2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සාමාජිකයින් වෙත ගෙවනු ලැබූ ප්‍රතිලාභ ප්‍රතිශතයන් පිළිබඳ විස්තර පහත වගුවෙන් දැක්වේ.

| වර්ෂය | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|
| ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය | 11.5 | 11.5 | 12.5 | 13.75 | 13.2 | 11.2 |

2011 වර්ෂයේදී සියයට 11.5 බැගින් සාමාජික ප්‍රතිලාභ ගෙවීමට රු.101,284,166,436 ක් යොදා ගැනීමත්, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිශතයෙන්ම සාමාජික ප්‍රතිලාභ ගෙවීම සඳහා රු. 115,771,416,227 ක මුදලක් අවශ්‍ය වී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩිවීම රු.4,626,653,698ක් පමණක් වීම නිසා, පෙර වර්ෂයේ දී ගෙවන ලද සියයට 11.5ක් වූ ලාභාංශ ප්‍රමාණය ගෙවීම සඳහා අවශ්‍ය වූ අතිරේක මුදල වන රු.5,700,000,000ක් ලාභාංශ සමකිරීමේ සංචිතයෙන් ආදායමට බැර කර තිබුණි.

(ඇ) 2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන ) පනතින්, ප්‍රධාන පනතේ 23 වගන්තියට ඉක්බිතිව එකතු කරන ලද 23 (අ) වගන්තියට අනුව ප්‍රධාන පනතේ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන සාමාජිකයින්ට තමාගේ සාමාජික මුදල් ලෙස බැරට තැන්පත්ව ඇති මුදලින් සියයට 30 ක් නිවාස හා වෛද්‍යාධාර ප්‍රතිලාභ ලෙස ලබාදීමට කටයුතු යොදන ලද නමුදු එය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

***2012 අංක 02 දරන පනතට අදාල රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර එය අනුමත වූ පසු අදාල ප්‍රතිලාභ ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.***

(ඈ) 1998 වර්ෂයේ සිට රාජ්‍ය බැංකු හා රජයට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතන කිහිපයක් මගින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. එම ණය ක්‍රමය මගින් 2000 - 2012 වර්ෂයට අදාල කාල පරිච්ඡේදය තුළදී ණය සහතික පත් 192,232 ක් මගින් රු. මිලියන 40,871 ක ණය ප්‍රමාණයක් අනුමත කර තිබුණු අතර, අදාල කාල සීමාව තුළදී මෙම ණය මුදල්වලින් ණයලාභීන් නොගෙවා පැහැර හැරි ප්‍රමාණය රු. මිලියන 14,559 ක් විය.

### 4.1.2 ආයෝජන හා ආයෝජන ආදායම්

2012 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳපොළේ සමාගම් 72 ක දිගුකාලීනව හා කෙටිකාලීනව කර තිබුණු රු. 63,102,761,384 ක් වූ සමස්ත ආයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 16 දින වන විට සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳපොලේ දී කර තිබුණු සමස්ත දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනය රු. 70,520,488,212 ක් දක්වා වැඩිවී තිබුණි. එදිනට එම ආයෝජනයෙන් සමාගම් 64 ක කර තිබුණු රු.50,700,023,800 ක ආයෝජනයේ කොටස් මිල කොටස් වෙළෙඳපොලේ දී රු.14,410,838,379 කින් පහල වැටී තිබුණු අතර, සමාගම් 22 ක කොටස්වල ආයෝජනය කර තිබුණු රු.17,821,779,895 ක කොටස්වල වටිනාකම කොටස් වෙළෙඳපොලේ දී රු. 4,015,715,500 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වුවද 2014 ජුනි 10 දින වන විට අරමුදලේ සමස්ත කොටස් වෙළඳපොළ ආයෝජනය සමාගම් 82 ක රු.74,840,763,800 ක් වී තිබුණු අතර, මෙදිනට සමාගම් 48 ක ආයෝජනයේ කොටස් වෙළඳපොළ අගය අඩුවීම රු.9,651,570,175 ක් හා සමාගම් 34 ක කොටස් වෙළඳපොළ අගය වැඩිවීම රු.8,996,856,733 ක් වී තිබුණි.

(ආ) 2010 ජුලි මාසයේදී ගුවන් සමාගමක ඒකක 1,863,676 ක කරන ලද රු. 500,000,000 ක ආයෝජනය සඳහා ද, 2011 පෙබරවාරි 23 දින සිට 2011 නොවැම්බර් 01 දින දක්වා කාලසීමාවේදී මූල්‍ය සමාගමක කොටස් 5,091,200 ක් මිලදී ගැනීමට කරන ලද රු.205,489,613 ක ආයෝජනය සඳහා ද, 2010 මැයි 31 දින වන විට හෝටල් සමාගමක කොටස් 23,712,200 ක් මිලදී ගැනීමට කරන ලද රු.810,321,611 ක ආයෝජනය සඳහාද, අදාල අයෝජනයන් කරන ලද අවස්ථාවේ සිටම කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. ***දිගුකාලීනව වැඩි ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් කර ඇති මෙම ආයෝජන දැනට අලාභදායී තත්ත්වයේ සිට ලාභදායී තත්ත්වයට පරිවර්තනයවීමේ අවධියක පසුවන බැවින් එවන් ආයෝජන ඉදිරියේ දී වඩා ලාභදායී තත්ත්වයකට පත්වන බව අපේක්ෂා කළ හැක යන්න ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ඇ) රු.680,232,429 කට කොටස් 20,942,989 ක් මිලදී ගෙන තිබුණු සන්නිවේදන සමාගමක කොටස් මිල, කොටස් වෙළෙඳපොලේදී ඉහළ ගොස් තිබුණු නමුදු එම කොටස් 2009 වර්ෂයේ සිටම කොටස් වෙළෙඳපොලේ ගනුදෙනු සඳහා යොදාගෙන නොතිබීම නිසා එම කොටස් අලෙවියෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. මෙම ආයෝජනයට 2008 හා 2009 වර්ෂවලදී සියයට 3.39 ක් බැගින් ද, 2010 වර්ෂයේදී සියයට 0.81 ක්, 2011 වර්ෂයේදී සියයට 1.67 ක් හා 2012 වර්ෂයේදී සියයට 2.62 ක් වශයෙන් ද

ලාභාංශ ආදායම් ලැබී තිබුණු නමුදු , එම ආදායම කරන ලද ආයෝජනයට සාපේක්ෂව ඉතා පහල අගයක් ගෙන තිබුණි.

***ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයක් සමග සන්නිවේදන ක්ෂේත්‍රය කවදුරටත් පුලුල් වන බැවින් අනාගතයේ දී මෙම සමාගමින් අරමුදලට ලැබෙන ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ ඉහල යන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ඈ) සේවක අර්ථසාධක අරමුදල විසින් 2008, 2009, 2010, 2011 හා 2012 වර්ෂ අවසානයේ දී පිළිවෙලින් රු.3,890,902,522, රු.6,877,822,908, රු.39,133,587,926, රු.73,948,947,927 හා රු.63,102,761,384 ක් කොටස් වෙළෙඳපොලේ ආයෝජනය කර තිබුණි. එම ආයෝජනය සඳහා ලැබී තිබුණු ආදායම 2008, 2009, 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා පිළිවෙලින් සියයට 8.93 ක්ද, සියයට 22.99 ක්ද, සියයට 5.08 ක්ද, සියයට 3.58 ක්ද හා සියයට 3.77 ක්ද වී තිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට රු. 8,793,951,889 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 14 කින් අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. මෙම සමාගම් 14 න් එදිනට සමාගම් 6 ක පමණක් කර තිබුණු ආයෝජනය රු. 7,358,547,720 ක් විය.

***මෙම සමාගම් 14 කට අදාල මුලු මුදලම දිගුකාලීනව ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් ආයෝජනය කර ඇති නිසා කෙටිකාලීනව විශාල ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණක් නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ඊ) සේවක අර්ථ සාධක අරමුදල රු. 2,412,402,036 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 5 ක් 2012 / 2013 ගිණුම් වර්ෂයේ දී අලාභ ලබා තිබුණි. ඉහත සඳහන් සමාගම් 05 න් සමාගම් 04 ක රු.2,206,912,423 ක් ආයෝජනය කර තිබූ අතර 2011 / 2012 ගිණුම් වර්ෂයේදී ද ඒ සමාගම් අලාභ ලබා තිබුණු අතර අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(උ) අරමුදල එක්තරා ගෑස් සමාගමක ඡන්ද බලය හිමි කොටස්වලින් සියයට 17.28 ක් හා ඡන්ද බලය හිමි නොවන කොටස් අයිතියෙන් සියයට 34.70 ක් ද වශයෙන් පිළිවෙලින් රු.2,684,119,949 ක් හා රු.706,343,975 ක් ආයෝජනය කර තිබුණි. 2011 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2.5 (ඇ) වගන්තිය ප්‍රකාරව ඕනෑම සමාගමක ආයෝජනයෙන් බලාපොරොත්තු වන්නේ ප්‍රතිලාභ වර්ධනය කිරීම බව දන්වා තිබුණ ද, 2011 හා 2012 වර්ෂයන්හිදී මෙම ආයෝජනයට ලැබී තිබුණු ආදායම සියයට 3.36 ක් විය. 2013 මාර්තු 31 දින වනවිට අරමුදල මෙම සමාගමේ ඡන්ද බලය හිමි කොටස් අයිතියෙන් දෙවන තැනට හා ඡන්ද බලය අහිමි කොටස් අයිතියෙන් පළමුවැනි තැනට ද පත්වී තිබුණි. 2013 දෙසැම්බර් 16 දිනට කොටස් වෙළෙඳපොලේ මෙම සමාගමේ ඡන්ද බලය හිමි

කොටස්වල වටිනාකම රු.1,063,963,496 කින්ද, ඡන්ද බලය අහිමි කොටස් වල වටිනාකම රු.328,152,141 කින්ද පහළ වැටී තිබුණි.

*දිගුකාලීන ප්‍රතිලාභ බලාපොරොත්තුවෙන් කරනු ලැබූ මෙම ලාභ උපයන සමාගමෙ ආයෝජනය, කොටස් වෙළෙඳපොළේ ඉහල යෑමක් සමග ආයෝජනයේ වටිනාකමද යථාකාලයේදී ඉහල යනු ඇතැයි අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.*

(ඌ) වර්ෂයකට අඩු කාලයක් තුළදී කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා යොදා ගැනීමට මිලදීගෙන තිබුණු වෙළෙඳ කළඹ තුළ අන්තර්ගත සමාගම් 37 ක පිරිවැය රු.773,665,828 ක් වූ කොටස් මිල දිගින් දිගටම කොටස් වෙළෙඳපොලේ පහළ වැටීම නිසා වෙළෙඳ කළඹ තුළින් අපේක්ෂිත පරමාර්ථ ඉටුකර ගත නොහැකි වීමෙන් 2012 දෙසැම්බර් 06 දින සමාගම 25 ක පිරිවැය රු. 585,216,158 ක්වූ කොටස් 28,915,417 ක් ආයෝජන කළඹ වෙත මාරු කර තිබුණි. මෙදිනට මෙම සමාගම් 37 හිම කොටස් වෙළෙඳපොලේ ශුද්ධ අගය අඩුවීම රු.240,122,387 ක් හෙවත් පිරිවැයට සියයට 31 ක් විය.

(එ) හෝටල් ක්ෂේත්‍රයේ කරන ලද ආයෝජනය 2010, 2011 සහ 2012 වර්ෂ අවසානයේදී පිළිවෙලින් රු. 3,882,771,148 ක්, රු. 7,219,711,549 සහ රු. 7,746,506,674 ක් ලෙස වැඩි වී තිබුණු නමුදු, එම වර්ෂවලදී ලැබී තිබුණු ආදායම රු.56,511,978 ක්, රු.146,632,975 ක් හා රු.146,122,343 ක් විය. මෙම ආයෝජනයට ලැබී තිබුණු ආදායම 2010 වර්ෂයේ දී සියයට 1.46 ක්, 2011 වර්ෂයේ දී සියයට 2.03 ක් සහ 2012 වර්ෂයේ දී සියයට 1.89 ක් විය.

***ශ්‍රී ලංකාවේ සංචාරකයින් මිලියන 2.5 ක් ගෙන්වා ගැනීමට අපේක්ෂිත මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය දිගුකාලීනව ඉතා ලාභදායී වන බවද මෙම ක්ෂේත්‍රයේ ආපසු ගෙවන කාලසීමාව දීර්ඝ වන බැවින් ප්‍රතිලාභ ද දීර්ඝකාලීන වන බවද ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ඒ) 2012 වර්ෂයේදී අරමුදල රු.5,018,155,587 ක් වැයකර සමාගම් 47 ක කොටස් මිලදීගෙන තිබුණි. එම ආයෝජනයේ අලාභ ලැබූ, ආදායම් නොලැබුණු හා කොටස් මිල පහළ වැටී තිබුණු සමාගම් 3 ක රු.141,140,617 ක් ද, ආදායම් නොලැබුණු හා කොටස් මිල පහළ වැටී තිබුණු සමාගම් 4 ක රු.588,329,845 ක් ද, කොටස් මිල පහළ වැටී තිබුණු සමාගම් 15 ක රු.2,719,273,541 ක් ද, වශයෙන් කරන ලද ආයෝජනයක්ද අන්තර්ගත වී තිබුණි.

***වෙළෙඳපොලේ මිල පහළ යනවිට ආයෝජනය වැඩිකර බර තබන ලද සාමාන්‍ය මිල අඩුකර ගැනීම සාමාන්‍ය උපක්‍රමයක් බව ද කොටස්වල ආයෝජනය කිරීමේදී මූලික කරුණු සළකා බලා ආයෝජනය කරන අතර මිල වෙනස්වීමේ පුරෝකථනයක් කරනු නොලබන බව ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.***

(ඔ) 2010, 2011 සහ 2012 වර්ෂවලදී කොටස් වෙළෙඳපොලේ ගනුදෙනුවලදී ප්‍රාග්ධන ලාභ ලෙස අරමුදලට පිළිවෙලින් රු.714,995,491 ක්, රු.1,020,279,860 ක් සහ රු.102,895,132 ක් ලැබී තිබුණු අතර, 2011 වර්ෂය හා සසඳා බලන විට 2012 වර්ෂයේදී මෙම ආදායමේ අඩුවීම සියයට 89.92 ක් විය. 2012 වර්ෂයේදී කොටස් වෙළෙඳ පොලේ කොටස් මිලෙහි සීඝ්‍ර පසුබෑමකට ලක්වීම මෙයට හේතු වී තිබුණි.

## 4.2 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත්කිරීම හා නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂයේ දී රු. 2,391,800 ක් ගෙවා මිලදීගත් කියෝස් යන්ත්‍ර 5 ක් 2013 ජූනි 30 දින වන විටත් අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) ඉහත සඳහන් නව හැඳුනුම්පත් නිකුත් කිරීමේ පරිගණක කටයුතු සඳහා මෙමරි චිප් 15,000 ක් රු.10,965,000 කට මිලදීගෙන තිබුණත් 2013 ජූනි 30 දින වන විටත් මෙම මෙමරි චිප් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දින වන විට පැවති පහත සඳහන් පුරප්පාඩු 88 ක් පිරවීමට 2014 මාර්තු මාසය වන විට ද කටයුතු කර නොතිබුණි.

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 30 | 15 | 15 |
| මාණ්ඩලික නොවන ශ්‍රේණිය | 188 | 124 | 64 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 42 | 33 | 09 |
| එකතුව | 260 | 172 | 88 |

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 අභ්‍යන්තර විගණනය

---

අරමුදලේ මෙහෙයුම් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණනය කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර, සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා අරමුදලේ සීමිත කොටසක් පමණක් එම අභ්‍යන්තර විගණනයෙන් ආවරණය වී තිබුණි.

අරමුදලේ මූල්‍යමය පාලනයට අදාල අභ්‍යන්තර විගණනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික විගණන සමාගමකට පවරා දී තිබුණු අතර, එම විගණනයෙන් අරමුදලේ සමහර වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වී නොතිබුණි. 2012 වර්ෂයේ දී මෙම පෞද්ගලික විගණන සමාගමට ගෙවා තිබුණු විගණන ගාස්තුව රු. 6,494,880 කට ආසන්න මුදලක් විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

---

2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ නොවිසඳුණු විගණන ඡේද පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්තරා සේවායෝජක ආයතනයක් විසින් සිය සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල වෙත එවන ලද රු. 3,608,667 ක දායක මුදල් ව්‍යාජ සී වාර්තා මගින් තම ඥාතීන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැරකර ගත් කම්කරු නිලධාරියකුගෙන් නීති මගින් අදාල මුදල් අයකර ගත්තද, ඔහුට එරෙහිව පැවැත්වෙන විනයානුකූල ක්‍රියාමාර්ග 2014 අප්‍රේල් 30 දින වනවිටත් නිම කර නොතිබුණි. ( 2006 - 2.5 (අ) )

(ආ) 1995 - 2003 දක්වා වූ කාල සීමාව තුළ අවසන් වූ නඩු වලින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය මගින් අයකළ රු. 16,803,661 ක දායක මුදල් හා අධිභාර මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2014 අප්‍රේල් 30 දින වන විටත් ලැබී නොතිබුණි. ( 2006 - 2.5 (ආ) )
***නඩු 04 කට අදාල මුදල් අධිකරණයෙන් ගෙන්වා ගෙන සුදුසු පරිදි කටයුතු කර ඇති බව ද ඉතිරි නඩු වලට අදාල මුදල් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව ද කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණු නමුදු මුදල් අයවීම් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.***

(ඇ) 1994 ජනවාරි 31 දින සමාගමක් ලෙස ලියාපදිංචි කළ 1997 අප්‍රේල් 01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කළ මූල්‍ය සමාගමක් 1997 දෙසැම්බර් 03 දින සේවක අර්ථසාධක අරමුදලට දායක වී

තිබුණි. එම සමාගම සේවක දායක මුදල් හා අධිභාර රු. 48,461,705 ක් හිඟව තිබියදී ඈවරකරණයට ලක් වී තිබුණි. 2014 අප්‍රේල් 30 දින වන විටත් මෙම මුදල් අයකරගැනීමට සේවක අර්ථසාධක අරමුදලට නොහැකි වී තිබුණි. ( 2008 - 2.2.6 (ඉ) I)

(ඇ) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළදී සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ දායක හා අධිභාර වශයෙන් නඩු මගින් අයකළ රු.62,571,668 ක් අදාල සාමාජිකයින් පිළිබඳව නිවැරදි තොරතුරු සේවක අර්ථසාධක අරමුදලේ නොමැති වීම නිසා එම මුදල් ඔවුන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. මෙම ගිණුම් නිරවුල් කිරීමට 2014 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. (2010 - 2.2.1 (අ) I)

(ඉ) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතනවලින් දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට නඩු පවරා අධිකරණ ක්‍රියාමාර්ග නොගැනීම, නඩු පවරා තිබුණත් ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම, වාරික පහසුකම් ලබාදුන් ආයතන ඒවා ගෙවීම් පැහැර හැරීම, ආයතන ඈවර කිරීමට පෙර සේවක අර්ථසාධක අරමුදල් අයකර නොගැනීම, සේවක අර්ථසාධක අරමුදලේ අවිනිශ්චිත ගිණුමේ තැන්පත් කර ඇති මුදල් නිවැරදි “සී” වාර්තා ලබා දී නිරවුල් නොකිරීම, 2003 - 2006 කාල සීමාව තුළ ලැබී තිබූ දායක මුදල් හා අධිභාර නියමිත සාමාජික ගිණුම්වලට බැර නොකිරීම සහ ප්‍රමාද අධිභාර අයකර නොගැනීම හා සම්බන්ධ රු.313,452,501 ක් පිළිබඳව නිකුත් කරන ලද විගණන විමසුමට හා එම කරුණු ඇතුළත් කරන ලද 2009 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.2.5 ඡේදයේ (ඇ), 2010 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.2.1 (ඇ) (iii) හා 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 5.4 (ඊ) වගන්තිවලින් දක්වන ලද කරුණුවලට විමර්ශනය කර පිළිතුරු සපයන බව දන්වා තිබුණ ද, ඒ පිළිබඳව 2014 අප්‍රේල් 30 දින දක්වා ද පිළිතුරු සපයා නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති පාලනවල අඩුපාඩු කම්කරු කොමසාරිස් ජනරාල් සහ අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

### 6.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

--------------------------------------------------------------------------

(අ) ආයෝජන

(ආ) මෙහෙයුම් කටයුතු බාහිර පාර්ශවයන්ට පැවරීම

**6.2** කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය

---

(අ) ගිණුම්කරණය

(ආ) විගණන ප්‍රමිති අනුගමනය කිරීම

(ඇ) දායක හා අධිභාර මුදල් අයකර ගැනීම

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) සේවායෝජක ආයතන පරීක්ෂාව

එච්.ඒ.එස්. සමරවීර.

විගණකාධිපති.